# ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය

# වාර්ෂික වාර්තාව

2010

# இலங்கை பௌத்த, பாளி பல்கலைக்கழகம

# ஆண்டறிக்கை

# BUDDHIST AND PALI UNIVERSITY OF SRI LANKA

# ANNUAL REPORT

# ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය

## දැක්ම

ලෝකයේ ප්‍රමුඛ වූ ද, විශිෂ්ටතම වූ ද බෞද්ධ විශ්වවිද්‍යාලය බවට පත්වීම.

මෙහෙවර ප්‍රකාශය

(ධම්මචක්කං පවත්තෙතුං)

බුද්ධ ධර්මය, පාලි භාෂාව හා තදනුබද්ධ විෂයඥානයෙන් ශික්ෂිත, විවිධ කුශලතාවන්ගෙන් පරිපූර්ණ තථාගත ධර්මයෙන් විශද වන ජීවන දර්ශනය ශ්‍රී ලංකාවෙහි මෙන් ම විදේශයන්හි ද ප්‍රවර්ධනය කොට පෝෂණය කිරීමට සමත්, බහුශ්‍රැත ධර්මදූතයන් හා ශාස්ත්‍රධරයන් ලොවට දයාද කිරීම.

# පටුන


| | | පිටු අංකය |
|---|---|---|
| | මහෝපාධ්‍යායයන් වහන්සේගේ පණිවිඩය | 3-5 |
| 01. | සාමාන්‍ය | |
| | හැඳින්වීම........................................................................................ | 06 |
| | අරමුණු.............................................................................................. | 06 |
| | විශ්වවිද්‍යාලයේ නිලධරයෝ.............................................................. | 07 |
| | විශ්වවිද්‍යාලයේ පාලක සභාව.......................................................... | 07-08 |
| | විශ්වවිද්‍යාලයේ සනාතන සභාව....................................................... | 08-09 |
| | පීඨ මණ්ඩල........................................................................................ | 09-10 |
| | විගණන කමිටුව.................................................................................. | 10 |
| | මුදල් කමිටුව...................................................................................... | 11 |
| | ටෙන්ඩර් මණ්ඩලය.............................................................................. | 11 |
| | කමිටු.................................................................................................. | 11-12 |
| 02. | පීඨ...................................................................................................... | 13-16 |
| 03. | පර්යේෂණ හා ප්‍රකාශන (අධ්‍යයන කාර්ය මණ්ඩලය)..................... | 17-22 |
| 04. | විභාග හා අධ්‍යයන කටයුතු................................................................. | 22-25 |
| 05. | ත්‍යාග හා ශිෂ්‍යත්ව............................................................................... | 25 |
| 06. | පුස්තකාලයීය පහසුකම් ........................................................................ | 25-26 |
| 07. | පරිපාලන කටයුතු | |
| | පරිපාලන සහ පරිපාලන කාර්යය මණ්ඩලය................................... | 26-28 |
| | සප්ත වාර්ෂික නිවාඩු.......................................................................... | 28 |
| | අධ්‍යයන නිවාඩු (දේශීය සහ විදේශීය)............................................. | 28 |
| | විදේශගත වීම්......................................................................................... | 29-30 |
| | පත් කිරීම් (අධ්‍යයන, පරිපාලන සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලය) | 30-31 |
| | පීඨ පත්වීම්............................................................................................ | 31 |
| | තාවකාලික/ කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම්........................ | 31 |
| 08. | කාර්ය මණ්ඩල පුහුණු............................................................................ | 32-33 |
| 09. | මිලදී ගැනීම්.......................................................................................... | 33 |
| 10. | ඉදිකිරීම් හා පහසුකම් සැපයීම.......................................................... | 34 |
| 11. | අභ්‍යාසලාභීන් බඳවා ගැනීම............................................................... | 34 |
| 12. | මහපොළ ශිෂ්‍යත්ව............................................................................... | 35 |
| 13. | විශ්වවිද්‍යාලයීය ශිෂ්‍ය සංගම් හා පීඨ ශිෂ්‍ය සංගම් පිහිටුවීම........... | 35 |
| 14. | උපකරණ උපයෝජනය......................................................................... | 36 |
| 15. | මූල්‍ය කටයුතු....................................................................................... | 36-67 |
| 16. | උපලේඛන........................................................................................... | 68-81 |

**ගෞරවාර්හ මහෝපාධ්‍යයයන් වහන්සේගේ පණිවිඩය.**

1995 අංක 37 දරණ ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය පනතෙන් සංශෝධිතව, 1981 අංක 74 දරණ ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය පනත අනුව, 1982 අප්‍රේල් 22 දින ප්‍රතිෂ්ඨාපිත මෙම විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර සිසුන්ගේ අධ්‍යයන පරිශ්‍රය හෝමාගම, පිටිපන උතුර, ගබඩාවත්ත ස්ථානයෙහි ද, පරිපාලන ගොඩනැගිල්ල හෝමාගම, පිටිපන, මොරගහහේන පාර අංක 37 දරණ ස්ථානයෙහි ද, බාහිර විභාග අධ්‍යයන මධ්‍යස්ථානය කොළඹ 07, බෞද්ධාලෝක මාවතේ, අංක 214 දරණ ස්ථානයෙහි හා කොළඹ 03, ගාලු පාර, අංක 544 " මුම්ටාස් මහල් " හි ද ක්‍රියාත්මක වේ.

1997 ජූනි මස 9 වන දින සිසුන් සියයකට පමණ ප්‍රමාණවත් නේවාසිකාගාර ද, කුඩා දේශන කාමර හතක් ද කුඩා පුස්තකාල කාමරයක් සහ කුඩා පරිපාලන ගොඩනැගිල්ලක් සහිත අවම පහසුකම් ඇතිව ආරම්භ කළ අධ්‍යයන ක්‍රියාවලිය අඩුපාඩු සහිතව වුව ද ඉතා දියුණු තත්ත්වයකට පත් කර ඇත. අක්කර පහක පමණ ඉඩම් ප්‍රමාණයක් බස්නාහිර පළාත් සභාවෙන් ලබාගෙන, එහි දෙමහල් දේශණ ශාලා පහක් ද, තෙමහල් ශිෂ්‍ය නේවාසිකාගාර තුනක් ද, භෝජනාගාරයක් ද ඉදිකොට 2005.02.20 දින විවෘත කරන ලදී. අලුතෙන් ලැබුණු ඉඩමෙහි දෙමහල් පීඨ පරිපාලන ගොඩනැගිල්ල, තෙමහල් පුස්තකාල ගොඩනැගිල්ල, ශ්‍රවණාගාරය සහ පොදු පහසුකම් ගොඩනැගිල්ල ද ඉදි කරවා ප්‍රයෝජනයට ගන්නා ලදී.

හයිලෙවල් පාරට නුදුරින් පිටිපන හන්දියට ආසන්න මොරගහහේන පාරේ භූමි භාගයක විශ්වවිද්‍යාලයේ ප්‍රධාන පරිපාලන ගොඩනැගිල්ල ඉදි කරවා උක්ත ගොඩනැගිලි සංකීර්ණය සමඟ 2010 අගෝස්තු මස 12 දින උසස් අධ්‍යාපන ගරු අමාත්‍ය එස්. බී දිසානායක මැතිතුමා, අධ්‍යාපන අමාත්‍ය ගරු බන්දුල ගුණවර්ධන මැතිතුමා ඇතුළු සම්භාවනීය ගිහි පැවිදි ප්‍රභූන්ගේ සහ මහා මහෝපාධ්‍යාය දෛවී භාෂා විශාරද, ෂට්භාෂා පරමේෂ්වර, ශ්‍රී ලංකා අමරපුර මහා සංඝ සභාවේ උත්තරීතර මහානායක, ග්‍රන්ථ විශාරද, රාජකීය පණ්ඩිත ගෞරවාර්හ දවුල්දෙන ඤාණිස්සර මහනායක ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ ද, සහභාගීත්වයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදි ජනරජයේ අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් විවෘත කරන ලදී.

මෙලෙස විශ්වවිද්‍යාලයට අත්‍යවශ්‍යව තිබූ යටිතල පහසුකම් රැසක් දියුණු කිරීම සඳහා කටයුතු කිරීම විශ්වවිද්‍යාලයේ අනාගත සංවර්ධනයට ඉමහත් පිටුවහලක් විය. මේ නිසා වාර්ෂිකව ගිහි පැවිදි සිසුන් 110 දෙනෙකු බඳවා ගැනීමට හැකි වී ඇති බව ද සතුටින් සඳහන් කරමි.

විශ්වවිද්‍යාලයට ඇතුළත් වන ගිහි පැවිදි සියලුම ශිෂ්‍යන්ගේ මානසික ශික්ෂණය ඇති කිරීම සඳහා බෞද්ධ උපදේශන පාඨමාලාවක් ඇති කොට, එමඟින් ප්‍රායෝගික භාවනා වැඩසටහනක් හඳුන්වා දී ඇත. එය සිසුන් සියලු දෙනාගේම ප්‍රසාදය දිනා ගත් ජනප්‍රිය පාඨමාලාවකි. එහි වටිනාකම හා ප්‍රයෝජනය සළකා විශ්වවිද්‍යාලයට බඳවා ගන්නා 2011 වර්ෂයේ සිසු කණ්ඩායමේ සිට සියළුම ප්‍රථම වර්ෂ සිසු කණ්ඩායමට අනිවාර්ය්‍ය කිරීමට පීඨ මණ්ඩලයත්, සනාතන සභාවත්, පාලක සභාවත් ඒකමතිකව සම්මත කොට තිබීම ඉතාම වැදගත් කරුණකි. එසේම බෞද්ධ උපදේශනය ද දැඅවුරුදු ඩිප්ලෝමා පාඨමාලාවක් 2011 වසරේ සිට අලුතෙන් හඳුන්වා දී ඇත.

විශ්වවිද්‍යාලය පිහිටුවීමේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා හිටපු ජනාධිපතිතුමියගේ විශේෂ ඉල්ලීම පරිදි දැඅවුරුදු විදේශ ධර්මදූත සේවා පාඨමාලාවක් ඉංග්‍රීසි මාධ්‍යයෙන් ආරම්භ කොට දැනට පවත්වාගෙන යනු ලැබේ. ශිෂ්‍යයින්ගේ ඉංග්‍රීසි භාෂා දැනුම දියුණු කිරීම සඳහා ඉංග්‍රීසි සහතිකපත්‍ර පාඨමාලාවක් ද, ඉංග්‍රීසි ඩිප්ලෝමා පාඨමාලාව ද ආරම්භ කළෙමි. ඉංග්‍රීසි විෂයක්

වශයෙන් හැදෑරීමට කැමති සිසුන්ට අවස්ථාවක් ලබා දීම වශයෙන් ඉංග්‍රීසි අධ්‍යයන අංශයක් ද ආරම්භ කර ඇත.

තොරතුරු තාක්ෂණය භාවිතා කරමින් ඉගැන්වීම් කටයුතු දේශීය මෙන් ම ජාත්‍යන්තර වශයෙන් ව්‍යාප්ත කිරීමට අවශ්‍ය යටිතල පහසුකම් ආතර් සී. ක්ලාක් මධ්‍යස්ථානයේ සහයෝගයෙන් සැලසුම් කර ගෙන යන අතර විශ්වවිද්‍යාලයේ සෑම අංශයක්ම පරිගණකගත කිරීමට අවශ්‍ය සැලසුම් සකස් කර දැනට එම කටයුතු නිම වෙමින් පවතී.

විශ්වවිද්‍යාලයේ අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලය පුහුණු කිරීම සඳහා ද කටයුතු කර ඇති අතර මහෝපාධ්‍යාය අරමුදල යටතේ ශිෂ්‍ය හා සේවක දෙපක්ෂයේ ම සුභසාධන කටයුතු සඳහා පහසුකම් සළසා ඇත. අධ්‍යයන කාර්ය මණ්ඩලයේ වෘත්තීය සංවර්ධනය සඳහා එක් එක් ආචාර්යවරුන් විසින් මාසිකව ශාස්ත්‍රීය පර්යේෂණ පත්‍රිකාවක් බැගින් ඉදිරිපත් කිරීමට ද, ඒවා " බෞද්ධ හා පාලි අධ්‍යයන" වාර්ෂික ශාස්ත්‍රීය සංග්‍රහයෙහි පළ කිරීමට ද කටයුතු යොදා ඇත. 2010 වර්ෂය අවසාන වන විට මෙවැනි වැඩමුළු 54 ක් පවත්වා ඇති බව සඳහන් කරනුයේ බලවත් සතුටිනි.

2005 වර්ෂයේ සිට අභ්‍යන්තර සිසුන් සඳහා පරිගණක යෙදුම් පිළිබඳ සහතික පත්‍ර පාඨමාලා හඳුන්වා දී ඇත. එයට අමතරව නූතන භාෂා වශයෙන් ජර්මන්, ජපන්, චීන, හින්දි, කොරියන් සහ දෙමළ භාෂා සහතික පත්‍ර පාඨමාලා ද ආරම්භ කර ඇත. සියළු පාඨමාලා සිසුන්ට වඩාත් ප්‍රයෝජනවත් වන පරිදි සකසා දෑඅවුරුදු ඩිප්ලෝමා පාඨමාලා බවට 2011 වර්ෂයේ සිට පරිවර්තනය කර ඇත. ඈත ගම් දනව් වලින් පැමිණ සිටින ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා තම අධ්‍යයන කාර්යයෙන් පසු නැවතත් බොහෝ දෙනෙකු යනුයේ තම දායකයින් වෙතය. ඔවුන්ගේ දෛනික අවශ්‍යතාවල එක පැත්තකි, හැම කාර්යකටම සුභ මුහුර්ථයක් බලා ගැනීම. එහිදී ඔවුනට උපකාරී වීම පිණිස අවශ්‍යවන ජ්‍යෝතිෂය පිළිබඳ දැනුම ලබා දීම සඳහා 2011 වර්ෂයේ සිට අළුතෙන් ජ්‍යෝතීර් විද්‍යා සහ වාස්තු විද්‍යා දෑඅවුරුදු ඩිප්ලෝමා පාඨමාලාව ආරම්භ කළෙමි. 2011 වර්ෂයේ සිට 2016 දක්වා පස් අවුරුදු සැලැස්මක් ද සකස් කර වාර්ෂිකව යාවත්කාලීන කරමින් ක්‍රියාත්මක කිරීමට පියවර ගෙන ඇත.

2550 බුද්ධ ජයන්තිය නිමිත්තෙන් විද්‍යුත් මාධ්‍ය ධර්මදේශකයන් වහන්සේලා පුහුණු කිරීම සඳහා ආගමික කටයුතු පිළිබඳ අමාත්‍යංශයේ අනුග්‍රහයෙන් ධර්ම සන්නිවේදන පාඨමාලාවක් ආරම්භ කර ඇත. ආගමික හා සදාචාර වර්ධන අමාත්‍යංශයේ සහය ඇතිව නව පාඨමාලා හඳුන්වා දීමට ද කටයුතු කර ඇත.

දැනට විදේශීය සිසුන් 182 පමණ අභ්‍යන්තර සිසුන් වශයෙන් ලියාපදිංචි වී ඉගෙනුම ලබන බැවින් ද, සිංගප්පූරුව, මැලේසියාව, ඇමරිකාව, එක්සත් රාජධානිය, ජර්මනිය, ඔස්ට්‍රියාව, ස්කොට්ලන්තය සහ දකුණු කොරියාව යන විදේශීය රටවල මෙම විශ්වවිද්‍යාලයේ අනුබද්ධායතන ක්‍රියාත්මක වන හෙයින් ද මෙය ජාත්‍යන්තර විශ්වවිද්‍යාලයක් බවට පත් වී ඇති බව ද සඳහන් කරනු කැමැත්තෙමි.

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් සජ්ත වාර්ෂික නිවාඩු ලබා මෙම විශ්වවිද්‍යාලයට අනුයුක්ත කර ගනු ලැබූ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය එම්. ඩබ්ලිව්. විමල් විජේරත්න මහතාගේ මෙහෙයවීම යටතේ නටබුන් වූ පෞරාණික බෞද්ධ සිද්ධස්ථාන වෙත ගොස් ඒවා පිළිබඳව ගවේෂණාත්මක පර්යේෂණ පත්‍රිකා ඉදිරිපත් කිරීම අධ්‍යයන කාර්ය මණ්ඩලය මඟින් සිදු කර ඇත. "තේලකටාහ ගාථා" ඉපැරණි පාලි ග්‍රන්ථය සංස්කරණය කොට, මෙම විශ්වවිද්‍යාලයට වසර 25 ක් සපිරෙන 2007 වසරේ එය මුද්‍රණද්වාරයෙන් එළි දක්වා ඇත.

මෙම විශ්වවිද්‍යාලයේ බාහිර විභාග අංශයේ බාහිර පාඨමාලා එකොළහක් පමණ දැනට ක්‍රියාත්මක වේ. බුද්ධ ධර්ම ඩිප්ලෝමා පාඨමාලාව, පාලි ඩිප්ලෝමා පාඨමාලාව, සංස්කෘත ඩිප්ලෝමා පාඨමාලාව, දහම් සරසවිය බුද්ධ ධර්ම ඩිප්ලෝමා පාඨමාලාව, ධර්ම සන්නිවේදනය ඩිප්ලෝමා පාඨමාලාව, ඉංග්‍රීසි ඩිප්ලෝමා පාඨමාලාව, විදේශ ධර්මදූත සේවා පශ්චාද් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව, බෞද්ධ අධ්‍යයන පශ්චාද් උපාධි පාඨමාලාව, ශාස්ත්‍රවේදී උපාධි පාඨමාලාව, ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව සහ දර්ශනපති උපාධි පාඨමාලාව ආදී පාඨමාලා ක්‍රියාත්මක වේ. 2010 වසරේ එම සියලු පාඨමාලාවන් දේශීය වශයෙන් සිසුන් 4617 දෙනෙක් ද විදේශීය ආයතන මාර්ගයෙන් සිසුන් 158 දෙනෙක් ද ලියාපදිංචිව පාඨමාලා හැදෑරූහ.

මෙම විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර අධ්‍යයන කටයුතු පුළුල් කිරීම සඳහා හෝමාගම පරිශ්‍රයේ විදේශීය සිසුන් සඳහා නේවාසිකාගාර, විභාග ශාලා, භාවනා මන්දිර, කථිකාචාර්යවරුන් සඳහා නේවාසිකාගාර ඉදිරි වර්ෂ වලදී ඉදි කිරීමට සැළසුම් කර ඇත. 2600 සම්බුද්ධත්ව ජයන්තිය වෙනුවෙන් ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය මගින් ඉටු කරනු ලබන ආගමික හා අධ්‍යාපනික සේවාව ඉටු කිරීම පිණිස අතිගරු ජනාධිපතිතුමාගේ අනුග්‍රහයෙන් ලබා දෙන ලද කොළඹ මුම්ටාස් මහල් ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කොට විදේශකයින් සඳහා කෙටි කඩිනම් පාඨමාලා ආරම්භ කිරීමට සැළසුම් කර ඇත. ඉන්දියාව, ඕස්ට්‍රේලියාව, ප්‍රංශය, ජපානය, ඇමරිකාව ආදී රටවල විදේශීය ආයතන පිහිටුවීමට තව දුරටත් සාකච්ඡා කරමින් පවති. ඉන්දියාව, තායිලන්තය වැනි රටවල් සමඟ අවබෝධතා ගිවිසුම් අත්සන් කර සිසු හුවමාරු වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට ද බලාපොරොත්තු වෙමි.

මෙලෙස විවිධ ක්‍රමෝපායන් මගින් දේශීය හා විදේශීය වශයෙන් බුද්ධ ධර්මය පිළිබඳ උගතුන් බිහි කරමින් ලෝක ජනතාවට බුද්ධ ධර්මයෙන් ලැබිය හැකි සහාය ලබා දීමට අප විශ්වවිද්‍යාලය තව තවත් භෞතික හා මානව සම්පත් වලින් ද දියුණු කළ යුතුය. ඒ සඳහා අප ඇප කැපව ක්‍රියා කළ යුතුව ඇත.

මහාචාර්ය ආචාර්ය පූජ්‍ය ඉත්තදෙමලියේ ඉන්දසාර ස්ථවිර
**මහෝපාධ්‍යාය**

# 01. සාමාන්‍ය

## (අ) හැඳින්වීම

ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී ජනරජයේ 1981 අංක 74 දරන පාර්ලිමේන්තු සංශෝධන පනතින් පිහිටුවන ලද ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය 1982 අප්‍රේල් මස 22 වෙනි දින කොළඹ 07, බෞද්ධාලෝක මාවත, අංක 214 යන ස්ථානයෙහි උත්සවශ්‍රීයෙන් විවෘත කරන ලදී. බුද්ධ ධර්මය ප්‍රචාරය කිරීම, ශ්‍රී ලංකාවේ හා විදේශීය රටවල බෞද්ධ හා පාලි අධ්‍යයනය ප්‍රවර්ධනය කිරීම හා අදාළ ක්ෂේත්‍රයන්හි පර්යේෂණ සඳහා පහසුකම් සැලැස්වීම මෙම විශ්වවිද්‍යාලය පිහිටුවීමේ ප්‍රධාන අරමුණු වේ.

1995 අංක 37 දරන ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය (සංශෝධන) පනත මඟින් යථෝක්ත පනත සංශෝධනය කොට ඇත. එකී සංශෝධන ක්‍රියාත්මක වීමත් සමඟ මෙතෙක් පැවති දේශීය අනුබද්ධායතන අහෝසි වී ඇති අතර, ශ්‍රී ලංකාවේ අනෙකුත් ජාතික විශ්වවිද්‍යාලයන්හි ව්‍යුහයට අනුව ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය ප්‍රතිව්‍යුහගත කොට, විශ්වවිද්‍යාලයේ බාහිර විභාග හා පශ්චාත් උපාධි අංශය කොළඹ පරිශ්‍රයේ ද, නේවාසිකාගාර සහිතව අධ්‍යයන පරිශ්‍රය හෝමාගම, පිටිපන ද, පරිපාලන මධ්‍යස්ථානය 2010.08.12 දින අංක 37, මොරගහහේන පාර, පිටිපන ද ස්ථානගත කොට ඇත. ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවට අයත් කොළඹ 03, ගාලු පාරේ පිහිටි මුම්ටාස් මහල් නිල නිවස ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයට 2009.05.28 දින සිට පවරා දී ඇත. ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය සකලාංග සම්පූර්ණ ජාත්‍යන්තර මට්ටමේ විශ්වවිද්‍යාලයක් බවට පත් කිරීමට අවශ්‍ය මූලික විධිවිධාන දැනටමත් සම්පාදනය කොට තිබේ. පොදු රාජ්‍ය මණ්ඩලීය විශ්වවිද්‍යාල සංගමයේ සාමාජිකත්වය ද දරණ අතර, මෙරට විශ්වවිද්‍යාල පද්ධතියේ Committee of Vice Chancellors and Directors (C.V.C.D.) හි ආශ්‍රිත සාමාජිකයෙකි.

## (ආ) අරමුණු

1995 අංක 37 දරණ ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය (සංශෝධන) පනතේ විධිවිධාන අනුව ප්‍රතිව්‍යුහගත විශ්වවිද්‍යාලයේ අරමුණු පහත දැක්වේ.

I. ශ්‍රී ලංකාවේ සහ විදේශයන්හි බුද්ධාගම පතුරුවාලීම සහ ධර්මදූත කටයුතු පෝෂණය කිරීම සඳහා බෞද්ධ ධර්මය සහ විනය පිළිබඳ ශාස්ත්‍රධරයන් පුහුණු කිරීම,

II. ශ්‍රී ලංකාවේ සහ විදේශයන්හි පාලි භාෂාව, බෞද්ධ සංස්කෘතිය සහ බෞද්ධ දර්ශනය හැදෑරීම ප්‍රවර්ධනය කිරීම සහ වර්තමාන ලෝක තත්ත්වයට ගැළපෙන පරිදි එම අධ්‍යයන නංවාලීම,

III. (අ) පිරිවෙන්වල, පාසල්වල සහ ඒ හා සමාන ආයතනවල බුද්ධාගම හා පාලි භාෂාව ඉගැන්වීම සඳහා ශිෂ්‍ය භික්ෂුන් වහන්සේලා සහ ගිහි පිරිමි ශිෂ්‍යයන් පුහුණු කිරීම,

(ආ) ශිෂ්‍ය භික්ෂුන් වහන්සේලා සහ සියලු ම ගිහි පිරිමි ශිෂ්‍යයන් අතර ආචාර ධර්මානුකූල පැවැත්ම හා මානසික ශික්ෂණය පවත්වාගෙන යාම සහ ඒවා වැඩිදියුණු කරීම සඳහා අවශ්‍ය පහසුකම් සැළසීම සහ

(ඇ) ඉහත සඳහන් කාරණා කිසිවක් සම්බන්ධ හෝ ආනුෂංගික වෙනත් යම් කාරණා.

## (ඇ) විශ්වවිද්‍යාලයේ නිලධරයෝ

සියම් නිකායේ අස්ගිරි පාර්ශ්වයේ මහානායක අතිපූජ්‍ය උඩුගම ශ්‍රී බුද්ධරක්ඛිත මහා නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ 2010.01.15 දින දක්වා මහා මහෝපාධ්‍යාය ධූරය ඉසුලූහ. ශ්‍රී ලංකා අමරපුර මහා සංඝ සභාවේ අති පූජ්‍ය රාජකීය පණ්ඩිත දවුල්දෙන ඤාණිස්සර මහා නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ 2010.01.16 දින සිට මෙම විශ්වවිද්‍යාලයේ මහා මහෝපාධ්‍යාය ධූරයට පත් වූහ. පූජ්‍ය මහාචාර්ය ඉත්තදෙමලියේ ඉන්දසර ස්වාමීන්ද්‍රයන් වහන්සේ මහෝපාධ්‍යාය ධූරය උසුලති. බෞද්ධ අධ්‍යයන පීඨාධිපති වශයෙන් මහාචාර්ය පූජ්‍ය වාච්චේ ධම්මරක්ඛිත ස්වාමීන්ද්‍රයන් වහන්සේ කටයුතු කරන අතර භාෂා අධ්‍යයන පීඨාධිපති වශයෙන් ජ්‍යෙෂ්ඨ මහාචාර්ය පූජ්‍ය උතුරාවල ධම්මරක්ඛිත ස්වාමීන්ද්‍රයන් වහන්සේ කටයුතු කරති. විශ්වවිද්‍යාලයේ ලේඛකාධිකාරී ලෙස ආර්.ඒ. පියරත්න මහතා කටයුතු කරයි. සී. කරුණාරත්න මහත්මිය විශ්වවිද්‍යාලයේ පුස්තකාලයාධිකාරී ලෙස කටයුතු කරයි. වැඩ බලන මූල්‍යාධිකාරී ලෙස ඩී.සී. රණතුංග මිය 2010.12.31 දින දක්වා එම තනතුරෙහි කටයුතු කළේ ය.

## (ඇ) විශ්වවිද්‍යාලයේ බල මණ්ඩලය – පාලක සභාව

**01. මහෝපාධ්‍යායයන් වහන්සේ** :- මහාචාර්ය පූජ්‍ය ඉත්තදෙමලියේ ඉන්දසර ස්වාමීන්ද්‍රයන් වහන්සේ

**02. ඒ ඒ පීඨයේ පීඨාධිපතිවරු** :-

**භාෂා අධ්‍යයන පීඨාධිපති** ජ්‍යෙෂ්ඨ මහාචාර්ය පූජ්‍ය උතුරාවල ධම්මරතන ස්වාමීන්ද්‍රයන් වහන්සේ

**බෞද්ධ අධ්‍යයන පීඨාධිපති** - මහාචාර්ය පූජ්‍ය වාච්චේ ධම්මරක්ඛිත ස්වාමීන්ද්‍රයන් වහන්සේ

**03. සනාතන සභා සාමාජිකයින් අතුරින් තෝරා පත් කරගත් සාමාජිකයින් :**

- ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය පූජ්‍ය පිටිගල විජිත ස්වාමීන්ද්‍රයන් වහන්සේ
- මහාචාර්ය ඊ.ඒ. වික්‍රමසිංහ මහතා

**04. බුද්ධශාසන අමාත්‍යාංශයේ ලේකම් හෝ ඔහුගේ නාමිකයා** :-

- එච්.එම්. හේරත් මහතා (ලේකම්) - (2010.04.22 දක්වා)
- පී.එම්. පටබැඳිගේ මහතා - (2010.06.29 පාලක සභාව)
- පී.ඩබ්.ඩී.සී. ජයතිලක මහතා - (2010.06.29 පාලක සභාව)
- එච්.ජී.සී. හේරත් මහතා (ලේකම්) - (2010.08.31 දින සිට)

**05. අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් හෝ ඔහුගේ නාමිකයා** :-

- පියසේන රනේපුර මහතා - (අතිරේක ලේකම්)

**06. විෂය භාර ගරු ඇමතිතුමා විසින් පත් කළ සාමාජිකයන් :**

- මහාචාර්ය පූජ්‍ය තුඹුල්ලේ ශ්‍රී සීලක්ඛන්ධ නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ
- මහාචාර්ය කොල්ලුපිටියේ මහින්ද සංඝරක්ඛිත නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ
- පූජ්‍ය රාජකීය පණ්ඩිත බලංගොඩ සෝභිත නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ
- පූජ්‍ය රාජකීය පණ්ඩිත තිරිකුණාමලේ ආනන්ද අනුනායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ
- පූජ්‍ය බානගල උපතිස්ස නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ
- මහාචාර්ය ආරියපාල පෙරේරා මහතා
- එස්.සී. මාන්නප්පෙරුම මහතා
- නීතිඥ ඒ.ඒ. මහින්ද රුළපනාව මහතා

**පාලක සභාවේ ලේකම් ලෙස :-**

- ආර්.ඒ. පියරත්න මහතා, ලේඛකාධිකාරී

**පාලක සභා රැස්වීම් පැවැත්වූ වාර ගණන :**

2010.01.01 දින සිට 2010.12.31 දින දක්වා පාලක සභා වාර 11 ක් සහ විශේෂ පාලක සභා වාර 01 ක් පවත්වා ඇත.

**❖ සනාතන සභාව**

**01. මහෝපාධ්‍යායයන් වහන්සේ :-**

- මහාචාර්ය පූජ්‍ය ඉත්තදෙමලියේ ඉන්දසර ස්වාමීන්ද්‍රයන් වහන්සේ

**02. ඒ ඒ පීඨයේ පීඨාධිපතිවරු :-**

**භාෂා අධ්‍යයන පීඨාධිපති** - ජ්‍යෙෂ්ඨ මහාචාර්ය පූජ්‍ය උතුරාවල ධම්මරතන ස්වාමීන්ද්‍රයන් වහන්සේ

**බෞද්ධ අධ්‍යයන පීඨාධිපති** - මහාචාර්ය පූජ්‍ය වාච්චේ ධම්මරක්ඛිත ස්වාමීන් වහන්සේ

**03. එක් එක් අධ්‍යයනාංශ ප්‍රධානීහු :-**

- මහාචාර්ය පූජ්‍ය ගල්ලැල්ලේ සුමනසිරි ස්වාමීන්ද්‍රයන් වහන්සේ (සමය අධ්‍යයන හා තුලනාත්මක දර්ශන අධ්‍යයනාංශාධිපති) - 2010.07.13 දක්වා
- ආචාර්ය පූජ්‍ය නෙලුවේ සුමනවංශ ස්වාමීන්ද්‍රයන් වහන්සේ (සංස්කෘත අධ්‍යයනාංශාධිපති)
- ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය පූජ්‍ය පිටිගල විජිත ස්වාමීන්ද්‍රයන් වහන්සේ (බෞද්ධ දර්ශන අධ්‍යයනාංශාධිපති)
- මහාචාර්ය ඊ.ඒ වික්‍රමසිංහ මහතා - (සිංහල හා නූතන භාෂා අධ්‍යයනාංශාධිපති)
- ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය කේ.ඒ.එස්.එන්. අමරසේකර මහත්මිය (පුරාවිද්‍යා අධ්‍යයනාංශාධිපතිනි)
- කථිකාචාර්ය එම්.ඒ.සී. මුණසිංහ මහත්මිය (බෞද්ධ සංස්කෘතිය අධ්‍යයනාංශාධිපතිනි)

**04. පුස්තකාලයාධිකාරී :-**

- ආචාර්ය චන්ද්‍රා කරුණාරත්න මහත්මිය

**05. පීඨ නියෝජිත :-**

**භාෂා අධ්‍යයන පීඨය** - සහාය මහාචාර්ය පූජ්‍ය දුනුකේවත්තේ ගුණරතන ස්වාමීන්ද්‍රයන් වහන්සේ (2010.11.09 දින සිට)

**බෞද්ධ අධ්‍යයන පීඨය** - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය එච්.එම්.වයි.වී.කේ. හේරත් මිය

**06. පත් කරන ලද සාමාජිකයන් :-**

- ආචාර්ය පූජ්‍ය නාබිරිත්තන්කඩවර ඤාණරතන ස්වාමීන්ද්‍රයන් වහන්සේ (2010.07.13 දක්වා )
- ආචාර්ය පූජ්‍ය මාගම්මන පඤ්ඤානන්ද ස්වාමීන්ද්‍රයන් වහන්සේ (2010.09.14 දින සිට )

- ආචාර්ය පූජ්‍ය නායිම්බල ධම්මදස්සි ස්වාමීන්ද්‍රයන් වහන්සේ (2010.07.13 දක්වා )
- ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය කේ.ඒ. වීරසේන මහතා (2010.09.14 දින සිට)
- මහාචාර්ය පූජ්‍ය තැරැලේ ධම්මරතන ස්වාමීන්ද්‍රයන් වහන්සේ
- ආචාර්ය පූජ්‍ය මැදවච්චියේ ධමම්ජෝති ස්වාමීන්ද්‍රයන් වහන්සේ
- මහාචාර්ය උදිත ගරුසිංහ මහතා

**07. සනාතන සභාවේ ලේකම් :-**

- ආර්.ඒ. පියරත්න මහතා, ලේඛකාධිකාරී

➢ **සනාතන සභා රැස්වීම් පැවැත්වූ වාර ගණන :**

2010.01.01 දින සිට 2010.12.31 දින දක්වා සනාතන සභා වාර 12 ක් පවත්වා ඇත.

❖ **පීඨ මණ්ඩල**

සංශෝධිත පනතේ විධිවිධාන අනුව එක් එක් පීඨය සඳහා පහත දැක්වෙන තැනැත්තන්ගෙන් සමන්විත පීඨ මණ්ඩල දෙකක් පිහිටුවන ලදී.

**(අ) බෞද්ධ අධ්‍යයන පීඨය**

- පීඨාධිපති - මහාචාර්ය පූජ්‍ය වාච්චේ ධම්මරක්ඛිත හිමි
- මහාචාර්ය පූජ්‍ය ගල්ලැල්ලේ සුමනසිරි හිමි (2010.07.22 සිට සප්ත වාර්ෂික නිවාඩු)
- කථිකාචාර්ය පූජ්‍ය පිටිගල විජිත හිමි
- ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය කේ.ඒ.එස්.එන්. අමරසේකර මිය
- ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය එච්.එම්.වයි.වී.කේ. හේරත් මිය
- කථිකාචාර්ය එම්.ඒ.සී. මුණසිංහ මිය
- ආධුනික කථිකාචාර්ය සමන්ත ඉලංගකෝන් මහතා
- ආධුනික කථිකාචාර්ය පූජ්‍ය අලුත්ගම විමලරතන හිමි (2010.02.24 දින සිට)

➢ **පීඨ මණ්ඩල ශිෂ්‍ය නියෝජිතවරු**

- පූජ්‍ය පානම ආනන්ද හිමි
- පූජ්‍ය බලහරුවේ රතනසිරි හිමි

➢ **පත්කළ සාමාජික**

- මහාචාර්ය දයා එදිරිසිංහ මහතා
- ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය කරුණාසේන හෙට්ටිආරච්චි මහතා
- ආචාර්ය චන්ද්‍රදාස වන්නිගම මහතා (2010.02.24 දින දක්වා)
- ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය කේ.ඒ. වීරසේන මහතා (2010.03.26 දින සිට)

පීඨ මණ්ඩල ලේකම් ලෙස සහකාර ලේඛකාධිකාරී (අධ්‍යයන හා ශිෂ්‍ය සේවා) - පූජ්‍ය බෝගමුවේ ධීරානන්ද හිමි කටයුතු කළේ ය.

2010.01.01 දින සිට 2010.12.31 දින දක්වා පීඨ මණ්ඩල රැස්වීම් වාර 11 ක් පවත්වා ඇත.

**(ආ) භාෂා අධ්‍යයන පීඨය**

- පීඨාධිපති - ජ්‍යෙෂ්ඨ මහාචාර්ය පූජ්‍ය උතුරාවල ධම්මරතන හිමි
- පූජ්‍ය මහාචාර්ය නෙළුවේ සුමනවංශ හිමි
- මහාචාර්ය ඊ.ඒ. වික්‍රමසිංහ මහතා
- සහාය මහාචාර්ය පූජ්‍ය දුනුකේවත්තේ ගුණරතන හිමි
- ආධුනික කථිකාචාර්ය පූජ්‍ය මාවතගම පේමානන්ද හිමි
- ආචාර්ය පූජ්‍ය මැදගොඩ අභයතිස්ස හිමි (2010.09.10 දක්වා)
- ආධුනික කථිකාචාර්ය පූජ්‍ය මොරගොල්ලාගම උපරතන හිමි (2010.09.01 දින සිට අධ්‍යයන නිවාඩු)
- එම්.එච්.පී.කේ. ගුණසේන මහතා
- එස්.පී. සමරවික්‍රම මහතා - පරිගණක උපදේශක

➢ **පීඨ මණ්ඩල ශිෂ්‍ය නියෝජිතවරු**

- පූජ්‍ය මොණරාගල සුමේධානන්ද හිමි
- පූජ්‍ය කුළසැන්දැවේ සාරද හිමි

➢ **බාහිර සාමාජිකවරු**

- මහාචාර්ය වෝල්ටර් මාරසිංහ මහතා
- ආචාර්ය සමන් චන්ද්‍ර රණසිංහ මහතා
- පූජ්‍ය මාදුරුඔයේ ධම්මිස්සර හිමි

පීඨ මණ්ඩල ලේකම් ලෙස සහකාර ලේඛකාධිකාරී (අධ්‍යයන හා ශිෂ්‍ය සේවා) පූජ්‍ය බෝගමුවේ ධීරානන්ද හිමි කටයුතු කළේය.

2010.01.01 දින සිට 2010.12.31 දින දක්වා බෞද්ධ අධ්‍යයන පීඨ මණ්ඩල රැස්වීම් වාර 11 ක් පවත්වා ඇත. භාෂා අධ්‍යයන පීඨ මණ්ඩල රැස්වීම් වාර 11 ක් පවත්වා ඇත.

❖ **විගණන හා කළමනාකරණ කමිටුව**

- එස්.පී.එම්.කේ. සිරිවර්ධන මහත්මිය - සභාපතිනි, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව, මහා භාණ්ඩාගාරය
- මහාචාර්ය ආරියපාල පෙරේරා මහතා - පාලක සභා සාමාජික
- එස්.සී. මානප්පෙරුම මහතා - පාලක සභා සාමාජික
- පී. රනේපුර මහතා - පාලක සභා සාමාජික
- ආර්.ඒ. පියරත්න මහතා - ලේඛකාධිකාරී
- ජානක වැලිවත්ත මහතා - විගණන අධිකාරී (නිරීක්ෂක)
- එච්.පී. වීරසිංහ මහත්මිය - කැඳවුම්රු (සහකාර අභ්‍යන්තර විගණක)

2010 වර්ෂය තුළ පැවැත්වුණු රැස්වීම් වාර ගණන 04 කි.

## ❖ මුදල් කමිටුව

- මහාචාර්ය පූජ්‍ය ඉත්තදෙමලියේ ඉන්දසර හිමි - සභාපති - මහෝපාධ්‍යාය
- ජ්‍යෙෂ්ඨ මහාචාර්ය පූජ්‍ය උතුරාවල ධම්මරතන හිමි - පීඨාධිපති, භාෂා අධ්‍යයන පීඨය
- පී. රනේපුර මහතා - අතිරේක ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය
- එන්.එම්.ඩී. නවරත්න මහතා - නියෝජ්‍ය අධ්‍යක්ෂ, මහා භාණ්ඩාගාරය
- ආර්.ඒ. පියරත්න මහතා - ලේඛකාධිකාරී
- ඩී.සී. රණතුංග මිය - වැඩබලන මූල්‍යාධිකාරී

2010 වර්ෂය සඳහා මුදල් කමිටු රැස්වීම් පවත්වන ලද වාර ගණන 10 කි.

## ❖ ආයතනික ප්‍රසම්පාදන කමිටු හා සුළු ප්‍රසම්පාදන කමිටු - 2010

### ➢ ආයතනික ප්‍රසම්පාදන කමිටුව

- මහාචාර්ය පූජ්‍ය ඉත්තදෙමලියේ ඉන්දසර හිමි - සභාපති
  මහෝපාධ්‍යාය
- ආර්.ඒ. පියරත්න මහතා - සාමාජික
  ලේඛකාධිකාරී
- ඩී.එම්.එස්. බණ්ඩාර මහත්මිය - සාමාජික
  අධ්‍යක්ෂ - උසස් අධ්‍යාපන අමාත්‍යාංශය
- ඊ.ඒ. ගුණසේන මහතා - ලේකම්
  ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී (පාලන)

2010 වර්ෂය සඳහා ආයතනික ප්‍රසම්පාදන කමිටුව රැස්වීම් පවත්වන ලද වාර ගණන 03 කි.

### ➢ සුළු ප්‍රසම්පාදන කමිටුවේ සංයුතිය

- ජ්‍යෙෂ්ඨ මහාචාර්ය පූජ්‍ය උතුරාවල ධම්මරතන ස්වාමීන්ද්‍රයන් වහන්සේ
  පීඨාධිපති - භාෂා අධ්‍යයන පීඨය
- ආර්.ඒ. පියරත්න මහතා - ලේඛකාධිකාරී
- ඩී.සී. රණතුංග මිය - වැඩබලන මූල්‍යාධිකාරී

2010 වර්ෂය සඳහා සුළු ප්‍රසම්පාදන කමිටුව රැස්වීම් පවත්වන ලද වාර ගණන 11 කි.

## ❖ අධ්‍යයන / අනධ්‍යයන කාර්යමණ්ඩල නිවාස කමිටුව

- මහාචාර්ය පූජ්‍ය ඉත්තදෙමලියේ ඉන්දසර හිමි - සභාපති
  මහෝපාධ්‍යාය
- ජ්‍යෙෂ්ඨ මහාචාර්ය පූජ්‍ය උතුරාවල ධම්මරතන හිමි - සාමාජික
  පීඨාධිපති (භාෂා අධ්‍යයන) (2008 අගෝස්තු)
- මහාචාර්ය පූජ්‍ය වාච්චේ ධම්මරක්ඛිත ස්වාමීන්ද්‍රයන් වහන්සේ - සාමාජික
  පීඨාධිපති (බෞද්ධ අධ්‍යයන)
- ආර්.ඒ. පියරත්න මහතා - ලේඛකාධිකාරී - සාමාජික
- ජී. ජයතිස්ස මහතා - නියෝජ්‍ය ලේඛකාධිකාරී ලේකම්
- ඊ.ඒ. ගුණසේන මහතා - සාමාජික
  ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී (පාලන)

## ❖ ආචාර්ය මණ්ඩල රැස්වීම්

2010 වර්ෂය තුළ ආචාර්ය මණ්ඩල රැස්වීම් වාර 07 ක් පවත්වා ඇත.

## ❖ ශිෂ්‍ය සුභසාධන කමිටු

2010 වර්ෂය තුළ ශිෂ්‍ය සුභසාධන කමිටු රැස්වීම් වාර 02ක් පවත්වා ඇත. ලේකම් ලෙස සහකාර ලේඛකාධිකාරී (අධ්‍යයන හා ශිෂ්‍ය සේවා) පූජ්‍ය බෝගමුවේ ධීරානන්ද හිමි කටයුතු කළේය.

## ❖ උසස් උපාධි කමිටුව

- ජ්‍යෙෂ්ඨ මහාචාර්ය පූජ්‍ය උතුරාවල ධම්මරතන හිමි - පීඨාධිපති (භාෂා අධ්‍යයන)
- මහාචාර්ය පූජ්‍ය වාච්චේ ධම්මරක්ඛිත හිමි - පීඨාධිපති (බෞද්ධ අධ්‍යයන)
- මහාචාර්ය පූජ්‍ය ගල්ලෑල්ලේ සුමනසිරි හිමි - සමය අධ්‍යයන හා තුලනාත්මක දර්ශන අධ්‍යයනාංශාධිපති
- මහාචාර්ය පූජ්‍ය නෙලුවේ සුමනවංශ හිමි - සංස්කෘත අධ්‍යයනාංශාධිපති
- මහාචාර්ය ඊ.ඒ. වික්‍රමසිංහ මහතා - සිංහල හා නූතන භාෂා අධ්‍යයනාංශාධිපති
- ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය පූජ්‍ය පිටිගල විජිත හිමි - බෞද්ධ දර්ශන අධ්‍යයනාංශාධිපති
- ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය කේ.ඒ.එස්.එන්. අමරසේකර මහත්මිය - පුරාවිද්‍යා අධ්‍යයනාංශාධිපති
- කථිකාචාර්ය එම්.ඒ.සී. මුණසිංහ මහත්මිය - බෞද්ධ සංස්කෘතිය අධ්‍යයනාංශාධිපති
- ජ්‍යෙෂ්ඨ මහාචාර්ය පූජ්‍ය උතුරාවල ධම්මරතන හිමි - පාලි අධ්‍යයනාංශාධිපති
- මහාචාර්ය වෝල්ටර් මාරසිංහ මහතා - බාහිර සාමාජික
- මහාචාර්ය ආරියපාල මහතා - බාහිර සාමාජික
- මහාචාර්ය රාජ් සෝමදේව මහතා - බාහිර සාමාජික
- රසික කරුණාරත්න මහතා, සහකාර ලේඛකාධිකාරී (පශ්චාත් උපාධි හා බාහිර විභාග) - කමිටු ලේකම්

2010.01.01 දින සිට 2010.12.31 දින දක්වා රැස්වීම් වාර 11 ක් පවත්වා ඇත.

## ❖ පරිපාලන නිලධාරි රැස්වීම්

මාසයකට වරක් පැවැත්වීමට කටයුතු කරනු ලබන මෙම රැස්වීමේ දී අංශවල පරිපාලන ගැටලු හා යෝජනා පිළිබඳ සාකච්ඡා කරනු ලබන අතර, මෙයට අමතරව අංශ ප්‍රධානීන්ගේ මූලිකත්වයෙන් යුතුව කාර්ය මණ්ඩල රැස්වීමක් ද පවත්වනු ලැබේ.

2010 වසර තුළ පැවැත් වූ රැස්වීම් වාර ගණන 05 කි.

# 02. පීඨ

සංශෝධිත පනතේ විධිවිධාන අනුව හා ප්‍රතිව්‍යුහගතකරණය සඳහා වැටුප් හා සේවක සංඛ්‍යා කමිටුව විසින් නිර්දේශ කර අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද අධ්‍යයන කාර්ය මණ්ඩල තනතුරු ද අනුමත විෂය නිර්දේශමාලා ද අනුව බෞද්ධ අධ්‍යයන ක්ෂෙත්‍රය සඳහා බෞද්ධ අධ්‍යයන පීඨයක් ද, භාෂා අධ්‍යයන ක්ෂෙත්‍රය සඳහා භාෂා අධ්‍යයන පීඨයක් ද වශයෙන් පීඨ දෙකක් පිහිටුවා ඇත.

## ❖ පීඨාධිපතිවරු

- බෞද්ධ අධ්‍යයන පීඨය - මහාචාර්ය පූජ්‍ය වාච්චේ ධම්මරක්ඛිත හිමි
- භාෂා අධ්‍යයන පීඨය - ජ්‍යෙෂ්ඨ මහාචාර්ය පූජ්‍ය උතුරාවල ධම්මරතන හිමි

## ❖ බෞද්ධ අධ්‍යයන පීඨය

බෞද්ධ අධ්‍යයන පීඨය පහත සඳහන් පරිදි අධ්‍යයනාංශ හතරකින් (04) සමන්විත වේ.

I. බෞද්ධ දර්ශනය
II. බෞද්ධ සංස්කෘතිය
III. සමය අධ්‍යයනය හා තුලනාත්මක දර්ශනය
IV. පුරාවිද්‍යාව

### ➢ අධ්‍යයනාංශ ප්‍රධාන

- බෞද්ධ දර්ශනය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය පූජ්‍ය පිටිගල විජිත හිමි
- බෞද්ධ සංස්කෘතිය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය එම්.ඒ.සී. මුණසිංහ මිය
- සමය අධ්‍යයනය හා තුලනාත්මක දර්ශනය -ඃ
  - මහාචාර්ය පූජ්‍ය ගල්ලැල්ලේ සුමනසිරි හිමි (2010.07.21 දක්වා)
  - මහාචාර්ය පූජ්‍ය වාච්චේ ධම්මරක්ඛිත හිමි (2010.07.22 සිට 2010.12.05 දක්වා)
  - මහාචාර්ය පූජ්‍ය ගල්ලැල්ලේ සුමනසිරි හිමි (2010.12.06 සිට)
- පුරාවිද්‍යාව - සස්නි අමරසේකර මිය, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (II ශ්‍රේණිය

### ➢ සෙසු ආචාර්ය මණ්ඩලය

- මහාචාර්ය පූජ්‍ය ඇකිරියගල නන්ද හිමි - මහාචාර්ය (සප්ත වාර්ෂික නිවාඩු)
- එච්.එම්.වයි.වී.කේ. හේරත් මිය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
- සමන්ත ඉලංගකෝන් මහතා - ආධුනික කථිකාචාර්ය
- පූජ්‍ය අලුත්ගම විමලරතන හිමි - ආධුනික කථිකාචාර්ය (2010.02.01 දින සිට)

### ➢ බාහිර කථිකාචාර්යවරු

| අධ්‍යයනාංශය (විෂය) | කථිකාචාර්යවරු සංඛ්‍යාව |
|---|---|
| පුරාවිද්‍යාව | 05 |
| බෞද්ධ උපදේශනය | 05 |
| බෞද්ධ දර්ශනය | 05 |
| බෞද්ධ සංස්කෘතිය | 07 |

## ❖ භාෂා අධ්‍යයන පීඨය

පහත සඳහන් පරිදි අධ්‍යයනාංශ හතරකින් (04) සහ ඒකකයකින් සමන්විත වේ.

I. සිංහල හා නූතන භාෂා අධ්‍යයනාංශය
II. සංස්කෘත අධ්‍යයනාංශය
III. පාලි අධ්‍යයනාංශය
IV. ඉංග්‍රීසි අධ්‍යයනාංශය
V. ඉංග්‍රීසි ඉගැන්වීම් ඒකකය

### ➢ අධ්‍යයනාංශ ප්‍රධානවරු

- පාලි අධ්‍යයනාංශය (ආවරණ) -:
  - ජ්‍යෙෂ්ඨ මහාචාර්ය පූජ්‍ය උතුරාවල ධම්මරතන හිමි (2010.06.30 දක්වා)
  - ආචාර්ය පූජ්‍ය මැදගොඩ අභයතිස්ස හිමි (2010.07.01 දින සිට 2010.09.09 දක්වා)
  - ජ්‍යෙෂ්ඨ මහාචාර්ය පූජ්‍ය උතුරාවල ධම්මරතන හිමි (2010.09.10 සිට 2010.12.31 දක්වා)
- සංස්කෘත භාෂා අධ්‍යයනාංශය - මහාචාර්ය පූජ්‍ය නෙලුවේ සුමනවංශ හිමි
- සිංහල හා නූතන භාෂා අධ්‍යයනාංශය - මහාචාර්ය ඊ.ඒ. වික්‍රමසිංහ මහතා
- ඉංග්‍රීසි අධ්‍යයනාංශය (ආවරණ) - මහාචාර්ය පූජ්‍ය නෙලුවේ සුමනවංශ හිමි - (2010.09.14 දින සිට)
- ඉංග්‍රීසි ඉගැන්වීම් ඒකකය - එම්.එච්.පී.කේ. ගුණසේන මහතා

### ➢ සෙසු ආචාර්ය මණ්ඩලය

- ජ්‍යෙෂ්ඨ මහාචාර්ය පූජ්‍ය වැගම පියරතන හිමි - (2009.05.07 දින සිට 2010.05.07 දින දක්වා වසරක දේශීය අධ්‍යයන නිවාඩු ලබා ඇත.)
- සහාය මහාචාර්ය පූජ්‍ය දුනුකේවත්තේ ගුණරතන හිමි
- කථිකාචාර්ය පූජ්‍ය මැදගොඩ අභයතිස්ස හිමි - 2010.09.10 දක්වා
- ආධුනික කථිකාචාර්ය පූජ්‍ය මාවතගම පේමානන්ද හිමි
- ආධුනික කථිකාචාර්ය පූජ්‍ය මොරගොල්ලාගම උපරතන හිමි - ( 2007.09.01 සිට අධ්‍යයන නිවාඩු, චීනය
- ආධුනික කථිකාචාර්ය ආර්.කේ.ඒ.එන්. රත්නසිරි මහතා
- ආධුනික කථිකාචාර්ය කේ.පී. ස්වර්ණානන්ද ගමගේ මහතා
- ආධුනික කථිකාචාර්ය එම්.එච්.පී.කේ. ගුණසේන මහතා
- එස්.පී. සමරවික්‍රම මහතා - පරිගණක උපදේශක

## ❖ බාහිර කථිකාචාර්යවරු

| අධ්‍යයනාංශය (විෂය) | කථිකාචාර්යවරු සංඛ්‍යාව |
|---|---|
| සංස්කෘත | 02 |
| පාලි | 04 |
| ජර්මන් | 01 |
| ජපන් | 01 |
| දෙමළ | 01 |
| හින්දි | 01 |
| චීන | 01 |
| කොරියානු | 02 |

❖ **ඉංග්‍රීසි ඉගැන්වීමේ ඒකකය**

- කේ.පී. ස්වර්ණානන්ද ගමගේ මහතා - ඉංග්‍රීසි උපදේශක I ශ්‍රේණිය
- ආර්.කේ.ඒ.එන්. රත්නසිරි මහතා - ඉංග්‍රීසි උපදේශක I ශ්‍රේණිය
- එම්.එච්.පී.කේ. ගුණසේන මහතා - ඉංග්‍රීසි උපදේශක II ශ්‍රේණිය

❖ **පරිගණක උපදේශක**

- එස්.පී. සමරවික්‍රම මහතා - පරිගණක උපදේශක II ශ්‍රේණිය

### ❖ බාහිර කථිකාචාර්ය පත් කිරීම් - 2007- 2011

| විෂය | 2007 | | 2008 | | 2009 | | 2010 | | 2011 | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | පැය ගණන | සංඛ්‍යාව | පැය ගණන | සංඛ්‍යාව | පැය ගණන | සංඛ්‍යාව | පැය ගණන | සංඛ්‍යාව | පැය ගණන |
| බෞද්ධ දර්ශනය | 10 | 1960 | 08 | 558 | 13 | 697 | 10 | 668 | 11 | 1286 |
| බෞද්ධ සංස්කෘතිය | 03 | 340 | - | - | 04 | 500 | 04 | 480 | 05 | 480 |
| සංස්කෘත | 03 | 480 | 02 | 300 | 03 | 570 | 02 | 480 | 03 | 600 |
| පාලි | 06 | 1320 | 03 | 600 | 04 | 720 | 04 | 720 | 03 | 540 |
| පුරාවිද්‍යාව | - | - | 03 | 180 | 01 | 240 | 05 | 120 | 06 | 280 |
| සමය අධ්‍යයනය හා තුලනාත්මක දර්ශනය | - | - | 01 | 120 | 01 | 360 | - | - | 04 | 180 |
| ජර්මන් | - | - | 01 | 120 | 01 | 120 | 01 | 120 | 01 | 120 |
| ජපන් | - | - | 01 | 120 | 01 | 120 | 01 | 120 | 01 | 120 |
| කොරියන් | - | - | 01 | 120 | 01 | 120 | 02 | 160 | 01 | 120 |
| දෙමළ | - | - | - | - | 01 | 120 | 01 | 120 | - | - |
| හින්දි | - | - | - | - | 01 | 120 | 01 | 120 | 01 | 120 |
| චීන | - | - | - | - | 01 | 120 | 01 | 120 | 01 | 120 |
| එකතුව | **22** | **4100** | **20** | **2118** | **32** | **3807** | **32** | **3228** | **37** | **3966** |

# 03. අධ්‍යයන කාර්ය මණ්ඩලයේ පර්යේෂණ හා ප්‍රකාශන

## ❖ මහාචාර්ය පූජ්‍ය වාච්චේ ධම්මරක්ඛිත හිමි

### ➢ සම්පත් දායකත්වය

1. ඒකක ක්‍රමයට අදාළව 2010 වර්ෂයේ නව විෂය නිර්දේශ සැකසීම පිළිබඳ උපදේශක කාර්ය භාරය ඉටු කිරීම.
2. බෞද්ධ උපදේශන දෑ අවුරුදු පාඨමාලාවට අදාළ විෂය නිර්දේශ සැකසීමේ අධීක්ෂණය හා ඊට අදාළව පාඨමාලාව ඇරඹීමට දායකත්වය ලබාදීම.
3. පොලිස් නිලධාරීන් සඳහා විශේෂ උපදේශන පාඨමාලාවකට අදාළ විෂය නිර්දේශ සැකසීමේ උපදේශකවරයා ලෙස කටයුතු කිරීම.
4. ආරම්භ කිරීමට යෝජිත බටහිර දර්ශනය, ආචාර විද්‍යාව, ප්‍රජා නායකත්වය හා මනෝවිද්‍යාව විෂය නිර්දේශ සැකසීමේ කමිටුවෙහි සම්බන්ධීකාරක ලෙස කටයුතු කිරීම.
5. ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය මඟින් පවත්වනු ලබන වෘත්තීය සංවර්ධන වැඩමුළුවට සම්බන්ධ වීම.
6. 2011 - 2015 පස් අවුරුදු සංයුක්ත සැළැස්මේ කමිටු සාමාජිකයකු ලෙස කටයුතු කිරීම.

### ➢ සඟරා ලිපි

(වත්තේගම සිරි ධම්මවාස නායක ස්වාමීන්ද්‍ර අභිනන්දන ශාස්ත්‍රීය සංග්‍රහය) "විනය මාතිකා විවරණ" සඳහා අධිකරණ සමතය මාතෘකාව යටතේ ලිපියක් ලබාදීම. සංස්කරණය ධම්මවිජය හිමි, දැරණියගල සෝභිත හිමි, තවලන්තැන්නේ, 2010 දෙසැම්බර්.

## ❖ මහාචාර්ය පූජ්‍ය ඇකිරියගල නන්ද හිමි

01. 2010 වර්ෂයේ රජයේ මුද්‍රණාලීය බෞද්ධ සංගමයේ 'නිවන් මග' ශාස්ත්‍රීය සංග්‍රහයට 'මහා කාරුණිකත්වය' මාතෘකාවෙන් ලිපියක් සැපයීම.
02. 2010 ජුලි මස රාමඤ්ඤ නිකායේ උපසම්පදා උත්සවයේ ශාස්ත්‍රීය සංග්‍රහය වන පටිපදා ශාස්ත්‍රීය සංග්‍රහයට 'පැවිදි ජීවිතයට පදනම්වන සීලය ශික්ෂා හා ශික්ෂාපද පිළිබඳ විමසීමක් ' යන මැයෙන් ලිපියක් සැපයීම.
03. ගුරු මැදුර-3 ශාස්ත්‍රීය සංග්‍රහයට 'බුදුසමයෙහි සිත පිළිබඳ සංකල්පය' නමින් ලිපියක් සැපයීම.
04. පහත සඳහන් ග්‍රන්ථ තුන එළි දැක්වීම :
    1. බෞද්ධ දර්ශනය අධ්‍යයනය
    2. පාලි භාෂාව හා සාහිත්‍යය අධ්‍යයනය
    3. බෞද්ධ සංස්කෘති ලේඛන

## ❖ මහාචාර්ය පූජ්‍ය ගල්ලැල්ලේ සුමනසිරි හිමි

### ➢ ප්‍රකාශන (සංස්කරණ)

උසස් සංස්කෘත ව්‍යාකරණ (ගොඩගේ පොත් සමාගම 2010)

- **Presentation**

| Date | Institute | Topic |
|---|---|---|
| 14.08.2010 | East London Buddhist Cultural Center | Religion, Science and Buddhism |
| 28.  2010 | East London Buddhist Cultural Center | Buddhism in Practice |
| 12.09.2010 | East London Buddhist Cultural Center | Right Livelihood in Buddhism |
| 09.09.2010 | East London Buddhist Cultural Center | Friendship in Buddhism |

- Conducting lectures in MA course, Buddhist and Pali University of Sri Lanka

❖ පූජ්‍ය පිටිගල විජිත හිමි - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය

- **පර්යේෂණ**

දර්ශනශූරී පශ්චාත් උපාධිය සඳහා අනුමත 'මුල් බුදුසමයාගත විඥ්ඥාණ සහ යෝගාචාර විඥ්ඥාණවාදය පිළිබඳ තුලනාත්මක අධ්‍යයනයක්' යන මාතෘකාවට අදාළ පර්යේෂණ සඳහා මූලාශ්‍ර තොරතුරු රැස් කිරීම.

- **ශාස්ත්‍රීය ලිපි**

  - 'මුල් බුදුසමයාගත නවංග සත්ථුසාසනය'
    නවාංග සත්ථුසාසනය පොත්තේවෙල විනීත නාහිමි අභිනන්දන ශාස්ත්‍රීය ග්‍රන්ථය (සංස්) බොරැල්ලේ කෝවිද හිමි, චරිත් වීරසිංහ, 2010 ජුලි 02 - පිටු : 11
  - විද්‍යාත්මක චින්තනය සහ බෞද්ධ දර්ශනය බුදුසරණ පත්‍රය, 2010.10.22 - පිටු : 19

- **සම්පත් දායකත්වය**

2011 වර්ෂයේ සිට ක්‍රියාත්මක කිරීමට නියමිත ඒකක ක්‍රමය යටතේ ප්‍රථම වර්ෂය සඳහා විෂය ඒකක සකස් කිරීම.

- **වැඩමුළු**

අධ්‍යයන කාර්ය මණ්ඩලයේ වෘත්තීය සංවර්ධන වැඩමුළු අංක 46 'මුල්බුදු සමයේ ප්‍රාමාණිකත්වය පිළිබඳ විමසුමක් ' මැයෙන් විශේෂ ශාස්ත්‍රීය දේශනය පැවැත්වීම.

❖ **කේ.ඒ.එස්.එන්. අමරසේකර මිය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය**

- **පර්යේෂණ ග්‍රන්ථ**
  අනුරාධපුර බටහිරාරාම (In press)

- **පර්යේෂණ ලිපි**

1. ශ්‍රී ලංකාවේ අභිගුණ්ඨික සමාජය
2. පොළොන්නරු රාජසභා ටැම් ලිපිය
3. The Burra Charter and its attempt to protect heritage (New Edition)

- **සම්පත් දායකත්වය**

Academic Member 3rd Asian International Conference - 20th, 21st of August 2010, Center for Asian Studies, University of Kelaniya.

❖ **එම්.ඒ.සී. මුණසිංහ මහත්මිය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය**

➢ **පර්යේෂණ**

දර්ශනශූරී උපාධිය සඳහා අවශ්‍ය පර්යේෂණ කටයුතු සිදු කර ඇත. මෙහිදී දසසිල් මාතාවන්ගේ ආරාම 10 කට ගොස් ඔවුන්ගේ අධ්‍යාපන තත්ත්වයන්, සමාජ, ආර්ථික පසුබිම්, සමාජ සේවා හා ආගමික සේවා ආදිය පිළිබඳ තොරතුරු රැස් කර ඇත.

➢ **ප්‍රකාශන**

විද්‍යෝදය ශාස්ත්‍රීය සංග්‍රහය සඳහා ගෞතම බුදුරදුන්ගේ 'කරුණාවේ පුද්ගලාත්වාරෝපනය' යනුවෙන් ශාස්ත්‍රීය ලිපියක් බාර දී ඇත.

❖ **එච්.එම්.වයි.වී.කේ. හේරත් මහත්මිය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය**

➢ **පර්යේෂණ ග්‍රන්ථ**

1. කොරියාවේ බුල්ගුක්සා විහාරය - ඓතිහාසික පුරාවිද්‍යාත්මක හා වාස්තු විද්‍යාත්මක අධ්‍යයනයක් - 2010 කර්තෘ ප්‍රකාශනයකි.

➢ **සම්පත් දායකත්ව**

1. වාර්ෂික විහිවැඩ චාරිකාව
2. කැළණි විහාරය ආශ්‍රිතව සිදු කළ එක් දින ජායාරූපකරණ වැඩමුළුව

➢ **පර්යේෂණ පත්‍රිකා ඉදිරිපත් කිරීම**

1. ලක්දිව පැරණි සැතපෙන බුදුපිළිම පිළිබඳ පුරාවිද්‍යාත්මක විමර්ශනයක්, බෞද්ධ අධ්‍යයන පිළිබඳ 6 වැනි ජාතික සමුළුව - 2010.12.04 සහ 05

➢ **පැවැත් වූ අභ්‍යන්තර දේශන**

- පුවප්‍ර. 102-පැය-45 (නියමිත දේශන සංඛ්‍යාව පැය 60)
- පුවසා. 301-පැය-40 (එම)
- පුවව-202-පැය-42 (එම)
- පුවව-303-පැය-45 (එම)
- පුවව-401-පැය-25 (නියමිත දේශන සංඛ්‍යාව පැය 30)
- පුවව-402-පැය-08 (නියමිත දේශන සංඛ්‍යාව පැය 15)

❖ **සමන්ත ඉලංගකෝන් මහතා- ආධුනික කථිකාචාර්ය**

➢ **අධ්‍යාපනික**

දර්ශනපති පශ්චාත් උපාධිය සමත් වීම, ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය නිබන්ධන මාතෘකාව චතුෂ්කෝටික තර්කය, භාෂාව හා යථාර්ථය පිළිබඳ දාර්ශනික විවරණයක්

- **සංස්කරණ**

1. බෞද්ධ දර්ශනය අධ්‍යයනය (මහාචාර්ය ඇකිරියගල නන්ද හිමියන්ගේ ශාස්ත්‍රීය ලිපි මාලාවකි)
2. බෞද්ධ සංස්කෘති ලේඛන (මහාචාර්ය ඇකිරියගල නන්ද හිමියන්ගේ ශාස්ත්‍රීය ලිපි මාලාවකි)
3. පාලි භාෂාව හා සාහිත්‍ය අධ්‍යයන (මහාචාර්ය ඇකිරියගල නන්ද හිමියන්ගේ ශාස්ත්‍රීය ලිපි මාලාවකි)

- **ප්‍රකාශන**

- වාද සියය

- **ශාස්ත්‍රීය ලිපි**

- භාෂාව හා තාර්කික චින්තනය පියුම්සරඃ තෙවන කලාපය

- **ආධුනික කථිකාචාර්ය අලුත්ගම විමලරතන හිමි**

- **පර්යේෂණ, විභාග හා පාඨමාලා**

1. කැළණිය විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධි ආයතනය මඟින් පවත්වනු ලබන බෞද්ධ අධ්‍යයන පිළිබඳ ශාස්ත්‍රපති දෑ අවුරුදු පාඨමාලාවේ අධ්‍යයන කටයුතු ආරම්භ කිරීම.
2. කොළඹ විශ්වවිද්‍යාලයේ වෘත්තීය සංවර්ධන ආයතනය (Staff Development Center) මඟින් පවත්වනු ලබන වෘත්තීය සංවර්ධන (CTHE) පාඨමාලාව හදාරමින් සිටී.

- **සම්පත් දායකත්වය**

1. ඒකක ක්‍රමයට අදාළව 2010 වර්ෂයේ බෞද්ධ සංස්කෘතිය විෂය නිර්දේශ සැකසීමට දායක වීම.
2. ඒකක ක්‍රමයට අදාළ විෂය නිර්දේශ ඉංග්‍රීසි බසට පරිවර්තනය කිරීම සඳහා දායකත්වය ලබා දීම.

- **සඟරා ලිපි**

- ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය මඟින් පළ කරනු ලබන බෞද්ධ හා පාලි අධ්‍යයන සඟරාව සඳහා 'කිතු දහම ව්‍යාප්ත කිරීමෙහි ලා ලන්දේසීන් සිය අධ්‍යාපන ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කළ ආකාරය පිළිබඳ විමසුමක් මාතෘකාව යටතේ ශාස්ත්‍රීය ලිපියක් ලබාදීම. (මුද්‍රණයේ)

- ගොඩගේ ප්‍රකාශන ආයතනය මඟින් පළ කළ (මැල්ලව සීලවංශ නාහිමි අභිනන්දන ශාස්ත්‍රීය සංග්‍රහය) "විදර්ශනා" සඳහා ලන්දේසි අධ්‍යාපන ප්‍රතිපත්ති පිළිබඳ විමර්ශනයක් මාතෘකාව යටතේ ලිපියක් ලබාදීම. (2539 පිටු)

- **පුවත්පත් ලිපි**

1. ප්‍රාග් බෞද්ධ සංස්කෘතිය බුදුසමය හා අනුයෝජනය කිරීමේ දී ප්‍රකට වන මිහිඳු හිමියන්ගේ දූරදර්ශී බව යන මැයෙන් 2010 ජුනි මස ලක්බිම පුවත්පතට ලිපියක් සැපයීම.
2. සේව්‍ය සේවක යුතුකම් හා අයිතිවාසිකම් පිළිබඳ බෞද්ධ ආකල්පය මාතෘකාව යටතේ 2010 වර්ෂයේ අගෝස්තු මස ලක්බිම පුවත්පතට ලිපියක් සැපයීම.

## ❖ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය පූජ්‍ය උතුරාවල ධම්මරතන හිමි

### ➢ පර්යේෂණ කෘති

1. සතර සතිපට්ඨාන භාවනා පොත - මුද්‍රණය - 2010
2. බෞද්ධාරක්ෂක ක්‍රම හා විධි ඇතුළත් සෙත් පිරිත් පොත - මුද්‍රණය - 2010
3. පොහොය වත පැරණි ගාථා/පාඨ ඇතුළත් මෙම ග්‍රන්ථය විශේෂයෙන් බෞද්ධ ජනතාවගේ ප්‍රයෝජනය සඳහා අත් පොතකි.

### ➢ පර්යේෂණ ලිපි

- පිළිගත් සඟරා රැසකට හා පුවත්පත් සඳහා පර්යේෂණ ලිපි ලියා පළ කිරීම.

### ➢ දරන ලද වෙනත් තනතුරු

1. 2010 වසර පීඨාධිපති ධූරය - භාෂා අධ්‍යයන අංශය
2. අංශාධිපති (ආවරණ) පාලි අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය
3. අංශාධිපති (ආවරණ) ඉංග්‍රීසි අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය
4. සමායෝජක - දහම් සරසවිය, ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය
5. සමායෝජක - පාලි ඩිප්ලෝමා, ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය
6. සමායෝජක - පාලි ඩිප්ලෝමා, ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය
7. සමායෝජක - චීන භාෂා ඩිප්ලෝමා, ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය
8. චිත්තාභ්‍යාස සංවර්ධන හා පර්යේෂණ මධ්‍යස්ථානයේ මාසිකව - මහජනතාව පර්යේෂණ කටයුතුවල යෙදවීම

## ❖ මහාචාර්ය පූජ්‍ය නෙලුවේ සුමනවංශ හිමි

1. සම්පාදකවරු - ශ්‍රී ඤාණවිමලප්‍රභා 2010, බෙල්ලන්විල රාජමහා විහාරය
2. කඨොපනිෂදාගත දාර්ශනික අදහස්, පිටු 54-60, භාෂා ප්‍රභා 2010 කලාපය, වාර්ෂික ශාස්ත්‍රීය සංග්‍රහය, සුරභාණි සංසදය, ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය

## ❖ මහාචාර්ය ඊ.ඒ. වික්‍රමසිංහ මහතා

- ප්‍රතිභාව හා ලේඛන සොරකම : බෞද්ධ හා පාලි අධ්‍යයන සඟරාව - 2010, ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය

## ❖ සහාය මහාචාර්ය පූජ්‍ය දුනුකේවත්තේ ගුණරතන හිමි

- බෝධි සත්ත්ව සංකල්පය (පන්සිය පනස් ජාතක පොත හා පරිවාර ග්‍රන්ථ ආශ්‍රයෙනි). මෙම තේමාව යටතේ දර්ශනසූරි (Ph.D.) උපාධිය සඳහා පර්යේෂණ වල නිරතව සිටිමි.

## ❖ පූජ්‍ය මාවතගම පේමානන්ද හිමි - ආධුනික කථිකාචාර්ය

1. **<u>ඉන්දු- යුරෝපීය භාෂා පවුල හා එහි ශාඛා</u>**
   මාදන්වල ස්වර්ණ ජයන්ති ශාස්ත්‍රීය සංග්‍රහය 1960-2010, මාදන්වල ශ්‍රී ධර්මෝදය පාරිවේණික ආදිශිෂ්‍ය සංගමය, 2010

**2. සෞත්‍රාන්තිකසමුච්චය**

(සංස්කෘතයෙන්), භාෂාප්‍රභා, 2010 කලාපය, වාර්ෂික ශාස්ත්‍රීය සංග්‍රහය, සුරභාණී සංසදය, සංස්කෘත අංශය, ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය

**3. බුද්ධ ප්‍රතිමා නිර්මාණයෙහි වැදගත්කම**

බුද්ධප්‍රතිමා අසිරිය, සංස්. ඉලුක්කුඹුරේ පුඤ්ඤරතන හිමි, හීරුස්සගල, 2010

4. **පූර්විකාව**,

සසුන්කෙත, උපසම්පදාපේක්ෂක ප්‍රකාශනය, පූජ්‍ය කිරිමැටියේ සද්ධාරතන හිමි, දුම්බර මුද්‍රණාලය, මහනුවර, 2010

**5. සංස්කෘත ව්‍යාකරණ**

සම්මන්ත්‍රණ පත්‍රිකාව, සංස්කෘත භාෂාව පත්‍රය, අපොස උපෙළ විභාගය- 2010 අපොස උපෙළ විභාග සම්මන්ත්‍රණ මාලාව, අස්ගිරිය මහා පිරිවෙන් පරිවේණාධිපති හා ආචාර්ය මණ්ඩලය, අස්ගිරිය මහපිරිවෙන, මහනුවර

**6. සමායෝජක**

භාෂාප්‍රභා, 2010 කලාපය, වාර්ෂික ශාස්ත්‍රීය සංග්‍රහය, සුරභාණී සංසදය, සංස්කෘත අංශය, ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය

## 04. විභාග හා අධ්‍යයන කටයුතු

### I පළමුවන, දෙවන, තෙවන සහ සිවුවන වසරවල සිසුන්ගේ දේශන ආරම්භ කිරීම

2010 අධ්‍යයන වර්ෂයේ ප්‍රථම වාරයේ දේශන 2010.02.11 දින ආරම්භ වී 2010.04.01 දින අවසන් විය. 2010.04.26 දින සිට 2010.07.23 දින දක්වා දෙවන වාරයේ දේශන අවසන් විය. තෙවන වාරයේ දේශන 2010.08.09 දින ආරම්භ වී 2010.10.15 දින අවසන් විය.

2010 අධ්‍යයන වර්ෂයට නවක දේශීය සිසුන් 109 දෙනෙක් ද, විදේශීය සිසුන් 45 දෙනෙක් ද, බඳවා ගන්නා ලදහ. දෙවන වසර දේශීය සිසුන් 101 දෙනෙක් ද, විදේශීය සිසුන් 74 දෙනෙක් ද, තෙවන අධ්‍යයන වසර සඳහා දේශීය සිසුන් 107 දෙනෙක් ද, විදේශීය සිසුන් 61 දෙනෙක් ද, සිවුවන වසර සඳහා දේශීය සිසුන් 45 දෙනෙක් ද, විදේශීය සිසුන් 2 දෙනෙක් ද අධ්‍යයන කටයුතුවල නියැලුණහ.

| ශිෂ්‍ය සංඛ්‍යාව පිළිබඳ සාරාංශය - 2010 | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | පළමු වසර | | දෙවන වසර | | තෙවන වසර | | සිවුවන වසර | |
| | දේශීය | විදේශීය | දේශීය | විදේශීය | දේශීය | විදේශීය | දේශීය | විදේශීය |
| බෞද්ධ අධ්‍යයන පීඨය | 44 | 45 | 43 | 74 | 52 | 61 | 18 | 02 |
| භාෂා අධ්‍යයන පීඨය | 65 | - | 58 | - | 69 | - | 27 | - |
| මුළු ශිෂ්‍ය සංඛ්‍යාව | 109 | 45 | 101 | 74 | 100 | 61 | 45 | 02 |
| | 154 | | 175 | | 164 | | 47 | |
| | 544 | | | | | | | |

### II. බුද්ධධර්ම/පාලි ඩිප්ලෝමා පාඨමාලා

2010 වර්ෂය සඳහා බුද්ධ ධර්ම ඩිප්ලෝමා පාඨමාලාව සඳහා සිසුන් 692 දෙනෙක් ද, පාලි ඩිප්ලෝමා පාඨමාලාව සඳහා සිසුන් 52 දෙනෙක් ද ලියාපදිංචි වූහ. 2010 සැප්තැම්බර් මස පරීක්ෂණය පවත්වා 2010 ඔක්තෝම්බර් මස ප්‍රතිඵල නිකුත් කර ඇත. විස්තර පහත සඳහන් පරිදි ඇත.

| පාඨමාලාව | ලියාපදිංචි සිසුන් සංඛ්‍යාව | විභාගයට පෙනී සිටි සංඛ්‍යාව | සමත් ශිෂ්‍ය සංඛ්‍යාව |
|---|---|---|---|
| බුද්ධධර්ම ඩිප්ලෝමාව | | | |
| - මැලේසියාව | 22 | 10 | 08 |
| - සිංගප්පූරුව | 67 | 22 | 17 |
| - දේශීය | 603 | 381 | 250 |
| පාලි ඩිප්ලෝමාව | 52 | 28 | 21 |
| සංස්කෘත ඩිප්ලෝමාව | 11 | 05 | 03 |

## III විදේශ ධර්මදූත සේවා උපාධි පාඨමාලාව (දෑ අවුරුදු පාඨමාලාව)

2010 වර්ෂයේ මෙම පාඨමාලාව නොපවත්වන ලදී.

## IV ඉංග්‍රීසි ඩිප්ලෝමා පාඨමාලාව

| පාඨමාලාව | ලියාපදිංචි සිසුන් සංඛ්‍යාව | විභාගයට පෙනී සිටි සංඛ්‍යාව | සමත් ශිෂ්‍ය සංඛ්‍යාව |
|---|---|---|---|
| මූලික පාඨමාලාව | 56 | 28 | 24 |
| සහතික පත්‍ර පාඨමාලාව | 37 | 27 | 27 |
| ඩිප්ලෝමා පාඨමාලාව | 136 | 83 | 69 |

## V දහම් සරසවිය බුද්ධධර්ම ඩිප්ලෝමා පාඨමාලාව 2010/2011

2010 වසරේ දී බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුවේ අනුග්‍රහය මත මෙම විශ්වවිද්‍යාලය මඟින් ලංකාවේ දහම් පාසැල් ගුරුවරුන් සඳහා දහම් සරසවිය බුද්ධධර්ම ඩිප්ලෝමා පරීක්ෂණය සඳහා සිසුන් 2525 ලියාපදිංචි කර ගන්නා ලදී. 2011 ඔක්තොම්බර් මස පරීක්ෂණය පවත්වා දෙසැම්බර් මස ප්‍රතිඵල නිකුත් කිරීමට සැළසුම් කර ඇත.

## VI සාමාන්‍ය ශාස්ත්‍රවේදි (බාහිර) පරීක්ෂණය

2010 වර්ෂයේ සාමාන්‍ය ශාස්ත්‍රවේදී (බාහිර) උපාධි පාඨමාලාව සඳහා නවක සිසුන් 1158 දෙනෙකු ලියාපදිංචි වූ අතර, ප්‍රථම භාග හා ද්විතීය භාග පරීක්ෂණ 2010 සැප්තැම්බර්/ඔක්තොම්බර් මාසවල පවත්වන ලදී. විභාග ප්‍රතිඵල 2011 වර්ෂයේ මාර්තු මස 31 දින නිකුත් කිරීමට නියමිතව ඇත.

## VII සාමාන්‍ය/විශේෂ ශාස්ත්‍රවේදි උපාධි පාඨමාලා (අභ්‍යන්තර)

උක්ත පරීක්ෂණ 2010 වර්ෂයේ නොවැම්බර්/දෙසැම්බර් මාසවල දී පවත්වන ලදී.

**පරීක්ෂණයේ නම ඃ-**

- ප්‍රථම ශාස්ත්‍ර පරීක්ෂණය
- සාමාන්‍ය ශාස්ත්‍රවේදී ප්‍රථම භාග පරීක්ෂණය
- සාමාන්‍ය ශාස්ත්‍රවේදී ද්වීතිය භාග පරීක්ෂණය
- විශේෂ ශාස්ත්‍රවේදී ප්‍රථම භාග පරීක්ෂණය
- විශේෂ ශාස්ත්‍රවේදී ද්වීතීය භාග පරීක්ෂණය
- විශේෂ ශාස්ත්‍රවේදී තෘතීය භාග පරීක්ෂණය

මෙම වර්ෂයේ අභ්‍යන්තර පරීක්ෂණ වලට පෙනී සිටි සිසුන්ගේ උත්තර පත්‍ර පරීක්ෂාවට ලක් වෙමින් පැවතීම නිසා ප්‍රතිඵල ඉදිරියේ දී නිකුත් කිරීමට නියමිතය.

විශේෂ ශාස්ත්‍රවේදී උපාධි පාඨමාලා (අභ්‍යන්තර) සඳහා ලියාපදිංචි වූ සිසුන්ගේ පහත පරීක්ෂණ 2010 නොවැම්බර්/දෙසැම්බර් මාස වලදී පවත්වන ලදී.

**පරීක්ෂණයේ නම ඃ-**

- විශේෂ ශාස්ත්‍රවේදී ප්‍රථම භාග පරීක්ෂණය (බෞද්ධ දර්ශනය)
- විශේෂ ශාස්ත්‍රවේදී ප්‍රථම භාග පරීක්ෂණය (බෞද්ධ සංස්කෘතිය)
- විශේෂ ශාස්ත්‍රවේදී ප්‍රථම භාග පරීක්ෂණය (පාලි )
- විශේෂ ශාස්ත්‍රවේදී ප්‍රථම භාග පරීක්ෂණය (පුරාවිද්‍යාව)
- විශේෂ ශාස්ත්‍රවේදී ද්විතීය භාග පරීක්ෂණය (බෞද්ධ දර්ශනය)
- විශේෂ ශාස්ත්‍රවේදී ද්විතීය භාග පරීක්ෂණය (බෞද්ධ සංස්කෘතිය)
- විශේෂ ශාස්ත්‍රවේදී ද්විතීය භාග පරීක්ෂණය (පාලි )
- විශේෂ ශාස්ත්‍රවේදී ද්විතීය භාග පරීක්ෂණය (පුරාවිද්‍යාව)
- විශේෂ ශාස්ත්‍රවේදී ද්විතීය භාග පරීක්ෂණය (සංස්කෘත)
- විශේෂ ශාස්ත්‍රවේදී තෘතිය භාග පරීක්ෂණය (බෞද්ධ දර්ශනය)
- විශේෂ ශාස්ත්‍රවේදී තෘතිය භාග පරීක්ෂණය (බෞද්ධ සංස්කෘතිය)
- විශේෂ ශාස්ත්‍රවේදී තෘතිය භාග පරීක්ෂණය (පාලි )

ඉහත සඳහන් පරීක්ෂණවල උත්තර පත්‍ර දැනට පරික්ෂාවට යොමු කර ඇත. ඉදිරියේදී නිකුත් කිරීමට නියමිත ය.

2010 නොවැම්බර්/දෙසැම්බර් මාස වලදී පවත්වන ලද ශාස්ත්‍රවේදී උපාධි පාඨමාලා (අභ්‍යන්තර) පරීක්ෂණවල දී පාඨමාලා සඳහා පෙනී සිටි සිසුන් පහත සඳහන් පරිදි වේ.

| | පාඨමාලාව | 2010 වර්ෂයේ පෙනී සිටි සිසුන් සංඛ්‍යාව |
|---|---|---|
| 01 | පරිගණක සහතිකපත්‍ර පාඨමාලාව | 56 |
| 02 | ජපන් සහතික පත්‍ර පාඨමාලාව | 02 |
| 03 | හින්දි සහතික පත්‍ර පාඨමාලාව | 07 |
| 04 | චීන සහතික පත්‍ර පාඨමාලාව | 02 |
| 05 | කොරියන් සහතික පත්‍ර පාඨමාලාව | 02 |
| 06 | දෙමළ සහතික පත්‍ර පාඨමාලාව | 43 |
| 07 | බෞද්ධ උපදේශනය | 153 |
| 08 | ඉංග්‍රීසි සහතික පත්‍ර පාඨමාලාව | 27 |
| 09 | උසස් ඉංග්‍රීසි පාඨමාලාව | 144 |

## VIII. බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව

2010 වර්ෂයේ බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි පාඨමාලාව සඳහා සිසුන් 19 දෙනෙකු ලියාපදිංචි වූ අතර, පරීක්ෂණය 2010 දෙසැම්බර් මස පවත්වන ලදී. විභාග ප්‍රතිඵල 2011 මාර්තු මස නිකුත් කිරීමට නියමිතව ඇත.

## IX ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව

2010 වර්ෂයේ ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව සඳහා සිසුන් 221 දෙනෙකු ලියාපදිංචි කර ගත් අතර, එම දේශන 2010.02.21 දින ආරම්භ කරන ලදී. 2010 දෙසැම්බර් මස ශාස්ත්‍රපති උපාධි පරීක්ෂණය පවත්වා, ප්‍රතිඵල 2011 මාර්තු මස නිකුත් කිරීමට නියමිතව ඇත.

- ශාස්ත්‍රපති උපාධි පරීක්ෂණය සඳහා පහත දැක්වෙන පරිදි ලියාපදිංචි වී ඇත.

| පාඨමාලාව | සංඛ්‍යාව |
|---|---|
| බෞද්ධ අධ්‍යයන පාඨමාලාව (සිංහල මාධ්‍යය) | 84 |
| බෞද්ධ අධ්‍යයන පාඨමාලාව (ඉංග්‍රීසි මාධ්‍යය) | 83 |
| සිංහල භාෂා අධ්‍යයන පාඨමාලාව | 40 |
| පාලි භාෂා අධ්‍යයන පාඨමාලාව | 09 |
| සංස්කෘත භාෂා අධ්‍යයන පාඨමාලාව | 05 |

X **පර්යේෂණ උපාධි පාඨමාලා (දර්ශනපති/දර්ශනශූරී)**

2010 වර්ෂය සඳහා දර්ශනපති උපාධිය සඳහා සිසුන් 13 දෙනෙකු ද දර්ශනශූරී (ආචාර්ය) උපාධිය සඳහා සිසුන් 09 දෙනෙකු ද ලියාපදිංචි වී ඇත.

XI **උපාධි ප්‍රදානෝත්සවය**

වර්ෂ දෙකකට වරක් පවත්වනු ලබන උපාධි ප්‍රදානෝත්සවය 2011 ජුනි 10 වන දින බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ දී පැවැත්වීමට නියමිතව ඇත.

## 05. ත්‍යාග හා ශිෂ්‍යත්ව

ශිෂ්‍යත්ව නිර්ණායකයන්ට අනුව පහත සඳහන් ශිෂ්‍යත්ව හිමිකම් ලබන සංඛ්‍යාව ඉදිරිපත් කර ඇත.

| | ශිෂ්‍යත්ව ත්‍යාගයේ නම | සංඛ්‍යාව |
|---|---|---|
| 01 | මහෝපාධ්‍යාය ත්‍යාගය | 01 |
| 02 | එච්.එම්. තිසේරා අනුස්මරණ ත්‍යාගය | 02 |
| 03 | පී. සුබසිංහ ත්‍යාගය | 01 |
| 04 | කළුකොඳයාවේ ශ්‍රී ප්‍රඥාශේඛර නාහිමි ත්‍යාගය | 01 |
| 05 | පිඹුරේ ශ්‍රී වාගිශ්වර මහ නාහිමි ත්‍යාගය | 01 |
| 06 | මියුලින් ලියනගේ අනුස්මරණ ත්‍යාගය | 01 |
| 07 | අතිපූජ්‍ය සිරිමල්වත්තේ ආනන්ද නාහිමි ත්‍යාගය | 02 |
| 08 | කොරියන් ජාතික හේ ජෝන් ස්වාමීන්ද්‍ර ශිෂ්‍යත්වය | 03 |
| 09 | බදුරලියේ ජිනාරාම ත්‍යාගය | 01 |
| 10 | හීනටියන ධම්මාලෝක ත්‍යාගය | 01 |
| 11 | කුඹුකේ දොන් සානිස් අප්පුහාමි සහ වන්නිආරච්චිලාගේ ජොස්තිනා ෆොන්සේකා අනුස්මරණ ත්‍යාගය | 01 |
| 12 | ගාමිණී ජයසූරිය පාලි ශිෂ්‍යත්වය | 03 |
| 13 | එන්. සොමිලාවතී බොල්ගොඩපිටිය අනුස්මරණ ශිෂ්‍යත්ව ත්‍යාගය | 02 |
| 14 | ශ්‍රීමත් සිරිල් ද සොයිසා අනුස්මරණ ශිෂ්‍යත්ව ත්‍යාගය | 02 |
| 15 | ප්‍රැන්සිස් හේවාවිදාන ත්‍යාගය | 03 |
| 16 | ආචාර්ය පූජ්‍ය තුඹුල්ලේ සීලක්ඛන්ධ නාහිමි ත්‍යාගය | 01 |
| 17 | Ven. Thich Thien Son අභිනන්දන පාලි ත්‍යාගය | 01 |
| 18 | මහාචාර්ය ඔලිවර් අබේනායක ත්‍යාගය (නිර්නායක අනුව 2012 ශිෂ්‍යත්ව පිරිනැමීමට හිමිකම් ලබයි) | 01 |
| 19 | වැරැල්ලානේ විමලතිස්ස නාහිමි අනුස්මරණ ත්‍යාගය | 01 |
| 20 | අලුදෙණියේ පඤ්ඤානන්ද මාහිමි අනුස්මරණ පාලි ව්‍යාකරණ ත්‍යාගය | 02 |
| 21 | විතාරන්දෙණියේ චන්ද්‍රජෝති නාහිමි අනුස්මරණ ත්‍යාගය | 03 |
| 22 | මහාචාර්ය මොරටුවේ සාසනරතන අනුනාහිමි සංස්කෘත ත්‍යාගය | 01 |
| 23 | පූජ්‍ය බානගල උපතිස්ස නා හිමි ත්‍යාගය | 01 |

## 06. පුස්තකාල පහසුකම්

**කාර්ය මණ්ඩල සංයුතිය**

පුස්තකාලයාධිකාරී - 01
මාණ්ඩලික සහකාර (පුස්තකාල සේවා) - 02
පුස්තකාල සහකාර - 01
පුස්තකාල සහකාර (තාවකාලික) - 01
පුස්තකාල සහායක - 01
යන්ත්‍ර ක්‍රියාකරු - 01
කම්කරු - 02

**පරිහරණය කළ පාඨක සංඛ්‍යාව**

| | | |
|---|---|---|
| උපාධි අපේක්ෂකයන් (ශාස්ත්‍රවේදී) | - | 468 |
| ආචාර්ය මණ්ඩලය | - | 34 |
| අනධ්‍යයන කාර්ය මණ්ඩලය | - | 115 |
| පර්යේෂකයන් | - | 25 |

**වර්ෂය තුළදී අත්කරගත් ප්‍රතිග්‍රහණ**

| | | |
|---|---|---|
| මිළදීගත් පොත් සංඛ්‍යාව | - | 3233 |
| පොත් මිළදී ගැනීමට වැයවූ මුදල | - | රු. 1073909.24 |
| පරිත්‍යාග වශයෙන් ලැබුණු පොත්/සඟරා ගණන | - | 928 |
| පරිත්‍යාගවල වටිනාකම | - | රු. 175083.15 |

**2010 වර්ෂය සඳහා දායකත්වය ලබාගත් සඟරා**

ටයිම් සඟරාව සඳහා 2010 ජුලි මාසයේ සිට 2011 ජුලි මාසය දක්වා වර්ෂයක කාලයක් සඳහා දායක මුදල් ගෙවා ඇත.

දායක මුදල - රු. 10206.00

# 07. පරිපාලන කාර්ය මණ්ඩලය

1. මහාචාර්ය පූජ්‍ය ඉත්තදෙමලියේ ඉන්දසර ස්ථවිර - මහෝපාධ්‍යායයන් වහන්සේ
2. ආර්.ඒ. පියරත්න මහතා - ලේඛකාධිකාරී
3. ජී. ජයතිස්ස මහතා - නියෝජ්‍ය ලේඛකාධිකාරී
   (2009.07.01 දින සිට නිවාඩු - වසරක් සඳහා සප්ත වාර්ෂික නිවාඩු ලබමින් සිටි)
4. ඊ.ඒ. ගුණසේන මහතා - ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී
5. එච්.ඩී.ආර්. කරුණාරත්න මහතා - සහකාර ලේඛකාධිකාරී
6. එම්.ජී.එච්. මුණසිංහ මහතා - වැඩ බලන වැඩ ඉංජිනේරු
7. එච්.ඒ.පී.පී. කරුණාරත්න මිය - සහකාර මූල්‍යාධිකාරී
8. එන්.ඒ.එස්.කේ. ප්‍රේමචන්ද්‍ර මහතා - සහකාර ලේඛකාධිකාරී
9. පූජ්‍ය බී. ධීරානන්ද හිමි - සහකාර ලේඛකාධිකාරී
   (2009.08.24 දින සිට)

**සහාය පරිපාලන කාර්ය මණ්ඩලය**

1. පූජ්‍ය එන්. යෝගානන්ද හිමි - උපනේවාසිකාගාර පාලක
2. ගාමිණී සමරප්පුලිගේ මහතා - උපනේවාසිකාගාර පාලක

2010 වර්ෂය තුළ කරන ලද බඳවා ගැනීම්, ස්ථිර කිරීම්, සේවයෙන් ඉල්ලා අස්වීම්, විශ්‍රාම ගැනීම, ප්‍රසූත නිවාඩු, වැටුප් රහිත නිවාඩු ගැනීම්, සේවය අත්හිටුවීම් හා පරිවාස කාලය දීර්ඝ කිරීම් පිළිබඳ සංඛ්‍යා ලේඛන පහත දැක්වේ.

**බඳවා ගැනීම්**

| | නම | තනතුර | දිනය |
|---|---|---|---|
| 01. | එම්.එම්.සී.එච්. කුසුමලතා මෙය. | දුරකථන ක්‍රියාකාරිනී පිළිගැනීමේ නිලධාරිනී/ (II ශ්‍රේණිය) | 2010.05.03 |
| 02. | ප්‍රදීප් ප්‍රියංකර කුමාරගේ මහතා | කම්කරු (III ශ්‍රේණිය) | 2010.06.01 |

| | | | |
|---|---|---|---|
| 03. | ආර්.ඩී.එස්. ගලගෙදර මහතා | කම්කරු (III ශ්‍රේණිය) | 2010.06.01 |
| 04. | එච්.පී. වීරසිංහ මිය | සහකාර අභ්‍යන්තර විගණක | 2010.06.01 |

**<u>ස්ථිර කිරීම්</u>**

2010 වර්ෂය තුළ සේවයේ ස්ථිර කිරීම් කිසිවක් නොවී ය.

**<u>සේවයෙන් ඉල්ලා අස්වීම</u>**

| | නම | තනතුර | දිනය |
|---|---|---|---|
| 01. | වයි. අමිත ගුණසිරි මහතා | පුස්තකාල සහායක (II ශ්‍රේණිය) | 2010.01.31 |

**<u>විශ්‍රාම ගැනීම</u>**

2010 වර්ෂය තුළ කිසිවෙකුගේ සේවයෙන් විශ්‍රාම ගැනීමක් නොවී ය.

**<u>සේවයෙන් මුදා හැරීම</u>**

2010 වර්ෂය තුළ කිසිවෙකුගේ සේවයෙන් මුදා හැරීමක් නොවී ය.

**<u>ප්‍රසූත නිවාඩු</u>**

| | | | |
|---|---|---|---|
| 01. | එච්.පී.ඩබ්.ඩී. රමේෂා මිය | යතුරු ලේඛිකා (III ශ්‍රේණිය) | 2010.10.04 දින සිට 2011.02.07 දක්වා |
| 02. | එච්.ජී.පී.පී. කරුණාරත්න මිය | සහකාර මූල්‍යාධිකාරී | 2010.10.29 දින සිට 2011.03.08 දක්වා |
| 03. | එච්.අයි.පී.කේ. දිසානායක මිය | ලිපිකරු(III ශ්‍රේණිය) | 2010.11.20 දින සිට 2011.03.25 දක්වා |

**<u>වැටුප් රහිත නිවාඩු</u>**

2010 වර්ෂය තුළ කිසිවෙකු වැටුප් රහිත නිවාඩු ලබා නොමැත.

**<u>සේවයෙන් ඉවත් කිරීම</u>**

2010 වර්ෂය තුළ කිසිවෙකු සේවයෙන් ඉවත් කිරීමක් නොවී ය.

**<u>පරිවාස කාලය දීර්ඝ කිරීම</u>**

2010 වර්ෂය තුළ කිසිවෙකුගේ පරිවාස කාලය දීර්ඝ කිරීමක් නොවී ය.

**<u>2010 වර්ෂය තුළ උසස්වීම්</u>**

- **අධ්‍යයන කාර්ය මණ්ඩලය**

01.සහාය මහාචාර්ය ඊ.ඒ. වික්‍රමසිංහ මහතා - මහාචාර්ය 2009.10.02
2010.04.20 දින පැවති සම්මුඛ පරීක්ෂණයට අනුව

02.ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය පූජ්‍ය වාච්චේ ධම්මරක්ඛිත හිමි - මහාචාර්ය 2009.10.07
2010.07.22 දින පැවති සම්මුඛ පරීක්ෂණයට අනුව

03.මහාචාර්ය පූජ්‍ය උතුරාවල ධම්මරතන හිමි - ජ්‍යෙෂ්ඨ මහාචාර්ය 2009.05.29
2010.02.12 දින පැවති සම්මුඛ පරීක්ෂණයට අනුව

04.ආචාර්ය පූජ්‍ය නෙලුවේ සුමනවංශ හිමි - මහාචාර්ය 2009.07.14
2010.08.26 දින පැවති සම්මුඛ පරීක්ෂණයට අනුව

05.ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය පූජ්‍ය දුනුකේවත්තේ ගුණරතන හිමි - සහාය මහාචාර්ය 2009.10.23 2010.08.26 දින පැවති සම්මුඛ පරීක්ෂණයට අනුව

06.පූජ්‍ය පිටිගල විජිත හිමි - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය - 2008.04.11 දින සිට බල පැවැත්වෙන පරිදි

07.එම්.ජී.සී. මුණසිංහ මහත්මිය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය - 2007.12.28 දින සිට බල පැවැත්වෙන පරිදි

## උසස්වීම්

- චන්ද්‍රා කරුණාරත්න මහත්මිය - පුස්තකාලයාධිකාරී - 2010.05.03 ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිකාරිනී

## සේවයෙන් නිදහස් කිරීම්

- පූජ්‍ය මැදගොඩ අභයතිස්ස හිමි කථිකාචාර්ය 2010.08.04

## අනධ්‍යයන කාර්ය මණ්ඩලය

මෙම වර්ෂය තුළ අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ පහත සඳහන් අය උසස්වීම් ලබන ලදී.

| | | | |
|---|---|---|---|
| 01. | යු.ඩබ්.එල්. කුමාරි මිය | මාණ්ඩලික සහකාර පුස්තකාල සහකාර | 2009.01.01 |
| 02. | පූජ්‍ය නක්කල්ගොඩ යෝගානන්ද හිමි | උපනේවාසිකාගාර පාලක (I ශ්‍රේණිය) | 2005.09.07 |
| 03. | ගාමිණී සමරප්පුලිගේ මහතා | උපනේවාසිකාගාර පාලක (I ශ්‍රේණිය) | 200 .04.16 |
| 04. | කේ.ජී.ප්‍රියන්ත ගාමිණී මහතා | ලිපිකරු I ශ්‍රේණිය | 2008.10.02 |
| 05. | ඩී.එම්. සූරියආරච්චි මිය | ලිපිකරු I ශ්‍රේණිය | 2009.07.01 |
| 06. | කේ.ජී. ලතා ශ්‍රියානි මිය | ලිපිකරු I ශ්‍රේණිය | 2009.07.01 |
| 07. | ඩබ්.ජී.එම්.එස්. ජයන්ත මයා | බයිසිකල් පණිවිඩකරු(ඉහළ ශ්‍රේණිය) | 2009.12.03 |

## සප්ත වාර්ෂික නිවාඩු

01. මහාචාර්ය පූජ්‍ය වැගම පියරතන හිමි - 2009.02.01 දින සිට 2011.02.01 දින දක්වා
02. මහාචාර්ය පූජ්‍ය ඇකිරියගල නන්ද හිමි- 2009.06.15 දින සිට 2011.01.17 දින දක්වා
03. මහාචාර්ය පූජ්‍ය ගල්ලැල්ලේ සුමනසිරි හිමි - 2010.07.22 දින සිට 2011.04.11 දින දක්වා

## අධ්‍යයන නිවාඩු - දේශීය

01. පූජ්‍ය දුනුකේවත්තේ ගුණරතන හිමි (ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය) - 2009.05.07 දින සිට 2011.05.07 දින දක්වා වර්ෂයක් සඳහා

02. කේ.ජී. ස්වර්ණානන්ද මහතා - 2010.01.01 දින සිට 2010.06.14 දින දක්වා

## විදේශීය

01. පූජ්‍ය මොරගොල්ලාගම උපරතන හිමි - 2007.09.01දින සිට 2011.06.01 දින දක්වා වර්ෂ 3 මාස 9 යි

## විදේශ ගත වීම්

01. මහාචාර්ය පූජ්‍ය ඉත්තදෙමලියේ ඉන්දසර හිමි (මහෝපාධ්‍යායයන් වහන්සේ) 2010.03.11 - 2010.03.17 දින දක්වා
(හොංකොං හි පැවැත්වෙන ලෝක මහා බෞද්ධ සම්මේලනයට සහභාගී වීම සඳහා)

02. මහාචාර්ය පූජ්‍ය ඉත්තදෙමලියේ ඉන්දසර හිමි (මහෝපාධ්‍යායයන් වහන්සේ) 2010.03.25 - 2010.04.01 දින දක්වා
(සිංගප්පූරුවේ පිහිටි මෙම විශ්වවිද්‍යාලයේ අනුබද්ධායතනයේ පැවැත්වෙන උත්සවයකට සහභාගී වීම සඳහා)

03. මහාචාර්ය පූජ්‍ය ඉත්තදෙමලියේ ඉන්දසර හිමි (මහෝපාධ්‍යායයන් වහන්සේ) 2010.04.25 - 2010.04.27 දින දක්වා
(පොදු රාජ්‍ය මණ්ඩලයීය විශ්වවිද්‍යාල සංගමය විසින් දකුණු අප්‍රිකාවේ කේප්ටවුන්හි එහි සාමාජිකත්වය දරණ විධායක ප්‍රධානීන්ගේ සම්මන්ත්‍රණයට සහභාගී වීම සඳහා)

04. මහාචාර්ය පූජ්‍ය ඉත්තදෙමලියේ ඉන්දසර හිමි (මහෝපාධ්‍යායයන් වහන්සේ) 2010.05.22 - 2010.05.26 දින දක්වා
(තායිලන්තයේ ජාත්‍යන්තර බෞද්ධ විශ්වවිද්‍යාල සංගමයේ (IABU) හි පැවැත්වෙන වෙසක් උත්සවයකට සහභාගී වීම සඳහා)

05. මහාචාර්ය පූජ්‍ය ගල්ලෑල්ලේ සුමනසිරි හිමි 2010.05.21 - 2010.05.27 දින දක්වා
(තායිලන්තයේ පැවැත්වෙන එක්සත් ජාතීන්ගේ වෙසක් දින සමරු වැඩසටහනට සහභාගී වීම සඳහා)

06. මහාචාර්ය පූජ්‍ය ගල්ලෑල්ලේ සුමනසිරි හිමි 2010.07.30 - 2011.01.15 දින දක්වා
(නැගෙනහිර ලන්ඩන් බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානයේ ආගමික වැඩ සටහනකට සහභාගී වීම සඳහා)

07. මහාචාර්ය පූජ්‍ය ඉත්තදෙමලියේ ඉන්දසර හිමි (මහෝපාධ්‍යායයන් වහන්සේ) 2010.07.13 - 2010.07.16 දින දක්වා
(ඉන්දියාවේ අර්ෂ විද්‍යා ගුරුකුලම්හි සම්මන්ත්‍රණයකට සහභාගී වීම සඳහා)

08. මහාචාර්ය පූජ්‍ය ඇකිරියගල නන්ද හිමි 2010.12.08 - 2010.12.20 දින දක්වා
(පර්යේෂණ කටයුත්තක් සඳහා මියන්මාරයේ අධ්‍යයන චාරිකාවකට සහභාගී වීම සඳහා)

09. ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය පූජ්‍ය පිටිගල විජිත හිමි 2010.09.15 - 2010.09.22 දින දක්වා
(සිංගප්පූරුවේ පිහිටි මෙම විශ්වවිද්‍යාලයේ අනුබද්ධායතනයේ විභාග ශාලාධිපති රාජකාරි සඳහා සහභාගී වීම)

10. ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය පූජ්‍ය දුනුකේවත්තේ ගුණරතන හිමි 2010.09.15 - 2010.09.22 දින දක්වා
(මැලේසියාවේ පිහිටි මෙම විශ්වවිද්‍යාලයේ අනුබද්ධායතනයේ විභාග ශාලාධිපති රාජකාරි සඳහා සහභාගී වීම)

11. මහාචාර්ය පූජ්‍ය ඉත්තදෙමලියේ ඉන්දසර හිමි (මහෝපාධ්‍යායයන් වහන්සේ) 2010.09.29 - 2010.10.01 දින දක්වා
(තායිලන්තයේ ථේරවාද බෞද්ධ විශ්වවිද්‍යාල සංගමයේ (ATBU) හි සම්මන්ත්‍රණයකට සහභාගී වීම සඳහා)

12. මහාචාර්ය පූජ්‍ය ඉත්තදෙමලියේ ඉන්දසර හිමි (මහෝපාධ්‍යායයන් වහන්සේ) 2010.10.19 - 2010.11.05 දින දක්වා (ඔස්ට්‍රියාවේ පිහිටි මෙම විශ්වවිද්‍යාලයේ අනුබද්ධායතනය විවෘත කිරීමේ උත්සවයකට සහභාගී වීම සඳහා)

**<u>පත් කිරීම්</u>**

### ❖ අධ්‍යයන කාර්ය මණ්ඩලය

01. කේ.ජී. ස්වර්ණානන්ද මහතා - ආධුනික කථිකාචාර්ය - 2010.05.03
ඉංග්‍රීසි උපදේශක I ශ්‍රේණිය

02. ආර්.කේ.ජී.එන්. රත්නසිරි මහතා - ආධුනික කථිකාචාර්ය - 2010.05.03
ඉංග්‍රීසි උපදේශක I ශ්‍රේණිය

03. එම්.එච්.පී.කේ. ගුණසේන මහතා - ආධුනික කථිකාචාර්ය - 2010.05.03
ඉංග්‍රීසි උපදේශක II ශ්‍රේණිය

04. පූජ්‍ය අලුත්ගම විමලරතන හිමි - ආධුනික කථිකාචාර්ය - 2010.02.01

### ❖ පරිපාලන කාර්ය මණ්ඩලය

| | | |
|---|---|---|
| 01. | ඩී.සී. රණතුංග මහත්මිය | වැඩ බලන මූල්‍යාධිකාරී (2010.05.08 දින සිට 2010.12.31 දක්වා) |
| 02. | පූජ්‍ය බෝගමුවේ ධීරානන්ද හිමි | සහකාර ලේඛකාධිකාරී 2010.08.03 - 2011.08.02 දින දක්වා අවුරුදු 1 කට |
| 03. | එච්.ජී.එච්. මුණසිංහ මහතා | වැඩ බලන වැඩ ඉංජිනේරු 2010.11.16 දින සිට මාස 3 කට |

### ❖ අනධ්‍යයන තාවකාලික කාර්ය මණ්ඩලය

| | | |
|---|---|---|
| 01. | ජේ.එම්. ගයානි උදේශිකා මෙනවිය | ලිපිකරු (III ශ්‍රේණිය) 2010.11.08 සිට මාස 03 කට |
| 02. | පී.නුවන් සමරසිංහ මහතා | කම්කරු (III ශ්‍රේණිය) 2010.11.08 |
| 03. | පී.ආර්.සී.එස්. ජයසුන්දර මහතා | ලිපිකරු (III ශ්‍රේණිය) 2010.11.15 දින සිට මාස 03 කට |
| 04. | එන්.එච්.ඩී. නිරෝෂනී කාන්ති මෙනවිය | ලිපිකරු (III ශ්‍රේණිය) 2010.08.11 දින සිට මාස 03 |
| 05. | එල්.එච්.වයි. වසන්ති මෙනවිය | ලිපිකරු (III ශ්‍රේණිය) 2010.11.08 දින සිට මාස 06 කට |

06. ඩබ්.ඒ. අනුරාධා නදීෂා වේරගල මෙනවිය ලිපිකරු (III ශ්‍රේණිය) 2010.11.08 දින සිට මාස 06 කට

07. බී.කේ. පුලස්තික සම්පත් ජිනදාස මහතා පුස්තකාල සහකාර (III ශ්‍රේණිය) 2010.06.01 දින සිට මාස 06 කට

08. ජේ.එච්.ඒ.රොෂානි චමින්දිකා ජයසිංහ මෙනවිය පරිගණක යෙදුම් සහකාර (III ශ්‍රේණිය) 2010.06.01 දින සිට මාස 06

09. එච්.කේ. අනුරාධ චතුරංග මහතා පරිගණක යෙදුම් සහකාර (III ශ්‍රේණිය) 2010.06.01 දින සිට මාස 06 කට

10. එම්.ජී. අමරසිංහ මහතා කම්කරු (III ශ්‍රේණිය) 2010.06.01 දින සිට මාස 06 කට

11. එම්.කේ. තනුජා කුෂාන්ති මෙනවිය ලිපිකරු (III ශ්‍රේණිය)

12. වයි.එච්. ශ්‍යාමලි ප්‍රියංගිකා අරුණකාන්ති මෙනවිය 2010.06.01 දින සිට මාස 6 කට

13. එම්.එම්. දිලංකා මුණසිංහ මැණිකේ මෙනවිය ලිපිකරු (III ශ්‍රේණිය) 2010.04.26 දින සිට මාස 6 කට

**<u>පීඨ පත්වීම්</u>**

2010 වසර තුළ පීඨ පත්වීම් කිසිවක් නොවී ය.

## තාවකාලික පදනම මත අධ්‍යයන කාර්ය මණ්ඩලයට බඳවා ගැනීම්

- **භාෂා අධ්‍යයන පීඨය**

| අධ්‍යයනාංශය (විෂය) | කථිකාචාර්යවරු සංඛ්‍යාව |
|---|---|
| පාලි | 02 |
| සිංහල | 01 |
| සංස්කෘත | 01 |
| ඉංග්‍රීසි | 01 |

- **බෞද්ධ අධ්‍යයන පීඨය**

| අධ්‍යයනාංශය (විෂය) | කථිකාචාර්යවරු සංඛ්‍යාව |
|---|---|
| බෞද්ධ සංස්කෘතිය | 02 |
| බෞද්ධ දර්ශනය | 02 |
| සමය අධ්‍යයනය හා තුලනාත්මක දර්ශනය | 01 |
| පුරාවිද්‍යාව | 01 |
| බෞද්ධ උපදේශනය | 01 |

# 08. කාර්ය මණ්ඩල පුහුණු

- **අධ්‍යයන කාර්ය මණ්ඩල වෘත්තීය වැඩමුළු**

2010 වර්ෂයේ අධ්‍යයන කාර්ය මණ්ඩල වෘත්තීය සංවර්ධන වැඩ මුළු 09ක් පවත්වා ඇත.

| වැඩ මුළු අංකය | දිනය | විශේෂ සම්පත් දායකත්වය | තේමාව |
|---|---|---|---|
| 46 | 2010.01.13 | බෞද්ධ දර්ශනය අධ්‍යයනාංශාධිපති ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය පූජ්‍ය පිටිගල විජිත හිමි | මුල් බුදු සමයේ ප්‍රාමාණිකත්වය පිළිබඳ විමසීමක් |
| 47 | 2010.03.10 | ඉංග්‍රීසි ඒකකය, ආධුනික කථිකාචාර්ය ආර්.කේ.ඒ.එන්. රත්නසිරි මහතා | ඇන්ටන් චෙකෝෆ්ගේ 'පරස්තාව' නාට්‍යය 'ඊඩිපස් රජු' නාට්‍යයෙහි හුදු අනුකරණයක්ද? |
| 48 | 2010.05.12 | පූජ්‍ය ලෙනගල සිරිනිවාස හිමි | බෞද්ධ තර්ක ශාස්ත්‍රයේ නිර්විකල්පක ප්‍රත්‍යක්ෂයට හිමි තැන |
| 49 | 2010.06.09 | තාවකාලික කථිකාචාර්ය ජයන්ත බෝගොඩ මහතා | බුද්ධි ඵලය, චිත්ත ඵලය හා චිත්ත වේග කළමනාකරණය |
| 50 | 2010.07.14 | තාවකාලික කථිකාචාර්ය එච්.ඩබ්.බී.අයි. සම්පත් මහතා | ළමයාගේ පෞරුෂය වර්ධනය කෙරෙහි ළමා සාහිත්‍ය යොදා ගත හැක්කේ කෙසේද? |
| 51 | 2010.08.18 | තාවකාලික කථිකාචාර්ය පූජ්‍ය ගෝනදෙණියේ පඤ්ඤාරතන හිමි | පඤ්චස්කන්ධයේ පැවැත්ම හා නැවැත්ම පිළිබඳ ධර්මානුකූල විග්‍රහයක් |
| 52 | 2010.09.15 | තාවකාලික කථිකාචාර්ය වරුණි තෙන්නකෝන් මිය | English Language Learning behavior of the Buddhist clergy graduands of Buddhist and Pali University of Sri Lanka |
| 53 | 2010.10.18 | තාවකාලික කථිකාචාර්ය එච්.ඩී. අසංක තිලකසිරි මහතා | ශ්‍රී ලංකාවේ පුරාවිද්‍යාත්මක උරුමය කොයිබටද? |
| 54 | 2010.11.10 | බෞද්ධ උපදේශනය පිළිබඳ උපදේශිකා ඩබ්.පී.එල්.එම්. නිලුෂිකා මිය | ශ්‍රී ලංකාවේ ඒඩ්ස් රෝගීන්ට ලැබෙන මනෝ සමාජීය සහයෝගය සහ ඔවුන්ගේ විෂාදය අතර ඇති සහසම්බන්ධතාවය පිළිබඳ අධ්‍යයනයක් |

- **කාර්ය මණ්ඩල පුහුණු**

2010 වර්ෂයේ දී මෙම විශ්වවිද්‍යාලයේ අනධ්‍යයන කාර්ය මණ්ඩලය පහත සඳහන් පරිදි පුහුණු පාඨමාලා සඳහා යොමු කරවන ලදී.

ඒ සඳහා රු. 38,150/-ක මුදලක් අනධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා වැය කරන ලදී. සහභාගි වූවන්ගේ නම් පහත දැක්වේ.

| නම හා තනතුර | පාඨමාලාවේ නම | ගාස්තුව | කාලය |
|---|---|---|---|
| එච්.ඒ.පී.පී. කරුණාරත්න මිය (සහකාර මූල්‍යාධිකාරී) | Seminar on the Introduction of the Sri Lanka Public Sector Accounting Standards (SLPSAS) published in 2009 | රු. 3,000/- | 2010.02.12 |
| චන්ද්‍රා කරුණාරත්න මිය (පුස්තකාලයාධිකාරී) | Seminar on "Skill Development for Library Professionals" | රු.1,000/- | 2010.04.27 |
| ආර්.ඒ. පියරත්න මයා (ලේඛකාධිකාරී) | Training Programme on Preparation of Corporate Plan | රු. 10,000/- | 2010.06.09 - 2010.06.11 |
| එච්. ඩී. ප්‍රේමරත්න ජයවීර මයා (මාණ්ඩලික පුස්තකාල සහකාර) | පුස්තකාල ද්‍රව්‍ය සංරක්ෂණය පිළිබඳ ප්‍රායෝගික හා න්‍යායාත්මක පුහුණු පාඨමාලාව අදියර I | රු. 6,500/- | 2010.02.08 - 2010.02.10 |
| ජී.ඒ. ගුණසේන මයා (ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී,පාලන) | Introduction to Government Procurement Procedure Training Programme | රු. 5,000/- | 2010.07.08 - 2010.07.09 |
| එන්.ඒ.එස්.කේ. ප්‍රේමචන්ද්‍ර මයා (සහකාර ලේඛකාධිකාරී) | ඉංග්‍රීසි ඩිප්ලෝමා පාඨමාලාව | රු. 12,650/- | |

## 09. මිලදී ගැනීම්

ප්‍රාග්ධන වත්කම් අත්පත් කර ගැනීම - භාණ්ඩ හා උපකරණ මිලදී ගැනීම - 2010 රු. 7,179,135.02.

# 10. මිලදී ගැනීම්, ඉදිකිරීම් සහ පහසුකම් සැපයීම

2010 වර්ෂය තුළ මිල දී ගැනීම්, ඉදිකිරීම්, වැඩි දියුණු කිරීමේ හා පහසුකම් සැපයීම සඳහා පහත සඳහන් පරිදි මුදල් ප්‍රතිපාදනය නිදහස් කර තිබුණි.

1. **ස්ථාවර වත්කම් වැඩි දියුණු කිරීම**

| | | |
|---|---|---|
| 1.1 ගොඩනැගිලි ඉදිකිරීම හා වැඩිදියුණු කිරීම | රු. | 29,500,000.00 |

2. **ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීම**

| | | |
|---|---|---|
| 2.1 ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ | රු. | 13,000,000.00 |
| 2.2 ගොඩනැගිලි හා ඉදිකිරීම් | රු. | 97,000,000.00 |
| 2.3 ඉඩම් හා ඉඩම් වැඩිදියුණු කිරීම | රු. | 2,000,000.00 |
| 2.4 පුස්තකාල පොත් | රු. | 1,000,000.00 |
| | | 142,500,000.00 |

2010 වර්ෂයේ ඉදිකිරීම් සහ පහසුකම් සැපයීම - රු. 13,158,664.78

2010 වර්ෂයේ රඳවා ගැනීම් නිදහස් කිරීම - රු. 585,156.80

### ❖ Turn Key ක්‍රමය යටතේ ගොඩනැගිලි ඉදිකිරීමේ ව්‍යාපෘති

ක්‍රියායෝග්‍ය පදනම මත රු. මිලියන 512ක වටිනාකමැති ගොඩනැගිලි ඉදිකිරීම් ව්‍යාපෘතියේ ඉදිකිරීම් වලින් 95% ක් පමණ නිමකර ඇති අතර ප්‍රධාන පරිපාලන ගොඩනැගිල්ලේ ඉදිකිරීම් 98% කින් නිමකර ඇත. නමුත්, මෙතෙක් නිසි ලෙස භාර දී නොමැත.

# 11. අභ්‍යාසලාභීන් බඳවා ගැනීම

හෝමාගම කාර්මික විද්‍යාලය, ගම්පහ කාර්මික විද්‍යාලය හා මරදාන කාර්මික විද්‍යාලය ලේකම් පරිචය, ලඝු යතුරු ලේඛනය, ගිණුම්කරණය හදාරන ශිෂ්‍ය ශිෂ්‍යාවන් 24 දෙනෙකු, ජාතික තරුණ සේවා සභාවේ හා ජාතික ආධුනිකත්ව පුහුණු කිරීම් මණ්ඩලයේ ලේකම් පරිචය, ලඝු යතුරු ලේඛනය හදාරන ශිෂ්‍ය ශිෂ්‍යාවන් 16 දෙනෙකු හා කැලණිය විශ්වවිද්‍යාලයේ පුස්තකාල විඥාපන විද්‍යාව පාඨමාලාවක් සහිතව ශාස්ත්‍රවේදී උපාධිය හැදෑරූ සිසුවියන් සඳහා ප්‍රායෝගික පුහුණුව ලබා දෙන ලදී.

## 12. මහපොළ ශිෂ්‍යත්ව

2010 අධ්‍යයන වර්ෂයට සිසුන් බඳවා ගැනීමේ දී උපරිම ලකුණු සීමාව සැළකිල්ලට ගෙන විද්‍යාර්ථීන් 22 දෙනෙකුට මහපොළ ශිෂ්‍යත්ව ප්‍රදානය කරන ලදී. 2010 වසරේ දී දෙවන වසර සිසුන් 18 දෙනෙකුට ද, තෙවන වසර සිසුන් 22 දෙනෙකුට ද, සිව්වන වසර සිසුන් 17 දෙනෙකුට ද මහපොළ ශිෂ්‍යත්ව ප්‍රදානය කරන ලදී.

## 13. විශ්වවිද්‍යාලයීය ශිෂ්‍ය සංගම් හා පීඨ සංගම් පිහිටුවීම

2010 මාර්තු 10 දින රැස් වූ ශිෂ්‍යයන් 2010.03.10 දින සිට වසරක් දක්වා පහත සඳහන් නිලධාරී මඩුල්ලෙන් සමන්විත ශිෂ්‍ය සංගමය, 302 පාලක සභාවේ අනුමැතිය මත පිහිටුවා ඇත.

| | | |
|---|---|---|
| 01. | පූජ්‍ය රඹෑවේ ධම්මවිජය හිමි | - සභාපති |
| 02. | පූජ්‍ය පානම ආනන්ද හිමි | - උප සභාපති |
| 03. | පූජ්‍ය මහගල්වැව ධම්මින්ද හිමි | - ලේකම් |
| 04. | විහාරගේ ඉෂාන් නාලින්ද මහතා | - කණිෂ්ඨ භාණ්ඩාගාරික |
| 05. | පූජ්‍ය හකුරුවෙල සිරිධම්ම හිමි | - සඟරා සංස්කාරක |
| 06. | පූජ්‍ය මිල්ලව උපතිස්ස හිමි | - කාරක සභික |
| 07. | පූජ්‍ය කුඩාබැදිගම සුමන හිමි | - කාරක සභික |
| 08. | පූජ්‍ය කුලසැන්දැවේ සාරද හිමි | - සඟරා සංස්කාරක |

### පීඨ රැස්වීම් සඳහා ශිෂ්‍ය නියෝජිතයන් පත් කිරීම

❖ භාෂා අධ්‍යයන පීඨය

01. පූජ්‍ය පානම ආනන්ද හිමි
02. පූජ්‍ය බලහරුවේ රතනසිරි හිමි

❖ බෞද්ධ අධ්‍යයන පීඨය

01. පූජ්‍ය මොණරාගල සුමේධානන්ද හිමි
02. පූජ්‍ය කුලසැන්දැවේ සාරද හිමි

# 14. උපකරණ උපයෝජනය

| කාර්ය සාධනය | තණකොළ කපන යන්ත්‍රය | | විදුලි ජනක යන්ත්‍රය | දළ එකතුව |
|---|---|---|---|---|
| උපකරණ සංඛ්‍යාව | 03 | | 01 | 04 |
| පරිභෝජනය කළ ඉන්ධන ලීටර් ප්‍රමාණය | පෙට්‍රල් 150 | 2T 14 | ඩීසල් ලීටර් 1150 | ලීටර් 1314 |
| ඉන්ධන සඳහා දළ වියදම | රු. 21,511.00 | | රු. 85,900.00 | රු. 107,411.00 |
| 2010.01.01 සිට 2010.12.31 දක්වා ධාවනය කළ පැය ගණන<br>පැයකට වැයවන මුදල (රුපියල්) | පැය 248<br>රු. 86.73 | | පැය 175<br>රු. 490.85 | පැය 423<br>රු. 577.58 |
| පැයකට වැයවය ඉන්ධන ප්‍රමාණය | ලීටර් 3/4 | | ලීටර් 6.72 | |

# 15. මූල්‍ය කටයුතු

වර්ෂයේ මුළු ආදායම රු. 92,043,793 ක් වූ අතර එයින් 82,170,000 ක් පුනරාවර්තන වියදම් සඳහා වූ රජයේ දායකය විය. බාහිර ව්‍යාපෘති වලින් 2010 වර්ෂය තුළ රු. 5,637,083 ක වියදමක් දරා ඇත. ස්ථාවර වත්කම් සඳහා වූ වර්ෂයේ ක්ෂය ප්‍රතිපාදනය රු. 39,721,386 ද ඇතුළත් සම්පූර්ණ පුනරාවර්තන වියදම රු. 135,008,700 ක් විය. එය ඉකුත් වර්ෂයේ සම්පූර්ණ පුනරාවර්තන වියදම වූ රු. 123,066,181 කට වඩා සියයට 9.70 කින් වැඩිවීමකි. ඒ අනුව වර්ෂයේ ඌනතාවය වූ රු. 43,168,149 පොදු සංචිතයට හර කළ පසු පොදු සංචිතයේ සමුච්චිත හර ශේෂය 2010.12.31 දිනට රු. 213,401,003 කි.

2010 වර්ෂයේ මූලධන වියදම් සඳහා රජයෙන් ලැබුණු දායකය රු. 47,000,000ක් වූ අතර 2010 වර්ෂයේ දී මූලධන වියදම් සඳහා රු. 35,250,595 ක් වැය කර ඇත.

**ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය**
**2010 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය**
**(ආසන්න රුපියලට ගැලපුම් කර ඇත.)**

| 2009 | විස්තරය | උපලේඛන අංකය | | 2010 |
|---|---|---|---|---|
| රු. | | | රු. | රු. |
| | **වත්කම්** | | | |
| | **ජංගම නොවන වත්කම්** | | | |
| 533,083,654 | 1. ස්ථාවර වත්කම් | 01 | 529,461,004 | |
| 15,557,021 | 2. ආයෝජන | 02 | 14,815,554 | 544,276,558 |
| 548,640,675 | | | | |
| | **3. ජංගම වත්කම්** | | | |
| 383,450 | සේවා තැන්පත් | 03 | 383,450 | |
| 8,586,404 | මූලධන අත්තිකාරම් | 04 | 1,113,234 | |
| 530,530 | කලින් ගෙවීම් | 05 | 310,367 | |
| 238,732 | ලැබිය යුතු පොලී | 06 | 173,527 | |
| 26,644 | ආරක්ෂක ඇප තැන්පත් | - | 28,010 | |
| | ආයෝජන | | | |
| 420,486 | ප්‍රකාශන තොගය | 07 | 420,486 | |
| 2,566,825 | සේවක ණය හා විවිධ අත්තිකාරම් | 08 | 2,607,763 | |
| 873,741 | ගබඩාවේ ඉතිරි තොගය | - | 781,114 | |
| 7,500 | ගෑස් සිලින්ඩර් සඳහා තැන්පතු | - | 7,500 | |
| 6,980,623 | බැංකුවේ ශේෂය | 09 | 27,129,594 | |
| 20,614,935 | | | 32,955,045 | 32,955,045 |
| 569,255,610 | මුළු වත්කම් | | | 577,231,603 |
| | **4. ප්‍රාග්ධනය හා වගකීම්** | | | |
| 687,605,258 | මූලධන ආධාර | 10 | 733,404,735 | |
| - | බාහිර ව්‍යාපෘති - මූලධන | - | 875,935 | |
| 1,100,000 | පොදු සංචියෙන් දැරූ මූලධන වියදම් | 11 | 1,100,000 | |
| 688,705,258 | | | | 735,380,670 |
| | **5. සංචිත** | | | |
| (170,232,854) | සමුච්චිත ශේෂය | - | (213,401,003) | |
| 3,179,996 | වත්කම් ප්‍රත්‍යාගණනය කිරීම | - | 3,179,996 | |
| (167,052,858) | | | | (210,221,007) |
| 15,243,593 | **6. සංචිත අරමුදල්** | 12 | 16,345,305 | |
| 11,489,124 | **7. ප්‍රාග්ධන පරිත්‍යාග** | 13 | 11,664,567 | |
| 26,732,717 | | | | 28,009,872 |
| | **8. ජංගම බැරකම්** | | | |
| 503,598 | තැන්පත් | 14 | 737,715 | |
| 978,174 | විවිධ ණය හිමියෝ | 15 | 570,786 | |
| 12,469,293 | කොන්ත්‍රාත් මත රඳවා ගැනීම් | 16 | 12,329,892 | |
| 6,919,428 | බාහිර පාඨමාලා ව්‍යාපෘති | 17 | 10,423,675 | |
| 20,870,493 | | | 24,062,068 | 24,.062,068 |
| 569,255,610 | මුළු ප්‍රග්ධනය හා වගකීම් | | | 577,231,603 |

මහෝපාධ්‍යාය
පිටිපන උතුර,
හෝමාගම
2011.02.24

මූල්‍යාධිකාරී

# ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය
## 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
## ආදායම් හා වියදම් ගිණුම

| 2009 | විස්තරය | උපලේඛන අංකය | | 2010 |
|---|---|---|---|---|
| | | | රු. | රු. |
| | **(01) ආදායම්** | | | |
| 70,393,000 | 1. පුනරාවර්තන වියදම් සඳහා රජයේ ආධාර | | 82,170,000 | |
| 11,674,703 | 2. විශ්වවිද්‍යාලය ඉපැයූ ආදායම | අ | 9,873,793 | |
| 8,802,137 | 3. බාහිර ව්‍යාපෘති වලින් ලද ආදායම | | 5,637,083 | |
| - | 4. මූලධන - පුනරාවර්තන වියදම් | | 1,200,527 | |
| 90,869,840 | | | | 98,881,403 |
| | **(02) අඩුකළා - වියදම්** | | | |
| | 1. විශ්වවිද්‍යාලයීය වියදම | | | |
| 38,974,068 | වැඩසටහන් අංක 01 | ආ | 41,161,272 | |
| 34,239,708 | වැඩසටහන් අංක 02 | ඇ | 32,441,276 | |
| 5,748,543 | වැඩසටහන් අංක 03 | ඈ | 4,681,321 | |
| 6,084,516 | වැඩසටහන් අංක 04 | ඉ | 6,058,292 | |
| 1,714,180 | වැඩසටහන් අංක 05 | ඊ | 2,100,709 | |
| - | වැඩසටහන් අංක 06 | උ | 8,844,444 | |
| 36,305,166 | 2. වත්කම් සඳහා ක්ෂය ප්‍රතිපාදනය | | 39,924,628 | |
| 8,802,137 | 3. බාහිර ව්‍යාපෘති වියදම | | 5,637,083 | |
| - | 4. මූලධන - පුනරාවර්තන වියදම් | | 1,200,527 | |
| 131,868,318 | | | | 142,049,552 |
| (40,998,478) | ආදායමට වැඩි වියදම | | | (43,168,149) |
| (129,234,376) | පසුගිය වර්ෂයෙන් ඉ/ගෙ ශේෂය | | | (170,232,854) |
| (170,232,854) | ශේෂය ඉ/ගෙ | | | (213,401,003) |

මහෝපාධ්‍යාය                                        මූල්‍යාධිකාරී
පිටිපන උතුර,
හෝමාගම
2011.02.24

# ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය
## මුදල් ප්‍රවාහ ප්‍රකාශය - 2010

| | | 2009 | | 2010 | |
|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්** | | | | | |
| වර්ෂය සඳහා අතිරික්තය (ඌණතාවය) | | | **(40,998,478)** | | **(43,168,149)** |
| **මූල්‍යමය නොවන අයිතම සඳහා ගැලපීම** | | | | | |
| වර්ෂයේ ක්ෂය ප්‍රතිපාදනය | | | **36,305,166** | | **39,924,628** |
| | | | **(4,693,312)** | | **(3,243,521)** |
| | | | | | |
| **කාරක ප්‍රාග්ධනයේ වෙනස්වීම** | | | | | |
| මූලධන අත්තිකාරම් | වැඩිවීම (අඩුවීම) | **9,754,254** | | **7,473,170** | |
| සේවා තැන්පතු | වැඩිවීම (අඩුවීම) | **(90,000)** | | **-** | |
| විවිධ ණය ගැතියන් | වැඩිවීම (අඩුවීම) | **73,204** | | **-** | |
| කළින් ගෙවීම | වැඩිවීම (අඩුවීම) | **(286,835)** | | **220,163** | |
| ලැබිය යුතු පොළී | වැඩිවීම (අඩුවීම) | **2,676** | | **65,205** | |
| ආරක්ෂක ඇප තැන්පත් | වැඩිවීම (අඩුවීම) | **(1,286)** | | **(1,366)** | |
| ප්‍රකාශණ තොගය | වැඩිවීම (අඩුවීම) | **-** | | **-** | |
| සේවක ණය හා අත්තිකාරම් | වැඩිවීම (අඩුවීම) | **(80,406)** | | **(40,938)** | |
| ගබඩාවේ ඉතිරි තොගය | වැඩිවීම (අඩුවීම) | **860,602** | | **92,627** | |
| තැන්පතු | වැඩිවීම (අඩුවීම) | **(46,453)** | | **234,117** | |
| විවිධ ණය හිමියෝ | වැඩිවීම (අඩුවීම) | **188,533** | | **(407,388)** | |
| කොන්ත්‍රාත් මත රඳවා ගැනීම් | වැඩිවීම (අඩුවීම) | **(1,338,819)** | | **(139,401)** | |
| බාහිර පාඨමාලා ව්‍යාපෘති | වැඩිවීම (අඩුවීම) | **919,516** | **9,954,986** | **3,504,247** | **11,000,436** |
| | | | **5,261,674** | | **7,756,915** |
| **ආයෝජන ක්‍රියාකාරකම්** | | | | | |
| ස්ථාවර වත්කම් අත්කර ගැනීම | | **115,874,595** | | **35,426,043** | |
| ආයෝජනවල යෙදවීම | | **4,345,795** | | **(741,467)** | |
| ආයෝජන ක්‍රියාකාරකම්වල යෙදවීම | | | **(120,220,390)** | | **34,684,576** |
| | | | | | |
| **ඉදිරියට ගෙන ගිය ශේෂය** | | | **(114,958,716)** | | **26,927,661** |

| | 2009 | | 2010 | |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. |
| ඉදිරියට ගෙන ආ ශේෂය | | **(114,958,716)** | | **26,927,661** |
| **මූලධන ක්‍රියාකාරකම්** | | | | |
| මූලධන දායකය | **110,399,999** | | **45,799,477** | |
| සංචිත අරමුදල් | **2,745,822** | | **1,101,712** | |
| ප්‍රාග්ධන | **21,665** | | **175,443** | |
| මූලධන ක්‍රියාකාරකම්වලින් ලැබීම | **-** | **113,167,486** | | **47,076,632** |
| **මුදල් සහ සමාන විෂයයන්ගේ ශේෂය** | | **1,791,230** | | **20,148,971** |
| | | | | |
| **මුදල් හා සමාන විෂයයන්ගේ ශේෂය** | | | | |
| වර්ෂය මුල | | **8,771,853** | | **6,980,623** |
| වර්ෂය අග | | **6,980,623** | | **27,129,594** |
| මුදල් හා සමාන විෂයයන්ගේ ශේෂය වැඩිවීම (අඩුවීම) | | **1,791,230** | | **20,148,971** |

2011.02.24 මූලාධිකාරී

## ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය

**<u>2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ</u>**
**<u>මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්</u>**

1. පසුගිය වසරේ අනුගමනය කළ ගිණුම් ප්‍රතිපත්තීන්ට අනුකූල ව හා පොදුවේ පිළිගත් ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල ව ඓතිහාසික පිරිවැය පදනම මත ගිණුම් වාර්තා සකස් කර ඇත.

2. ගිණුම් වාර්තා අවසාන රුපියලට පිළියෙල කොට ඉදිරිපත් කර ඇත.

3. ගබඩා ද්‍රව්‍ය ප්‍රථම ගැණුම්, ප්‍රථම නිකුත් කිරීමේ පදනම මත අගය කර ඇත.

4. වි.වි.ප්‍ර.කො. සභා චක්‍රලේඛ අංක 649 අනුව ස්ථාවර වත්කම් සරල මාර්ග ක්‍රමය අනුගමනය කරමින් ක්ෂය කර ඇති අතර, ශුද්ධ අගය මත ශේෂ පත්‍රයෙහි දක්වා ඇත. ක්ෂය කර ඇති ස්ථාවර වත්කම්වල ක්ෂය ප්‍රතිශතය පහත දක්වා ඇත.

| | | | |
|---|---|---|---|
| ගොඩනැගිලි | 05% | පුස්තකාල පොත්පත්, සඟරා | 20% |
| ලී බඩු සහ සවිකිරීම් | 10% | මෝටර් වාහන | 20% |
| කාර්යාල උපකරණ | 20% | උපාධි ලෝගු | 20% |

5. විශ්වවිද්‍යාලයේ ගොඩනැගිලි සංකීර්ණය ඉදි කිරීම සඳහා වූ රුපියල් මිලියන 512 ක්වූ කොන්ත්‍රාත්තුව අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත ක්‍රියායෝග්‍ය පදනම (Turn key) යටතේ ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශයට පවරා ඇත.

6. 2010 වර්ෂයේ සිට බාහිර විභාග අංශය සඳහා 6.1 නමින් නව ව්‍යාපෘතියක් ආරම්භ කර ඇත.

මූල්‍යාධිකාරී

පිටිපන උතුර,
හෝමාගම.

2011.02.24

සීඊ/ඊ/බීපීයූ/එෆ්/10

2011 ජූලි 27 දින

මහෝපාධ්‍යායයන් වහන්සේ,
ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය,

**ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය හා 1981 අංක 74 දරන ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාල පනතේ 38 වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත්කළයුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් 2011 අප්‍රේල් 30 දින නිකුත් කරන ලදී.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමණාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කළමණාකරණයේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාමත්, යෝග්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරා ගැනීම සහ යොදාගැනීමත්, අවස්ථාවෝචිතව සාධාරණ ලෙස ගිණුම්කරණ ඇස්තමේන්තු සකස් කිරීමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 1.3 විගණන විෂය පථය සහ මතය සඳහා පදනම

මාගේ විගණන පරීක්ෂණ මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මෙම වාර්තාවේ ඇතුළත් විගණන මතය, අදහස් දැක්වීම් සහ සොයාගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනු වල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය සහ පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් සහ කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි. මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්ට අනුකූලව විගණනය සිදු කරන ලදි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම් වලට උපකාරී වන සාක්ෂි නියැදි පදනම මත පරීක්ෂා කිරීම්, මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ මූලධර්ම හා වැදගත් ඇස්තමේන්තු සහ මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ උපරිම දැනීම සහ විශ්වාසය පරිදි විගණන කටයුතු සඳහා අවශ්‍ය වන ප්‍රමාණවත් තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබා ගන්නා ලදි. ඒ අනුව මාගේ මතය සඳහා ප්‍රමාණවත් පදනමක් මාගේ විගණනය මඟින් සපයන බව මාගේ විශ්වාසයයි. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1. මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශනවලට වන බලපෑම හැර 2010 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නාවූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳව අදහස් දැක්වීම

#### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත කරුණු නිරීක්ෂණය විය.

අ) සම්පූර්ණයෙන් ක්ෂය වූ ලෙස ගිණුම්වල දක්වා තිබුණු නමුත් තව දුරටත් ප්‍රයෝජනයට ගන්නා පිරිවැය රු.33,608,706/- ක් වූ ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනය කර ගිණුම් ගත කර නොතිබුණි.

ආ) බාහිර ව්‍යාපෘති ආදායමෙන් මිලදී ගෙන තිබුණු රු. 875,935/- ක් වූ උපකරණ වල වටිනාකම මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කිරීමේදී අත්හැර තිබුණි.

ඇ) ගබඩාවේ ඉතිරි තොගයේ වටිනාකම සහ ප්‍රකාශන තොගයේ වටිනාකම පිළිවෙලින් රු.215,928කින් සහ රු.425,225/- කින් අඩුවෙන් සහ කොන්ත්‍රාත් මත රඳවා ගැනීම් රු.75,389/- කින් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි.

#### 2.2.2 නොසැසඳූ පාලන ගිණුම්

විෂයයන් 03කට අදාල ගිණුම් හා උපලේඛන අතර රු.26,173/- ක වෙනසක් නිරීක්ෂණය වූ අතර ඊට හේතු විමසා නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි.

#### 2.2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත කරුණු නිරීක්ෂණය විය.

අ) වර්ෂ ගණනාවක සිට ඉදිරියට එන රු.41,568/- ක්වූ නොගෙවූ වැටුප් සමාලෝචිත වර්ෂයේදී ද නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

ආ) දැනට සේවයේ නොමැති නිලධාරීන්ගෙන් අයවිය යුතු රු.58,750/- ක් වූ ණය ශේෂ ඇපකරුවන්ගෙන් හෝ නීතිමය ක්‍රියාමාර්ග තුලින් හෝ අයකර නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

ඇ) සමාලෝචිත වර්ෂය අවසානයේදී කොන්ත්‍රාත් සහ සැපයුම් මත වූ රඳවාගැනීම් වල වටිනාකම රු.12,329,892/- ක් වූ අතර ඉන් වර්ෂ 5කට වඩා පැරණි ශේෂ වල වටිනාකම රු.7,911,317/- ක් විය.

### 2.2.4 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.

පහත සඳහන් නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| **අ) 1981 අංක 74 දරණ ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාල පනතේ VII වන කොටසේ 32(ඇ) වගන්තිය.** | ස්වයංමූල්‍ය පාඨමාලා ආදායම් විශ්වවිද්‍යාල අරමුදලට බැර කර නොතිබුණු අතර ඉන් බැහැරව ඒවා පරිහරණය කර තිබුණි. |
| **ආ) 1983 අංක 12 දරන පාරිතෝෂික දීමනා ගෙවීම් පනත.** | විශ්වවිද්‍යාලයේ සේවකයින් වෙනුවෙන් පාරිතෝෂික සඳහා වාර්ෂිකව වෙන් කිරීම් කර නොතිබුණි. |
| **ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි** | |
| **(i) 371(2) (ආ) සහ (ඇ) වගන්ති** | අ) වරකට අතුරු අග්‍රිම ලබාදිය යුතු රු.20,000/- උපරිම සීමාව ඉක්මවා විශ්වවිද්‍යාලය විසින් රු.21,000/- සිට රු.77,200/- දක්වා අත්තිකාරම් නිකුත් කර තිබූ අතර එසේ සීමාව ඉක්මවා වර්ෂය තුළ නිලධාරීන් 06 දෙනෙකු වෙත රු.533,940/- ක අත්තිකාරම් ලබා දී තිබුණි. |
| | ආ) සමාලෝචිත වර්ෂය තුළ අවස්ථා 05කදී දෙන ලද එකතුව රු.78,527/- ක් වූ අත්තිකාරම් වලින් අදාල කාර්යයන් නිමකර අත්තිකාරම් පියවා නොතිබුණි. එමෙන්ම නිලධාරියෙකු වෙත නිකුත් කර ඇති එක් තත්කාර්ය අග්‍රිමයක් පියවීමට පෙර තවත් අග්‍රිමයක් නිකුත් කළ අවස්ථා ද විගණනයට අනාවරණය විය. |
| | ඇ) විශ්වවිද්‍යාලය විසින් මාණ්ඩලික නොවන නිලධාරීන් 22 දෙනෙකු වෙත වර්ෂය තුළ එකතුව රු.598,665/- ක් වූ අත්තිකාරම් ලබා දී තිබුණි. |
| **(ii) 571 වගන්තිය** | එකතුව රු.20,000/- ක් වු ටෙන්ඩර් තැන්පත් ආපසු ගෙවීමට හෝ රජයේ ආදායමට බැර කිරීමට හෝ කටයුතු කර නොතිබුණි. |
| **(iii) 756 වගන්තිය** | ස්ථාවර වත්කම් සමීක්ෂණයක් පවත්වා ශේෂ තහවුරු කර ගෙන නොතිබුණි. |

| | |
|---|---|
| **ඉ) විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ ආයතන සංග්‍රහය.** | |
| **(i) X පරිච්ඡේදයේ 1.6.1 වගන්තිය** | ආචාර්යවරුන් නිවාඩු ලබාගැනීම් වාර්තාකර නොතිබූ අතර නිවාඩු ලේඛනයන්ද පවත්වා නොතිබුණි. |
| **(ii) X වන පරිච්ඡේදයේ II කොටසෙහි 33 හා 34 වගන්තිය.** | විදේශගත වූ ආචාර්යවරුන් 16 දෙනෙකුගෙන් 13 දෙනෙකු කිසිම ආකාරයේ ගිවිසුමකට එළඹ නොතිබූ අතර අනෙක් 3 දෙනා එළඹ තිබූ ගිවිසුම් ද අසම්පූර්ණ ඒවා විය. |
| **(iii) XX වන පරිච්ඡේදයේ 3.1 වගන්තිය.** | ආචාර්යවරුන් සිය පැමිණීම සනාථ කිරීම සඳහා පැමිණීමේ ලේඛනයක අත්සන් කර නොතිබුණි. මේ හේතුව නිසා සේවය හැරගිය ආචාර්යවරුන් සඳහා ද වැටුප් සකස් කර තිබුණි. |
| **ඊ) 1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය.** | ඉන්ධන දහනය පිළිබඳ පරීක්ෂාවක් කර නොතිබුණි. |
| **උ) 1994 ජුනි 14 දිනැති අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛය හා අයවැය අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක බීඩී/අයිඑන්එස්/සීඑල්වීඑස්-ඒ/078 හා 2003 ජුලි 18 දිනැති ලිපිය.** | අ) සේවක අර්ථසාධක අරමුදලට හා සේවක භාරකාර අරමුදලට දායක මුදල් ගෙවීමේ දී අධ්‍යයන දීමනාව සැලකිල්ලට ගැනීම හේතුවෙන් 1997 වර්ෂයේ සිට 2010 වර්ෂය දක්වා රු.3,855,206/- ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණු අතර උක්ත දීමනා ආපසු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.<br>ආ) 2007 වර්ෂයේදී විශ්‍රාම ගිය මහාචාර්යවරයෙකුට පාරිතෝෂික මුදල් ගෙවීමේදී අධ්‍යයන දීමනාව සැලකිල්ලට ගැනීම හේතුවෙන් රු.132,291/- ක් වැඩිපුර ගණනය කර ගෙවා තිබුණි. |

### 2.2.5 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

1984 නොවැම්බර් 24 දිනැති අංක PE/1/116/6 දරන භාණ්ඩාගාර ලිපිය අනුව වෛද්‍යාධාර අරමුදල සඳහා විශ්විද්‍යාල අරමුදලින් කෙරෙන දායකය අඩුකර ගැනීම සඳහා වෛද්‍යාධාර අරමුදලට අදාලව ජනිතවන පොළී මුදල් හා වෙනත් ආයෝජන ආදායම් දායකය ගෙවීම සඳහා උපයෝගී කරගත යුතු බවට උපදෙස් ලබා දී තිබුණු නමුත් සමාලෝචිත වර්ෂයේදී ලැබී තිබුණු රු.384,942/- ක ආයෝජන ආදායම අඩු නොකර රු.1,717,684/- ක් වූ මුළු දායක මුදලම වෛද්‍යාධාර අරමුදලට බැර කර තිබුණි.

### 2.2.6 අවිධිමත් ගනුදෙනු

බාහිර ව්‍යාපෘති පාඨමාලා 02ක් සඳහා ප්‍රතිපාදන ඉක්මවා රු.156,059/- ක් වැය කර තිබුණි.

## 3. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 3.1 මූල්‍ය සමාලෝචනය

### 3.1.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විශ්වවිද්‍යාලයේ වැඩ කටයුතු වල මූල්‍ය ප්‍රතිඵලය, පුනරාවර්තන වියදම් සඳහා රජයේ ප්‍රදානය ගණන් ගැනීමට පෙර රු.125,338,149/- ක ඌනතාවයක් වූ අතර ඉකුත් වර්ෂය සඳහා වූ ඊට අනුරූප ඌනතාවය රු.111,391,478/- ක් වූයෙන් ඌනතාවයේ වැඩිවීම රු.13,946.671/- ක් විය. පුනරාවර්තන වියදම් සඳහා රජයෙන් ලැබුණු රු.82,170,000/-ක් වූ ප්‍රදානය ගණන් ගැනීමෙන් පසුව සමාලෝචිත වර්ෂයේ ඌනතාවය රු.43,168,149/- ක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂය සඳහා වූ ඌනතාවය රු.40,998,478/- ක් වූයෙන් ඌනතාවයේ රු.2,169,671/- ක වැඩිවීමක් නිරීක්ෂණය වේ.

### 3.2 මෙහෙයුම් සමාලෝචනය

### 3.2.1 කාර්ය සාධනය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

#### අ) අරමුණු ඉටු කර ගැනීම

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

i) පර්යේෂණ පැවැත්වීම තුළින් දැනුම වර්ධනය කර ශිෂ්‍ය ප්‍රජාව සමාජයට මුදා හැරීම විශ්වවිද්‍යාලයක ප්‍රධාන මෙහෙවරක් වුවත් සමාලෝචිත වර්ෂයේදී ජියුන් බෞද්ධ පර්යේෂණ ප්‍රකාශන අරමුදල කිසිදු පර්යේෂණ හා ප්‍රකාශන කටයුත්තක් සඳහා උපයෝජනය කර නොතිබුණු අතර එහි සමාලෝචිත වර්ෂය අවසානයට ශේෂය රු.1,646,614/- ක් විය.

ii) විශ්වවිද්‍යාලය විසින් පවත්වාගෙන යනු ලබන මහෝපාධ්‍ය අරමුදල පිහිටුවීමට පාදක කරගත් ව්‍යවස්ථාපිත තත්ත්වය පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් නොවූ අතර සමාලෝචිත වර්ෂය අවසානයේදී රු.1,944,896/-ක ශේෂයක් පැවතිණි. සමාලෝචිත වර්ෂය තුල ගෑස් සහනාධාරය සඳහා රු. රු.191,646/-ක් සහ රු.1,236,847ක් වූ මුදලක් වියදම් කල ගොඩනැගිලි සංකීර්ණය විවෘත කිරීමේ උත්සවය සඳහා රු.1,000,000/-ක් මෙම අරමුදලින් වියදම් කර තිබුණි.

iii) විශ්වවිද්‍යාලය පිහිටුවීමේ මූලික අරමුණ වූයේ ශ්‍රී ලංකාවේ හා විදේශයන්හි බෞද්ධාගම පතුරුවාලීම හා ධර්මදූත කටයුතු පෝෂණය කිරීම සඳහා බෞද්ධ ධර්මය හා විනය පිළිබඳ ශාස්ත්‍රධරයන් පුහුණු කිරීමය. 1984 සිට 2010 දක්වා කාල සීමාව තුල ආචාර්ය, දර්ශනපති, ශාස්ත්‍රපති උපාධි, ඩිප්ලෝමා ආදී විභාග සමත් වූ සංඛ්‍යාව 4,996ක් විය.

#### ආ) ශිෂ්‍යයන් බඳවා ගැනීම.

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

i) සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ පහකදී සාමාන්‍ය උපාධි සඳහා අභ්‍යන්තර ශිෂ්‍යයින් ලෙස ඉල්ලුම් කල හා බඳවාගත් දේශීය හා විදේශීය ශිෂ්‍ය සංඛ්‍යාව පිළිබඳ සටහනක් පහත දැක්වේ.

| වර්ෂය | ඉල්ලුම් කල සංඛ්‍යාව | | බඳවා ගත් සංඛ්‍යාව | |
|---|---|---|---|---|
| | දේශීය | විදේශීය | දේශීය | විදේශීය |
| 2006 | 362 | 62 | 110 | 62 |
| 2007 | 348 | 42 | 102 | 42 |
| 2008 | 293 | 61 | 109 | 61 |
| 2009 | 196 | 74 | 109 | 74 |
| 2010 | 353 | 45 | 109 | 45 |

2004 වර්ෂයේ සිට රු. මිලියන 512ක් වැය කර සියළු පහසුකම් සහිතව නවීකරණය කරන ලද ගොඩනැගිලි ඇතුළු යටිතල පහසුකම් වැඩිදියුණු කර තිබුණද ඊට සාපේක්ෂව වැඩි සිසුන් සංඛ්‍යාවක් බඳවා ගැනීම කෙරෙහි අවධානය යොමු වී නොතිබුණි.

ii) සමාලෝචිත වර්ෂය තුළ අධ්‍යයන කටයුතු සඳහා ශිෂ්‍යයින් 544ක් වෙනුවෙන් දරන ලද මුළු පුනරාවර්තන වියදම රු.142,049,552/- ක් වූ අතර, ඉකුත් වර්ෂයේ ශිෂ්‍යයින් 546ක් වෙනුවෙන් දරන ලද මුළු පුනරාවර්තන වියදම රු.131,868,318/- ක් විය. සමාලෝචිත වර්ෂයේ රු.261,120/- ක් වූ ඒක ශිෂ්‍ය පිරිවැය ඉකුත් වර්ෂයේ රු.241,517/- ක් වූ ඒක ශිෂ්‍ය පිරිවැය හා සසඳන විට 8.11% කින් වැඩි වී තිබුණි.

ඇ) අධ්‍යයන කාර්ය සාධනය

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

i) ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ භාෂා පීඨයේ හා බෞද්ධ අධ්‍යයන පීඨයේ 2010 අධ්‍යයන වර්ෂයේ කාල සටහන් අනුව එක් විෂයයක් සඳහා සාමාන්‍ය වශයෙන් දේශන 30ක් පැවැත්විය යුතු වුවද විෂයයන් 56ක් සඳහා දේශන 1,680කින් පවත්වා තිබුණේ දේශන 789ක් පමණි.

ii) විභාගයට පෙනී සිටීමේ සුදුසුකමක් ලෙස දේශන වලට සහභාගී වීමේ අනිවාර්යය ප්‍රතිශතයක් සලකා නොබැලීම හේතුවෙන් දේශන සඳහා සිසුන්ගේ සහභාගීත්වය ඉතා දුර්වල මට්ටමක පැවතුණ අතර දේශන වලට සිසුන් සහභාගී නොවීම හේතුවෙන් විෂයයන් 41කට අදාල දේශන 144ක් පවත්වා නොතිබුණි. පැවැත්වූ දේශන 290කදී සිසු සහභාගීත්වය 50%කටත් වඩා අඩු අවස්ථා 230ක් විය.

iii) සිසුන් නොපැමිණීම මත බාහිර දේශකවරුන් දේශන නොපැවැත්වුවද, නොපැවැත්වූ දේශන 60ක් සඳහා රු.60,000/- ක මුදලක් අධ්‍යයන වර්ෂය තුල ගෙවා තිබුණි.

iv) එක් එක් අධ්‍යයනාංශයේ කථිකාචාර්යවරුන් විසින් සතියකට පවත්වන දේශන පැය ගණන පරීක්ෂා කිරීමේදී ස්ථිර කථිකාචාර්යවරුන්ට සාපේක්ෂව තාවකාලික හා ආධුනික කථිකාචාර්යවරුන් විසින් වැඩි පැය ගණනක් දේශන පවත්වා තිබුණු අතර ඊට හේතු වූ කරුණු පැහැදිලි නොකෙරිණි.

### 3.2.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

අ) 1992 වර්ෂයේදී ආරම්භ කරන ලද සංවර්ධන අරමුදල යොදා ගත යුතු කටයුතු පිළිබඳ නිර්ණායකයන් පිළියෙල කර නොතිබුණු අතර 2010 දෙසැම්බර් 31 දින වන විට එහි ශේෂය රු.510,293/-ක් විය. අරමුදලින් 2002 වර්ෂයේ සිට ආපන ශාලාවට රු.99,505/-ක් වටිනා ගෑස් සැපයීම පමණක් සිදුකර තිබුණි.

ආ) විශ්වවිද්‍යාලය දැනට භුක්ති විඳින බස්නාහිර පළාතේ පළාත් සභාවේ කෘෂිකර්ම, ඉඩම්, සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය, වාරිමාර්ග සහ ප්‍රවාහන කටයුතු අමාත්‍යාංශය සතු අක්කර 5 පර්චස් 0.27ක් වූ ඉඩම 2002 දෙසැම්බර් 05 දින විශ්වවිද්‍යාලයට පැවරීමේදී ඉදිරිපත් කල කොන්දේසි අතරින් මෙම ඉඩම බද්දක් මත ලබාගත යුතුය යන කොන්දේසිය ඉටුකර නොතිබුණි.

### 3.2.3 වෙනත් රාජ්‍ය ආයතන වලින් ලබාගත් සම්පත්

බුද්ධ සාසන අමාත්‍යාංශයට හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශයට අයත් මෝටර් රථ දෙකක් විශ්වවිද්‍යාලය විසින් පරිහරණය කලද ඒවා නීත්‍යානුකූලව පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

### 3.2.4 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

රු. මිලියන 28ක් (එකතු කල අගය මත බදු රහිතව) වැයකර අංග සම්පූර්ණ ශ්‍රවණාගාරයක් ඉදිකර ඇතත් එය පරිශීලනය සම්බන්ධයෙන් ඉදිරි සැලසුම් විගණනයට ඉදිරිපත් නොකළ අතර සමාලෝචිත වර්ෂයේදී ද ප්‍රයෝජනවත් කාර්යයකට යොදා ගෙන නොතිබුණි.

### 3.2.5 කාර්ය මණ්ඩල පිරිවැය

සමාලෝචිත වර්ෂය අවසානය වන විට විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩලය, අනධ්‍යයන 15ක් හා අධ්‍යයන 04ක් වශයෙන් පුරප්පාඩු 19ක් පැවතිණි.

## 4. පද්ධති හා පාලන

විගණනයේ දී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු විශ්වවිද්‍යාලයේ මහෝපාධ්‍යායයන් වහන්සේගේ අවධානයට වරින් වර යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

(අ) ස්ථාවර වත්කම්
(ආ) පුස්තකාල කළමනාකරණය
(ඇ) ඉදිකිරීම්
(ඈ) අභ්‍යන්තර පාලනය
(ඉ) මානව සම්පත් කළමනාකරණය
(ඊ) බාහිර ව්‍යාපෘති වලට අදාල ගිණුම්කරණය
(උ) පෞද්ගලික ලිපිගොනු පවත්වා ගෙන යාම

එච්.ඒ.එස්. සමරවීර
වැඩබලන විගණකාධිපති

බීපීයූ/ඒබී-03/36 (2010)

2011.10.10

එච්.ඒ.එස්.සමරවීර මහතා,
විගණකාධිපති,
විගණකාධිපති දෙපාර්තමේන්තුව,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.

**<u>ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.</u>**

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම.**

**1.3 විගණන විෂය පථය සහ මතය සඳහා පදනම**

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.1 මතය**

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳව අදහස් දැක්වීම**

**2.2.1 ගිණුම්කරණ අඩුපාඩු**

(අ) මෙම ස්ථාවර වත්කම් පරීක්ෂා කර බලා ඒ පිළිබඳව භෞතික සත්‍යාපනයක් සිදු කොට ඉන්පසුව ප්‍රත්‍යාගණනය කොට ගිණුම්වලට ඇතුළත් කර ගැනීමට ඉදිරියේ දී කටයුතු කිරීමට සටහන් කර ගන්නා බව දන්වමි.

(ආ) මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙළ කිරීමේදී බාහිර ව්‍යාපෘති උපකරණ මිලදී ගැනීමේ වටිනාකම වන රු. 875,935/- අත්හැරී ඇති බව පිළිගනු අතර එය නිවැරදි කිරීමට කටයුතු කරනු ඇත.

(ඇ) ගබඩා තොගයේ වටිනාකම ලෙස රු. 781,114/- ක් අවසන් ගිණුම් වලට ගැනීම නිසා අවසන් තොගයේ වටිනාකම රු. 215,928/- ක් අඩුවෙන් පෙන්නුම් කර ඇත. මෙය 2011 වර්ෂයේ දී නිවැරදි කිරීමට අවශ්‍ය ජ' නල් පිළියෙළ කොට ඇත.

ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ 25 වන සංවත්සරය නිමිත්තෙන් අමාත්‍යාංශයෙන් ලබා දෙන ලද මුදලින් මෙම ප්‍රකාශන පොත් තොගය මුද්‍රණය කිරීමට කටයුතු කර ඇති අතර, දැනට මේවා ප්‍රකාශන තොගයට ඇතුළත් කර නොමැති බැවින්, ඉදිරියේ දී සොයා බලා තොග ශේෂයට ඇතුළත් කිරීමට කටයුතු කරනු ඇත.

මෙම රු. 75,389/- වටිනාකම අදාළ කොන්ත්‍රාත්කරුවන්ට ගෙවා ඇති නමුත්, කොන්ත්‍රාත් මත රඳවා ගැනීමේ ගිණුමෙන් කපා හැරීමට නොහැකි වී ඇත. මෙය ජ' නල් සටහන් අංක 81, 82, 86, 87 මඟින් නිවැරදි කර ඇත.

**2.2.2 නොසැසඳු පාලන ගිණුම්**

පාපැදි ණය සඳහා අදාළ රු. 190/- වෙනස සොයා ඊට අදාළව ජ' නල් සටහන් පිළියෙළ කළ අතර, කලින් ගෙවීම් හා විශේෂ අත්තිකාරම් සඳහා ඇති වී තිබෙන වෙනස්කම් පිළිබඳ සොයා බලා ඉදිරියේ දී කටයුතු කිරීමට සටහන් කර ඇත.

**2.2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

(අ) රු. 41,568/- ක් වූ නොගෙවූ වැටුප් පිළිබඳව මුදල් කමිටු තීරණයක් ලබාගත් අතර, ඒ අනුව අදාළ පුද්ගලයින් වෙත ලිපි යැවීමටත්, එම ලිපිවලට දින 14ක් ඇතුළතදී පිළිතුරු නොලැබුණහොත් එම මුදල් ප්‍රමාණය විශ්වවිද්‍යාල ආදායම් ගිණුමට බැර කිරීමටත් තීරණය විය. ඒ අනුව කටයුතු කිරීම සඳහා අදාළ පුද්ගලයින් වෙත ලිපි යැවීමට කටයුතු යොදමින් පවතී..

(ආ) දැනට සේවයේ නොමැති නිලධාරීන්ගෙන් අයවිය යුතු ණය ශේෂ වශයෙන් සඳහන් වී ඇති මුදල් අර්ථසාධක අරමුදල් ප්‍රතිලාභ නිදහස් කිරීමේ දී අයකර ගැනීමට කටයුතු කර ඇත.

(ඇ) කොන්ත්‍රාත් හා සැපයුම් මත රඳවා ගැනීමට අදාළ මුදල් ප්‍රමාණයන් නිදහස් කිරීමට තීරණයක් ගැනීම සඳහා මූල්‍යාධිකාරී විසින් මුදල් කමිටුව වෙත ඉදිරිපත් කළ අතර, කමිටුවේ තීරණය වූයේ මේ පිළිබඳව අදාළ සැපයුම්කරුවන් දැනුවත් කිරීමට කටයුතු කළයුතු බවයි.

**2.2.4 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.**

(අ) 2010 වර්ෂයේ අවශ්‍ය ගිණුම් සැකසීමේ දී 2010 වර්ෂයට අදාළ ස්වයං මූල්‍ය පාඨමාලා ආදායම් හා වියදම් විශ්වවිද්‍යාල ආදායම් හා වියදම් ගිණුමට ගිණුම් ගත කර ඇත.

(ආ) පාරිතෝෂික දීමනා සඳහා වෙන්කිරීමක් කර නැත. ඉදිරියේ දී ඉවත් වන අය වෙනුවෙන් යම් ප්‍රතිශතයක් ඒ වෙනුවෙන් බැර කිරීමට කටයුතු කරනු ඇත.

(ඇ) I (අ) මු.රෙ.371 (2) (ආ) ප්‍රකාරව අතුරු අග්‍රිම වශයෙන් එක් අවස්ථාවක දී ලබා දෙන මුදල රු. 20,000/- කට නොවැඩි විය යුතු වුවත් බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ සමහර අවස්ථාවල දී රු 20,000/- කට වැඩි අත්තිකාරම් ද දීමට සිදු වන අවස්ථා ඇත. වරින් වර චක්‍රලේඛ මගින් ගාස්තු ප්‍රමාණයන් වැඩි වන විට මෙම රු. 20,000/- සීමාවේ අත්තිකාරම් ලබා ගෙන එම කාර්යයන් ඉටු කළ නොහැකි ය .

උදා :- පාලක සහා සාමාජික ගාස්තු, ගමන් වියදම් සහ, සංග්‍රහ කටයුතු සඳහා 2010 නොවැම්බර් මාසය සඳහා රු. 27,500/- ක අත්තිකාරම් මුදලක් ලබා දීමට සිදු වී ඇත.
(2011 ජූනි රු. 59,500/-)

(ආ) අතුරු අග්‍රිමයක් ලබා දීමේ දී එම කාර්යය නිම වූ විගසම අත්තිකාරම් මුදල පියවිය යුතු වුවත්, රු.78,527/- ක් මෙතෙක් පියවා නොමැති වී ඇත්තේ අදාළ ආයතන විසින් එවා ඇති බිල්පත් අස්ථානගත වී ඇති බැවිනි. ඒවා නැවත ලබා ගැනීමට අවශ්‍ය කටයුතු කරනු ඇති අතර ඒ අනුව එම අත්තිකාරම් පියවීමට කටයුතු කරනු ලැබේ.

(ඇ) අතුරු අග්‍රිමයන් ලබා දීමේ දී හුදෙක් මාණ්ඩලික නිලධාරීන්ට ලබා දියයුතු වුවත්, මෙම විශ්වවිද්‍යාලයේ රැස්වීම් හා නඩත්තු කටයුතු වෙනුවෙන් අදාළ විෂය ලිපිකරුවන් වෙත ද අත්තිකාරම් ලබාදීමට සිදුවන අවස්ථා ද ඇත. එසේ නොවේ නම් දෛනික කටයුතු පවත්වාගෙන යෑම දුෂ්කර වේ.

අතුරු අග්‍රිම ලබා දීමේ දී මුදල් රෙගුලාසි 371(2)(ආ) ප්‍රකාරව කටයුතු කළ යුතු වුව ද මෙම විශ්වවිද්‍යාලයේ විශේෂ අවස්ථා වලදී එම මු.රෙ ප්‍රකාරව කටයුතු කළ නොහැකි බැවින් මුදල් අංශයට ඇතිවන ගැටළු නිරාකරණය කර ගැනීම සඳහා ආයතනික චක්‍රලේඛනයක් නිකුත් කර මුදල් කමිටුවේ අනුමැතිය ලබාගෙන ඇත.

II. මෙම රු. 20,000/- ට අදාළ විස්තර සැපයුම්කරුවන් වෙත දන්වා යැවීමට කටයුතු කර ඇත.

III. 2010 වර්ෂයට අදාලව භාණ්ඩ සමීක්ෂණය පහත සඳහන් අංශ වලට අදාලව පවත්වා ඇත.

**1 බාහිර විභාග අංශය**

සමීක්ෂණ කටයුතු සිදු කිරීමට අදාළ නිළධාරීන් දැනුවත් කර ඇතත්, දැනට සමීක්ෂණ පවත්වා ශේෂ තහවුරු කර නැති අංශ වල වහාම සමීක්ෂණය පවත්වා අවශ්‍ය කටයුතු කිරීමට සටහන් කර ගන්නා ලදි.

ඉ. I. දැනට ආචාර්යවරුන් නිවාඩු ලබා ගැනීමේ දී ඒ සඳහා නිවාඩු සලකුණු කිරීමේ ක්‍රමවේදයක් පවතින බව සඳහන් කළ යුතුය. මේ සම්බන්ධයෙන් පෙන්වා දී ඇති පරිදි ගැටළුවක් පවතින්නේ නම් ඒවා ඉදිරියේ දී නිවැරදි කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ඇති බවත් වාර්තා කරමි.

II. පෞද්ගලික ලිපිගොනු 13ක පැවති එක් එක් අඩුපාඩු හඳුනාගත් අතර, එම අඩුපාඩු ආයතන සංග්‍රහය ප්‍රකාරව නිවැරදි කරගෙන යන බවත්, ඒ සම්බන්ධයෙන් ආයතනික චක්‍රලේඛයක් ද, නිකුත් කර ඇති බව සඳහන් කරමි. (ආයතනික චක්‍රලේඛය හා හඳුනාගත් අඩුපාඩු සම්බන්ධයෙන් සකස් කළ වාර්තාවේ පිටපතක් අමුණා ඇත)

III. එක් එක් අධ්‍යයනාංශවල පැමිණීමේ ලේඛණයන් පවත්වා ගත යුතු බවත් ඇතැම් අධ්‍යයනාංශවල (සේවකයන් සිටින) පැමිණීමේ ලේඛණ පවත්වාගෙන යනු ඇත. දැනටමත් පැමිණීමේ ලේඛණ පවත්වාගෙන යනු ලැබේ.

දේශකවරුන්ගේ පැමිණීම සනාථ කිරීම සඳහා දැනටමත් ක්‍රමවේදයක් පවතින අතර ඒ අනුව බාහිර දේශකවරුන් සඳහා ගෙවීම් කරනු ලැබේ.

දැනටමත් මේ පිළිබඳ ඉහත සඳහන් පරිදි කටයුතු කරන අතර තවදුරටත් විධිමත් කිරීම සඳහා පීඨාධිපතිවරු ඇතුළුව සියලුම අධ්‍යයනාංශාධිපතිවරු ලිඛිත ව දැනුවත් කිරීමට මහෝපාධ්‍යායයන් වහන්සේ විසින් කටයුතු කර ඇත.

ඊ. මේ වර්ෂයේදී චක්‍රලේඛ පරිදි සියළු වාහනවල දුම් පරීක්ෂාව සිදු කිරීමට සටහන් කර ගතිමි.

උ. (අ) 2010 වර්ෂය දක්වා රු. 3,855.206/- ක මුදලක් සේවක අර්ථසාධක අරමුදලට හා සේවා නියුක්ති භාර අරමුදලට වැඩියෙන් ගෙවා ඇති අතර, මෙම තත්ත්වය ඉදිරියේදී වලක්වා ගැනීම පිණිස 2011 මාර්තු මස සිට වහාම ක්‍රියාත්මක වන පරිදි දායක මුදල් ගෙවීමේ දී අධ්‍යයන දීමනාව සැලකිල්ලට නොගැනීමට පාලක සභාව තීරණය කර ඇත. ඒ අනුව මුදල් අංශය විසින් මාර්තු මාසයේ සිට වැටුප් ගෙවීමේ දී ඉහත කී තීරණය පරිදි ක්‍රියා කිරීමට කටයුතු කරනු ඇත.

(ආ) 2010 වර්ෂයේ මහාචාර්යවරයෙකු විශ්‍රාම නොගිය අතර එවැනි පාරිතෝෂික දීමනා ගෙවීමක් ද සිදු නොකර ඇත.

**2.2.5 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු**

2010 වර්ෂයේ ආයෝජන ආදායම් වූ රු.384,942/- ක මුදල මෙම වර්ෂයේ දී විශ්වවිද්‍යාල පොදු ගිණුමට බැර කිරීමට අදාළ කටයුතු සිදු කරනු ඇත.

**2.2.6 අවිධිමත් ගනුදෙනු**

ධර්ම සන්නිවේදන ඩිප්ලෝමා පාඨමාලාව සඳහා 2007 වර්ෂයේ රු. 161,900.00 ක්ද 2008 වර්ෂයේ රු. 175,000.00 ක්ද වශයෙන් ප්‍රතිපාදන වෙන්කර ඇත. 2009 වර්ෂයට අදාලව ප්‍රතිපාදන වෙන් වී නොමැත.

එමෙන්ම විදේශ ධර්මදූත සේවා සඳහා 2007 වර්ෂයේ දී රු. 175,000/- ක් ප්‍රතිපාදන ලෙස වෙන් කර ඇත. 2008 හා 2009 වර්ෂ සඳහා ප්‍රතිපාදන වෙන් වී නොමැති අතර මෙම ප්‍රතිපාදන දේශන ගාස්තු, ගමන් ගාස්තු, ලේඛකාධිකාරී දීමනා, නියෝජ්‍ය ලේඛකාධිකාරී දීමනා, කම්කරු දීමනා, ලිපිකරු දීමනා, ආදිය සඳහා දරා ඇති බැවින් බාහිර පාඨමාලා ව්‍යාපෘති 02 ක් සඳහා ප්‍රතිපාදන ඉක්මවා වියදම් කර ඇති රු. 156,059/- මුදල දැනට බුද්ධශාසන අමාත්‍යාංශයෙන් හා බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුවෙන් අයකර ගැනීමට නොහැකි අතර එම මුදල දරා ඇත්තේ අනෙකුත් බාහිර පාඨමාලාවලින් ලැබුණු ආදායමෙනි. එම වැඩිපුර දරන ලද මුදල් රජයේ ආධාර මුදලින් දරා නොමැති බව තවදුරටත් දන්වා සිටිමි.

**3. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය**

**3.1 මූල්‍ය සමාලෝචනය**

**3.1.1 මූල්‍ය ප්‍රතිඵල**

**3.2 මෙහෙයුම් සමාලෝචනය**

**3.2.1 කාර්ය සාධනය**

**(අ) අරමුණු ඉටු කර ගැනීම.**

I ජියුන් බෞද්ධ පර්යේෂණ හා ප්‍රකාශන අරමුදලෙන් ආධාර ඉල්ලුම් කළ හැක්කේ බෞද්ධ අධ්‍යයනයට හා පාලි භාෂාවට පමණක් සීමා වූ පර්යේෂණය සඳහා පමණි. එවැනි පර්යේෂණ කෘති ඉදිරිපත් කළ යුත්තේ අදාල විෂය සහිතව පිළිගත් විශ්වවිද්‍යාලයකින් උපාධියක් ලත් තැනැත්තෙකුට හෝ ප්‍රාචීන උපාධිලාභියෙකුට පමණි. එවැනි ඉල්ලීමක් මෙතෙක් ලැබී නැත.

II මහෝපාධ්‍යාය අරමුදල පිහිටුවීමේ නිර්නායක අනුව මෙවැනි අවස්ථාවල දී සුභසාධන කටයුතු සඳහා වැය කිරීමට බාධාවක් නොමැත.

III 1984 වර්ෂයේ සිට 2010 වර්ෂය දක්වා උපාධිලාභීන් හා ඩිප්ලෝමාධාරීන් 4996 ක් බිහිකර ඇත. විශ්වවිද්‍යාලයේ පවත්වන පරීක්ෂණ හා ඊට බඳවා ගනු ලබන සුදුසුකම් විශේෂී තත්ත්වයන් මත පදනම්ව ඇති බැවින් පනතේ අරමුණුවලට අදාලව උපාධිධාරීන් හා ඩිප්ලෝමාධාරීන් 4996 ක් බිහිකිරීම සැලකිය යුතු තත්ත්වයක් බවට සඳහන් කළ යුතුය.

**(ආ) ශිෂ්‍යයන් බඳවා ගැනීම.**

I. විශ්වවිද්‍යාලයට සිසුන් බඳවා ගනු ලබන සංඛ්‍යාව තීරණය කරනුයේ උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ අනුමැතියෙන් පසුව ය. එසේ අනුමැතිය ප්‍රකාරව සිසුන් බඳවා ගෙන ඇත. වාර්තාවේ සඳහන් පරිදි වැඩිම විදේශීය සිසුන් ප්‍රමාණයක් සිටින විශ්වවිද්‍යාලය මෙම විශ්වවිද්‍යාලය වේ. 2006 සිට 2010 දක්වා ලියාපදිංචි වූ අභ්‍යන්තර විදේශීය සිසුන් ගණන 284 කි.

පුස්තකාලය, පීඨ පරිපාලන ගොඩනැගිලි, දේශනශාලා, ශ්‍රවනාගාරය, පොදු පහසුකම් ගොඩනැගිල්ල, පරිපාලන ගොඩනැගිල්ල ආදිය ඉදිකරන ලද්දේ විශ්වවිද්‍යාලයේ ඉදිරි අවශ්‍යතා සැලකිල්ලට ගෙන ය. එක් එක් පරිපාලන අංශයන් එවකට පවත්වාගෙන යන ලද්දේ දේශනශාලා වල ය. සිසුන් 50ක් බඳවා ගත් විශ්වවිද්‍යාලය ක්‍රමානුකූලව දේශීය සිසුන් 110 දක්වා වැඩිකර ඇත. මේ අතර විදේශීය සිසුන් සීමාවකින් තොරව බඳවා ගනු ලැබේ. යම් හෙයකින් නේවාසිකාගාර පහසුකම් සැලසීමට අවශ්‍ය ඉදිකිරීම් කළේ නම් ශිෂ්‍යයින්ට අවශ්‍ය අනෙකුත් යටිතල පහසුකම්වලදී බොහෝ දුෂ්කරතා මතුවනු ඇත. මේ නිසා රු. මිලියන 512 ව්‍යාපෘතියේ උක්ත පහසුකම් සලසමින් ඉදිරි වර්ෂ 05 ඇතුලත වැඩි ප්‍රමාණයක් සිසුන් බඳවා ගැනීම සඳහා නේවාසිකාගාර පහසුකම් ලබා දීමට අවශ්‍ය යටිතල පහසුකම් සැපයීමට සංයුක්ත සැලැස්මේ සැලසුම් කර ඇත.

(II)

**(ඇ) අධ්‍යයන කාර්ය සාධනය**

1 සමස්ථයක් වශයෙන් විශ්වවිද්‍යාලයේ ශිෂ්‍යයන් සඳහා ප්‍රමාණවත් මට්ටමක දේශන පවත්වා ඇති බවට සඳහන් කරමි.

ශිෂ්‍යයන් දේශනවලට සහභාගී නොවීම වැනි කරුණුවලදී ඇතැම් දේශන පැවැත්වීමට අවස්ථාවන් නොවන බව ද පෙන්වා දිය යුතුය.

විශ්වවිද්‍යාලය ශිෂ්‍යයාගෙන් අපේක්ෂා කරන මට්ටමේ දැනුම සඳහා ඉවහල් වන හා ඊට ආනුෂාංගික විෂය දැනුම ලබා දී ඇත.

11 සිසුන් සඳහා ප්‍රමාණවත් මට්ටමක දේශන පවත්වා ඇත. විගණනයේ දී ඇතැම් දේශන සම්බන්ධයෙන් තොරතුරු ඉදිරිපත් නොවීම නිසා සිදු කරන ලද දේශන සංඛ්‍යාවේ අඩු ප්‍රතිශතයක් ලෙසට වාර්තා වී ඇත.

අධ්‍යයනාංශයන් සඳහා ලිපිකරුවන්, කම්කරුවන් ආදී අනධ්‍යයන කාර්යමණ්ඩලයන් සිටිය යුතු අතර දේශන වලට සිසුන් සම්බන්ධ වීමේදී ඊට අවශ්‍ය කරන පැමිණීම් ලේඛන ලබාදීම ඒවා එකතු කිරීම් හා වාර්තා තැබීම ඔවුන් මගින් ඉටු වේ. එහෙත් එවැනි පහසුකම් නොතිබීම හේතුවෙන් සිදුකර ඇති ඇතැම් දේශන විගණනයට ලක් නොවී මගහැරී ගොස් ඇත. එබැවින් පාඨමාලා වල ගුණාත්මක බවට අවශ්‍ය කරන ප්‍රමාණාත්මක දේශන සංඛ්‍යාවක් පවත්වා ඇති බවට සඳහන් කරමි.

111 විශ්වවිද්‍යාලයේ පවත්වන පාඨමාලා සඳහා ප්‍රමාණවත් ස්ථිර ආචාර්යවරුන් පිරිසක් දැනට විශ්වවිද්‍යාලයේ නොමැති අතර ජ්‍යෙෂ්ඨ ආචාර්යවරුන්ද, අංශාධිපති, පීඨාධිපති ආදී විවිධ පරිපාලන තනතුරු හොබවමින් විශ්වවිද්‍යාලයේ අධ්‍යයන, පරිපාලන රාජකාරි වල නිරත වේ. එමෙන්ම විෂයයන් වලට අවශ්‍ය විවිධ දැනුම සඳහා ක්ෂේත්‍රයේ විද්වතුන්ගේ සේවය ලබාගත යුතුය. එය අවශ්‍යයෙන්ම කළ යුත්තකි. අළුතින් විශ්වවිද්‍යාලයට ආචාර්යවරුන් බඳවා ගැනීමට අවසරය පතා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවට දන්වා ඇත.

IV. ස්ථිර ආචාර්යවරුන් 21 කි. එයින් මහෝපාධ්‍යායයන් වහන්සේ, පීඨාධිපතිවරු දෙදෙනා සහ අනෙකුත් අධ්‍යයනාංශාධිපතිවරු ලෙස ආචාර්ය මණ්ඩලයේ 10 දෙනෙක් පරිපාලන කටයුතු සිදු කරන බැවින් එම පරිපාලන කටයුතු සිදුකරමින් ම මෙම කටයුතු ද ඉටු කරනු ලැබේ. මේ ආකාරයෙන් පරිපාලන කටයුතුවල නිරත ව සිටින බැවින් ස්ථිර කථිකාචාර්යවරුන්ට සාපේක්ෂව තාවකාලික සහ ආධුනික කථිකාචාර්යවරුන් විසින් වැඩි පැය ගණනක් දේශන පවත්වා ඇත.

### 3.2.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

(අ) පාලක සභා තීරණය අනුව ආපනශාලාවට ගෑස් සපයා ඇත.

(ආ) මෙම විශ්වවිද්‍යාලය පාර්ලිමේන්තු පනතක් මගින් ස්ථාපිත විශ්වවිද්‍යාලයකි. 1995 අංක 37 දරන ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයීය පනතින් සංශෝධිත 1981 අංක 74 දරණ ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාල පනතට අනුව කිසිදු ආයතනයකට බදු මුදල් ගෙවිය නොහැකිය.

### 3.2.3 වෙනත් රාජ්‍ය ආයතනවලින් ලබාගත් සම්පත්

අමාත්‍යාංශයට පවරා ගැනීමට 2009 වර්ෂයේදී දන්වා ඇත. කාලය ඉක්ම වූ වසර 15 කටත් වඩා පැරණි වාහන වේ.

### 3.2.4 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

විශ්වවිද්‍යාලයේ ශිෂ්‍යයන්ගේ ප්‍රධාන උත්සව (සාහිත්‍ය උත්සවය ඇතුළු) අධ්‍යයන හා අනධ්‍යයන කාර්යමණ්ඩල වල වැඩසටහන් සඳහා මෙම ගොඩනැගිල්ල ප්‍රයෝජනයට ගෙන ඇත.

### 3.2.5 කාර්ය මණ්ඩල පිරිවැය

<u>අනධ්‍යයන</u>

| | | |
|---|---|---|
| සහකාර ලේඛකාධිකාරී | 02 | (බඳවා ගැනීමට කටයුතු කර ඇත. මැතිවරණය නිසා කල් දමා ඇත) |
| ලිපිකරු | 04 | (ලිපිකරු 03ක් දැනට බඳවා ගෙන ඇත) |
| පුස්තකාල සහකාර | 01 | |
| ලඝු යතුරු ලේඛක | 01 | |
| පුස්තකාල සහායක | 01 | |
| යන්ත්‍ර ක්‍රියාකරු තණකොළ | 01 | |
| අරක්කැමි | 02 | |
| උද්‍යාන කම්කරු | 01 | |
| සනීපාරක්ෂක කම්කරු | 02 | |

<u>අධ්‍යයන</u>

| | | |
|---|---|---|
| මහාචාර්ය | 02 | |
| ඉංග්‍රීසි උපදේශක | 01 | |
| සහකාර පුස්තකාලයාධිකාරි | 01 | (දැනට බඳවා ගෙන ඇත) |

මෙම සියලුම තනතුරු බඳවා ගැනීමට ක්‍රියාකර ඇත. බඳවා ගැනීම් පරිපාටියට අනුව ඇතැම් තනතුරු සඳහා අමාත්‍යාංශයෙන් ලබා ගත යුතු නාමලේඛන ලබා ගැනීමටත් ක්‍රියාකර අදාල විභාග පවත්වා ඇතැම් තනතුරු පුරවා ඇත. විශේෂයෙන් මහාචාර්ය තනතුරුවලට සුදුස්සන් නොසිටීම හේතුවෙන් තවම එම තනතුරු දෙක පිරවීමට නොහැකි වී ඇත. පවතින චක්‍රලේඛවලට පරිබාහිරව බඳවා ගැනීම් සිදු කළ නොහැකිය. මෙම වර්ෂයේ දී අවශ්‍යතා පරිදි ඉහත පුරප්පාඩු පිරවීමට කටයුතු කරනු ඇත.

## 4. පද්ධති හා පාලන

විශේෂ අවධානය යොමු කිරීමට සටහන් කර ගන්නා ලදි.

**මහාචාර්ය පූජ්‍ය ඉත්තදෙමලියේ ඉන්දසර ස්ථවිර**
**මහෝපාධ්‍යායයන් වහන්සේ**

# ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය

ආයතනික චක්‍රලේඛ අංක - 60

2011.01.17

පීඨාධිපති (බෞද්ධ අධ්‍යයන),
පීඨාධිපති (භාෂා අධ්‍යයන),
ලේඛකාධිකාරී,
පුස්තකාලයාධිකාරී,
මූල්‍යාධිකාරී,
නියෝජ්‍ය ලේඛකාධිකාරී,
ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී (පාලන),
සහකාර ලේඛකාධිකාරී (අධ්‍යයන හා ශිෂ්‍ය සේවා),
සහකාර ලේඛකාධිකාරී (අභ්‍යන්තර විභාග),
සහකාර අභ්‍යන්තර විගණක,
වැඩ ඉංජිනේරු,

**අධ්‍යයන නිවාඩු සහ දිවයිනෙන් බැහැරව යාම සඳහා නිවාඩු ලබා ගැනීම.**

විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩලය අධ්‍යයන නිවාඩු සහ දිවයිනෙන් බැහැරව යාමේදී ඒ සඳහා චක්‍රලේඛ ප්‍රකාරව නිසි පරිදි නිවාඩු ඉල්ලුම්පත්‍ර හා අදාළ ගිවිසුම් ඇතුළු අනෙකුත් ලිපි ලේඛන ඉදිරිපත් නොකිරීම නිසා නිවාඩු අනුමත කිරීමේදී විවිධ ගැටලු පැනනැගී ඇත. ඒ පිළිබඳ අවධානය යොමු කළ 2010.12.29 දින පැවති නිවාඩු කමිටුව හා 2010.12.10 දින පැවති විගණන හා කළමනාකරණ කමිටුව නිවාඩු ලබා ගැනීමේදී අනුගමනය කළ යුතු ක්‍රමවේදය ඇතුළත් කර ආයතනික චක්‍රලේඛයක් නිකුත් කිරීමට උපදෙස් ලබා දී ඇත.

ඒ අනුව පහත කරුණු අනුගමනය කිරීම අවශ්‍ය වේ.

1. පාලන අංශයේ අදාල විෂය ලිපිකරුවන්ගෙන් අදාල නිවාඩු ඉල්ලුම්පත්‍රය හා එයට අදාල ගිවිසුම් හා වෙනත් ලිපි ලේඛන නිසි පරිදි සම්පූර්ණ කර, අධ්‍යයන කාර්ය මණ්ඩලය අංශ ප්‍රධාන හා පීඨාධිපති මගින් මහෝපාධ්‍යායයන් වහන්සේ වෙත ද පරිපාලන නිළධාරීන් හා අනධ්‍යයන කාර්ය මණ්ඩලය අදාල අංශ ප්‍රධාන මගින් ලේඛකාධිකාරී වෙත ද ඉදිරිපත් කළ යුතුය.

2. ඒ ඒ වර්ෂ සඳහා සැලසුම් කළ රැස්වීම් කාලසටහනේ දැක්වෙන පරිදි නිවාඩු ඉල්ලුම් කිරීමේදී නිවාඩු කමිටුවට යොමු කර අනුමැතිය ලබා ගත යුතු බැවින් එම කමිටුව පැවැත්වෙන දිනයන්ට ප්‍රථම අදාල අයදුම්පත්‍ර හා ගිවිසුම් ඇතුළු අනෙකුත් අදාල ලේඛන ඉදිරිපත් කිරීමට වග බලා ගත යුතු වේ.

3. පාලක සභා අනුමැතියෙන් පසු නිසි ලෙස සම්පූර්ණ වූ අයදුම්පත් හා අදාල ලේඛන පමණක් උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමට කටයුතු කරන අතර, අසම්පූර්ණ හා අදාල ලේඛන නොමැති අයදුම්පත් අසම්පූර්ණ බවට සඳහන් කර අමාත්‍යාංශය වෙත දැන්වීමට සිදුවනු ඇත.

4. උසස් අධ්‍යාපන අමාත්‍යාංශය වෙත විදේශ ගත වන දිනට දින 14කටවත් කලින් නිර්දේශිත අයදුම්පත්‍ර ඉදිරිපත් කළ යුතු බැවින් ප්‍රමාණවත් කාලයක් තුළ අයදුම්පත්‍ර ඉදිරිපත් කළ යුතුය.

5. නිවාඩු අනුමැතියකින් තොරව යාන පත්‍ර මිල දී ගෙන හදිසි අවශ්‍යතාවක් යැයි සලකා තම අභිමතය පරිදි විදේශ ගත වීමකදී විශ්වවිද්‍යාලය ඒ සම්බන්ධව වග කියනු නොලැබේ.

6. විදේශගත වීමකදී එම අවස්ථාවට උචිත ලෙස කටයුතු කිරීමේ බලය මහෝපාධ්‍යායයන් වහනේසේ සතු වේ.

සැ.යු - සියළුම අංශ ප්‍රධානීන් ඇතුළු කාර්ය මණ්ඩලය දැනුවත් කිරීමට පියවර ගන්න.

**මහාචාර්ය පූජ්‍ය ඉත්තදෙමලියේ ඉන්දසර හිමි.**
**මහෝපාධ්‍යායයන් වහන්සේ**

පිටපත - දැන්වීම් පුවරුවට

# ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය

බීපීයූ/ඒබී-04/34

2010.09.07

ලේඛකාධිකාරී,
ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය.

**<u>නිවාඩු ලබා අධ්‍යයන කටයුතුවල නිරතව සිටින හෝ වෙනත් කාර්යයන් සඳහා නිවාඩු ලබා සිටින කාර්ය මණ්ඩලයේ ගිවිසුම් නීත්‍යානුකූලව යාවත්කාලීන කිරීම.</u>**

ඉහත කරුණට අදාළව මා වෙත යොමු කළ 2010.09.02 දිනැති ලිපිය හා බැඳේ. ඒ අනුව අදාල වාර්තාව සමඟ ඉදිරිපත් කරමි.

**01. ජ්‍යෙෂ්ඨ මහාචාර්ය පූජ්‍ය උතුරාවල ධම්මරතන ස්වාමීන් වහන්සේ**
**පීඨාධිපති (භාෂා අධ්‍යයන)**

2003.08.07 දිනැති ලිපියකින් කළ ඉල්ලීම අනුව 2003.08.26 දින පැවති 223 පාලක සභාව ආචාර්ය උපාධි පර්යේෂණ කටයුතු සඳහා චීන මහජන සමූහාණ්ඩුව විසින් ප්‍රදානය කර ලැබූ ශිෂ්‍යත්වයක් මත එරට Sichaan විශ්වවිද්‍යාලයේ පර්යේෂණ කටයුතු සඳහා 2003 අගෝස්තු මස 26 දින සිට වර්ෂ දෙකකට වැටුප් සහිත අධ්‍යයන නිවාඩු ලබා දී ඇත.

2005.04.28 වන දින පැවති 242 පාලක සභාව 2005.08.26 දින සිට අධ්‍යයන අංශ සඳහා තවත් වර්ෂයක් ලබා දී ඇත. 2006.08.27 දින පැවති 258 වන පාලක සභාව ඉදිරි මාස 09ක කාලය සඳහා වැටුප් සහිත නිවාඩු ද ඉතිරි මාස 03 ලබා ගන්නේ නම් වැටුප් රහිත නිවාඩු ද අනුමත කර ඇත.

2007.06.20 වන දින පැවති අධ්‍යයන නිවාඩු අවසානයේ විශ්වවිද්‍යාල සේවයට වාර්තා කර ඇත. මෙම අධ්‍යයන නිවාඩු කාලසීමාව සඳහා ගිවිසුමක් අත්සන් කළ බවට පෞද්ගලික ලිපිගොනුවෙන් කරුණු සනාථ නොවේ.

**02. පූජ්‍ය මොරගොල්ලාගම උපරතන ස්වාමීන් වහන්සේ**
**(ආධුනික කථිකාචාර්ය)**

2007.07.31 දින පැවති 269 වන පාලක සභාව විසින් චීන මහජන සමූහාණ්ඩුව විසින් පිරිනමන ලද බව සඳහන් පශ්චාද් උපාධි ශිෂ්‍යත්වය සඳහා 2007.01.09 දින Wohan ප්‍රාන්තයේ Wohan විශ්වවිද්‍යාලයට අධ්‍යයන කටයුතු සඳහා නිවාඩු අනුමත කර ඇත. විදේශගත වීමට ආළව නිවාඩු අනුමත කළ බව දන්වා යැවූ ලිපියක් පෞද්ගලික ලිපිගොනුවෙහි නොමැත.

2010.03.15 දින නැවත විශ්වවිද්‍යාලයට පැමිණි බව සඳහන් කර ඇත. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 920ට අනුව නැවත නව ගිවිසුමක් අත්සන් කල යුතුය. උන් වහන්සේ 2010.09.02 දිනැතිව ලිපියෙන් 2010.09.10 දින සිට නැවත වරක් විදේශගත වන බව දන්වා ඇත.

පූජ්‍ය මොරගොල්ලාගම උපරතන හිමියෝ 2007 අගෝස්තු 20 විශ්වවිද්‍යාල සමඟ ගිවිසුමකට එළඹ ඇත. එම ගිවිසුමේ ,

I. අංක 05 හි (8) සම්පූර්ණ කර නොමැත.
II. අංක 09 හි (9) සම්පූර්ණ කර නොමැත.
III. අංක 12 සම්පූර්ණ කර නොමැත.
IV. අංක 11 සම්පූර්ණ කර නොමැත.
V. විශ්වවිද්‍යාල පාර්ශවයේ II වන සාක්ෂිය අත්සන් කර නොමැත.

පාලක සභා තීරණයක් හෝ එම අනුමැතිය මත නිකුත් කල නිවාඩු ලබා දීමේ ලිපියක් පෞද්ගලික ලිපිගොනුවේ නොමැත.

**03. ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය පූජ්‍ය දුනුකේවත්තේ ගුණරතන ස්වාමීන් වහන්සේ (ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය)**

2006.10.18 දිනැති ලිපියෙන් 2007.01.04 දින සිට අධ්‍යයන නිවාඩු ඉල්ලීම් කර ඇත. ඒ අනුව 2007.05.07 දින සිට 2009.05.07 දින දක්වා අධ්‍යයන කටයුතු සඳහා වසර 02ක කාලයක් අධ්‍යයන නිවාඩු ලබාගෙන ඇත. අනුමැතිය ලබා දුන් ලිපි කිසිවක් නොමැත. 2009.08.19 දින පැවති අධ්‍යයන නිවාඩු කමිටුව විසින් 2009.05.07 දින සිට තවත් වසරක අධ්‍යයන නිවාඩු අනුමත කර ඇත. ඒ අනුව වසර තුනක අධ්‍යයන නිවාඩු ලබා ඇත. 2010.05.04 දින සේවයට වාර්තා කර ඇත.

එම නිවාඩු අනුමත කිරීම සම්බන්ධව පාලක සභා තීරණයක් පුද්ගලික ලිපිගොනුවේ නොමැත. එමෙන්ම නිවාඩු අනුමත කළ බවට කිසිදු ලිපියක් පුද්ගලික ලිපිගොනුවේ නොමැත. මෙම වර්ෂ තුනක නිවාඩු ලබා ගැනීම වෙනුවෙන් ගිවිසුමක් අත්සන් කළ බවට කරුණු නොමැත.

**04. සමන්ත ඉලංගකෝන් මහතා (ආධුනික කථිකාචාර්ය)**

2007.01.30 දින පැවති 263 වන පාලක සභාව 2006.10.08 දින සිට 2007.10.07 දින දක්වා අධ්‍යයන නිවාඩු අනුමත කර ඇත. ඒ බව 2007.04.09 දිනැති ලිපියෙන් දැනුම් දී ඇත.
අධ්‍යයන නිවාඩු ලබාගෙන මාස 05ක් ඉක්ම ගිය පසු 2007.03.01 දින සේවයට වාර්තා කර ඇත. 2009.01.08 දිනැති ලිපියෙන් ඉතිරි මාස 07ක කාලය 2009.02.01 දින සිට ලබාදෙන ලෙස ඉල්ලීමක් කර ඇත.

ඒ අනුව 2009.03.30 දිනැති ලිපියෙන් 2009.03.01 දින සිට පශ්චාද් උපාධි කටයුතු සඳහා ඉතිරි අධ්‍යයන නිවාඩු අනුමත කර ඇත. නැවත 2009.09.22 දිනැති ලිපිය අනුව 2009.09.22 දින සේවයට වාර්තා කර ඇත. ලබාගත් වසරක නිවාඩු සඳහා කිසිදු ගිවිසුමක් අත්සන් කර නොමැත.

**05. ආචාර්ය නෙළුවේ සුමනවංශ ස්වාමීන් වහන්සේ (ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය)**

190 වන පාලක සභාව විසින් දිල්ලි විශ්වවිද්‍යාලයේ ආචාර්ය උපාධි හැදෑරීම සඳහා වසර 02ක වැටුප් සහිත නිවාඩු 2001.08.21 දින සිට 2003.08.20 දින දක්වා ලබා දී ඇත.

2003.05.27 දින පැවති 220 වන පාලක සභාව 2003.08.21 දින සිට 2004.08.20 දින දක්වා තවත් වසරක අධ්‍යයන නිවාඩු දීර්ඝ කර ලබා දී ඇත. 2004.07.05 දින නැවත සේවයට වාර්තා කර ඇත. එහෙත් විදේශගත වීමේදී ගිවිසුමක් අත්සන් කළ බවට පෞද්ගලික ලිපිගොනුව අනුව සනාථ නොවේ.

**06. පූජ්‍ය මාවතගම ප්‍රේමානන්ද ස්වාමීන් වහන්සේ**
**( ආධුනික කථිකාචාර්ය)**

2006.03.28 දින පැවති 253 වන පාලක සභාවට 2006.04.20 දින සිට වසරක අධ්‍යයන නිවාඩු දේශනවලින් අඩක් පැවැත්වීමට යටත්ව ලබා දී ඇත. 2007.04.20 දින සිට තවත් මාස 06ක අධ්‍යයන නිවාඩුවක් ලබාදෙන ලෙස 2007.03.21 දිනැති ලිපියෙන් ඉල්ලීමක් කර ඇත. ඒ අනුව නිවාඩු ලබාගෙන ඇත. 2007.10.19 දින නැවත සේවයට වාර්තා කර ඇත.

මාස 06 ක කාලය සඳහා නිවාඩු අනුමත කළ ලිපියක් නිකුත් කළ බවට හා මෙම වසර 01යි මාස 06 සඳහා ගිවිසුමක් අත්සන් කළ බවට තොරතුරු පෞද්ගලික ලිපිගොනුවේ නොමැත.

**07. කේ.ජී. ස්වර්ණානන්ද මහතා**
**(ආධුනික කථිකාරචාර්ය)**

298 වන පාලක සභාවේ තීරණය මත 2010.01.01 දින සිට 2010.10.30 දින දක්වා අධ්‍යයන නිවාඩු ලබා දී ඇත. 2010.06.11 දිනැති ලිපියෙන් 2010.06.14 දින සිට අධ්‍යයන නිවාඩු අවලංගු කර නැවත සේවයට කැඳවා ඇත. අදාල කාලය සඳහා ගිවිසුමක් අත්සන් කර නොමැත.

**08. එම්.ඒ. චන්ද්‍රානි මුණසිංහ මහත්මිය**
**(ජ්‍යෂ්ඨ කථිකාචාර්ය)**

225 වන පාලක සභාවේ තීරණය පරිදි 2004.01.01 දින සිට 2004.12.31 දින දක්වාත්, 2006.02.01 දින සිට 2006.10.01 දින දක්වාත් අධ්‍යයන නිවාඩු ලබා දී ඇත. පෞද්ගලික ලිපිගොනුව අනුව ගිවිසුමක් අත්සන් කළ බවට සඳහන් නොවේ.

**09. පූජ්‍ය පිටිගල විජිත ස්වාමීන් වහන්සේ**
**(ජ්‍යෂ්ඨ කථිකාචාර්ය)**

2007.05.02 දින සිට වසරක අධ්‍යයන නිවාඩු ලබාගෙන 2008.01.01 දින සේවයට වාර්තා කරන ලද බව පූජ්‍ය පිටිගල විජිත ස්වාමීන් වහන්සේ 2007.12.19 දින ඉදිරිපත් කළ ලිපියක් නිරීක්ෂණය වේ. එහෙත් පෞද්ගලික ලිපිගොනුව අනුව නිවාඩු අනුමත කිරීම, නිවාඩු අනුමත කිරීම පිළිබඳ දැනුම් දීම, පාලක සභාවේ තීරණය හෝ අත්සන් කරන ලද ගිවිසුමක් පිළිබඳ කිසිදු ලිපියක් නොමැත.

**10. පී.ආර්. වසන්ත ප්‍රියදර්ශන මහතා**
**(කථිකාචාර්ය - දැනට සේවයෙන් ඉල්ලා අස් වී ඇත)**

2008.01.01 දින සිට එක් වසරක අධ්‍යයන නිවාඩු ලබා ගෙන ඇත. 2008.04.01 දින සිට සේවයට වාර්තා කර ඇත. පෞද්ගලික ලිපිගොනුව අනුව පාලක සභා තීරණ හෝ නිවාඩු සඳහා අනුමැතිය දුන් ආකාරය පිළිබඳ අදාළ ලිපිලේඛන කිසිවක් නොමැත. 2007.07.31 දින පැවති 269 වන පාලක සභා තීරණය පරිදි 2007.11.01 දින සිට නිවාඩු ලබා දී ඇති බව තීරණය විය.

**11. එම්.එච්.පී.කේ. ගුණසේන මහතා**
**(ආධුනික කථිකාචාර්ය)**

2005.10.04 දින පැවති 250 වන පාලක සභාවේ තීරණය පරිදි 2005.11.08 දින සිට එක් වර්ෂයක අධ්‍යයන නිවාඩු ලබා දී ඇත. මේ සඳහා 2006.04.27 දින ගිවිසුමක් අත්සන් කර ඇත.

**12. කේ.ඒ.එස්.එන්. අමරසේකර මහත්මිය**
**(ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය)**

230 වන පාලක සභාවේ තීරණය පරිදි 2004.05.26 දින සිට වර්ෂ 1 සති 15 ක් විදේශ අධ්‍යයන නිවාඩු ලබා දී ඇත.

249 වන පාලක සභාව වැටුප් සහිතව 2006.05.26 දින තෙක් අධ්‍යයන නිවාඩු ලබා දීම අනුමත කර ඇත. 254 වන පාලක සභාව 2006.05.26 දින සිට 2006.06.20 දින දක්වා වැටුප් රහිත අධ්‍යයන නිවාඩු ලබා දී ඇත.

2006.06.15 දින දක්වා වැටුප් රහිත නිවාඩු ලබාගෙන ඇත. විදේශ අධ්‍යයන නිවාඩු සඳහා විශ්වවිද්‍යාලයේ ගිවිසුමක් මහෝපාධ්‍යායයන් වහන්සේ හා අමරසේකර මහත්මිය අත්සන් කර ඇත. ගිවිසුමේ සඳහන් අංක 9, 11 සහ 12 යටතේ ඇති කොටස් පමණක් සම්පූර්ණ කර නොමැත.

**13. පූජ්‍ය වාච්චේ ධම්මරක්ඛිත ස්වාමීන් වහන්සේ**
**(ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය)**

223 වන පාලක සභාව 2004.01.01 දින සිට වසරක අධ්‍යයන නිවාඩු අනුමත කර ඇත. නැවත 238 වන පාලක සභාවේ තීරණය පරිදි 2005.01.01 දින සිට 2005.12.31 දින දක්වා අධ්‍යයන නිවාඩු ලබා දී ඇත. මේ සඳහා ගිවිසුමක් අත්සන් කළ බවට පෞද්ගලික ලිපිගොනුව අනුව තොරතුරු හෙළි නොවේ.

දැනට නිරීක්ෂණය වූ කරුණු ඉහත පරිදි වේ. මෙම වාර්තාව අධ්‍යයන නිවාඩු කමිටුවට ඉදිරිපත් කිරීම සඳහා අනුමැතිය පතමි.

නියෝජ්‍ය ලේඛකාධිකාරී

## ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය

### අර්ථසාධක අරමුදල

### 2010 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය

(සංඛ්‍යා ආසන්න රුපියලට ගැලපුම් කර ඇත.)

| 2009 | විස්තරය | උපලේඛන | 2010 | |
|---|---|---|---|---|
| රු. | | අංකය | රු. | රු. |
| | **01. වගකීම්** | | | |
| 29,882,940 | දායක ශිණුම - සේවක | 01 | 34,152,623 | |
| 44,827,694 | දායක ශිණුම - සේව්‍ය | 01 | 51,230,880 | |
| **74,710,634** | | | **85,383,503** | **85,383,503** |
| | **02. සංචිත** | | | |
| 5,568 | සමුච්චිත ශේෂය | | | 7,973 |
| **74,716,202** | | | | **85,391,476** |
| | **නියෝජනය කරන්නේ** | | | |
| | **03. දිගුකාලීන වත්කම්** | | | |
| 52,234,533 | භාණ්ඩාගාර බිල්පත් | | 48,335,214 | |
| 18,297,269 | සේවක ණය | 02 | 23,605,531 | |
| **70,531,802** | | | **71,940,745** | **71,940,745** |
| | **04. ජංගම වත්කම්** | | | |
| 1,938,861 | ලැබිය යුතු පොලී | | 1,268,025 | |
| 191,095 | රඳවා ගැනීමේ බදු | | 191,095 | |
| 5,074,004 | බැංකුවේ ශේෂය | | 15,289,528 | |
| **7,203,960** | | | **16,748,648** | |
| | **05. අඩු කළා :** | | | |
| | **ජංගම බැරකම්** | | | |
| 195,488 | උපචිත වියදම් | | 255,487 | |
| 2,824,072 | විවිධ ණයහිමියෝ | 03 | 3,042,430 | |
| **3,019,560** | | | **3,297,917** | |
| 4,184,400 | ශුද්ධ ජංගම වත්කම් | | 13,450,731 | 13,450,731 |
| **74,716,202** | | | | **85,391,476** |

මහෝපාධ්‍යාය

පිටිපන උතුර, හෝමාගම.

2011.02.24

මූල්‍යාධිකාරී

## ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය

### <u>අර්ථසාධක අරමුදල</u>
### <u>2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා</u>
### <u>ආදායම් හා වියදම් ගිණුම</u>

| 2009 රු. | විස්තරය | | 2010 රු. | 2010 රු. |
|---|---|---|---|---|
| | **01. ආදායම්** | - | | |
| 8,306,623 | භාණ්ඩාගාර බිල්පත් පොලී | | 5,549,591 | |
| - | මිශ්‍ර ලැබීම් | | - | |
| **8,306,623** | දළ ආදායම | | **5,549,591** | **5,549,591** |
| | **02. අඩු කළා : වියදම්** | | | |
| 30,000 | විගණන ගාස්තු | | 60,000 | |
| 750 | වෙනත් වියදම් | | - | |
| 174,241 | අධි වෙන් කිරීම | | - | |
| **204,991** | | | **60,000** | **60,000** |
| | | | | **5,489,591** |
| | **අඩු කළා :** | | | |
| 830,662 | වර්ෂයේ ආදායම් බදු | | | 554,959 |
| **7,270,970** | ආදායම් බද්දට පසු අතිරික්තය | | | **4,934,632** |
| | **එකතු කළා :** | | | |
| 2,817 | පසුගිය වර්ෂයෙන් ඉ/ගෙ ශේෂය | | | 5,568 |
| **7,273,787** | | | | **4,940,200** |
| | **අඩු කළා :** | | | |
| | විසර්ජනයන් | | | |
| | දායක ගිණුම් සඳහා පොලී | | | |
| 2,907,288 | සේවක | - | 1,972,891 | |
| 4,360,931 | සේව්‍ය | - | 2,959,336 | |
| **7,268,219** | | | **4,932,227** | **4,932,227** |
| 5,568 | ශේෂය ඉ/ගෙ | | | 7,973 |

මහෝපාධ්‍යාය මූල්‍යාධිකාරී

පිටිපන උතුර, හෝමාගම.

2011.02.24

## ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය

## අර්ථසාධක අරමුදල

## 2010 දෙසැම්බර් 31 දිනට ශේෂ පිරික්සුම

| | විස්තරය | ලෙජර් පිටුව | හර | බැර |
|---|---|---|---|---|
| | | | රු. | රු. |
| **1.** | දායක ගිණුම - සේවක | **01-10** | - | 34,152,623 |
| **2.** | දායක ගිණුම - සේව්‍ය | **01-11** | - | 51,230,880 |
| **3.** | සමුච්චිත ශේෂය | **02-10** | - | 5,568 |
| **4.** | ආයෝජන - භාණ්ඩාගාර බිල්පත් | **03-10** | 48,335,214 | - |
| **5.** | සේවක ණය | **03-11** | 23,605,531 | - |
| **6.** | ලැබිය යුතු පොලී | **04-10** | 1,268,025 | - |
| **7.** | රඳවා ගැනීමේ බදු | **04-11** | 191,095 | - |
| **8.** | බැංකුවේ ශේෂය | **-** | 15,289,528 | - |
| **9.** | උපචිත වියදම් | **05-10** | - | 255,487 |
| **10.** | විවිධ ණයහිමියෝ | **05-11** | - | 3,042,430 |
| **11.** | ආයෝජන ආදායම් භාණ්ඩාගාර බිල්පත් | **06-10** | - | 5,549,591 |
| **12.** | දායක ගිණුම් සඳහා බැර කළ පොලිය | **07-10** | 4,932,227 | - |
| **13.** | ආදායම් බදු | **07-11** | 554,959 | - |
| **14.** | විගණන ගාස්තු | **07-12** | 60,000 | - |
| **15.** | වෙනත් වියදම් | **-** | - | - |
| **16.** | අධි වෙන් කිරීම | **-** | - | - |
| | | | 94,236,579 | 94,236,579 |

මහෝපාධ්‍යාය　　　　　　　　　　　　මූල්‍යාධිකාරී

පිටිපන උතුර,

හෝමාගම.

2011.02.24

සීඊ/ඊ/බීපීයූ/පීඑෆ්/එෆ්ඒ/10

2011 ජුනි 24 දින

මහෝපාධ්‍යායයන් වහන්සේ,
ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය.

**ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ අර්ථසාධක අරමුදලේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1981 අංක 74 දරන ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාල පනතේ 38 වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ අර්ථසාධක අරමුදලේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1981 අංක 74 දරන ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාල පනතේ 38 වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. යථෝක්ත මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ අදහස් දැක්වීම හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමණාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කළමණාකරණයේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාමත්, යෝග්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරා ගැනීම සහ යොදාගැනීමත්, අවස්ථාවෝචිතව සාධාරණ ලෙස ගිණුම්කරණ ඇස්තමේන්තු සකස් කිරීමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 1.3 විගණන විෂය පථය සහ මතය සඳහා පදනම

මාගේ විගණන පරීක්ෂණ මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මෙම වාර්තාවේ ඇතුළත් විගණන මතය, අදහස් දැක්වීම් සහ සොයාගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය සහ පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් සහ කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි. මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට අනුකූලව විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන අගයන් සහ හෙළි දරව් කිරීම් වලට උපකාරී වන සාක්ෂි නියැදි පදනම මත පරීක්ෂා කිරීම්, මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති හා වැදගත් ඇස්තමේන්තු සහ මූල්‍ය ප්‍රකාශන වල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ උපරිම දැනීම සහ විශ්වාසය පරිදි විගණන කටයුතු සඳහා අවශ්‍ය වන ප්‍රමාණවත් පදනමක් මාගේ විගණනය මගින් සපයන බව මාගේ විශ්වාසයයි.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1. මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ අර්ථසාධක අරමුදලේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, 2010 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ අර්ථසාධක අරමුදලේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

### 2.2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1. ලැබිය යුතු ගිණුම්

වසර කිහිපයකට පෙර මූල්‍ය ආයතන විසින් බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයට අයත් ස්ථාවර තැන්පතු වෙනුවෙන් ඉපයූ පොළී මුදලින් නියමිත ප්‍රමාණයට වඩා වැඩියෙන් දේශීය අදායම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබූ රඳවා ගැනීමේ බදු රු.191,095 ක මුදල සමාලෝචිත වර්ෂය අවසාන වන විටද නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 3. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 3.1. මූල්‍ය සමාලෝචනය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විශ්වවිද්‍යාලයේ අර්ථසාධක අරමුදලේ මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල ආදායම් බද්දට පෙර රු. 5,489,591ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂය සඳහා වූ අතිරික්තය රු.8,101,632 ක් වූයෙන් අතිරික්තයේ අඩුවීම රු. 2,,612,041 ක් විය. මේ සඳහා අරමුදලේ මුදල් ආයෝජිත භාණ්ඩාගාර බිල්පත් වල පොළී ප්‍රතිශතය අඩුවීම බලපා තිබුණි.

### 3.2 කාර්යය සාධනය

අරමුදලේ ප්‍රධාන ආදායම් මාර්ගය වන්නේ විශ්වවිද්‍යාලයේ ස්ථිර සේවකයින්ගේ මාසික ඉපයීම් වලින් අයකරන 10% ක දායක මුදල හා විශ්වවිද්‍යාලය මගින් එම ඉපයීම් මත ගෙවනු ලබන 15% ක මුදල වේ. අරමුදලේ මුදල්, භාණ්ඩාගාර බිල්පත් වල ආයෝජනය කිරීමත් සේවක ණය ලබා දීමත් සිදු කරනු ලබයි.

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයේ දී කල් පිරී තිබූ රු.11,500,000ක ආයෝජන නැවත ආයෝජනය කිරීම ප්‍රමාද වීම නිසා අරමුදලට රු. 29,982ක පාඩුවක් සිදු වී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී සාමාජිකයන්ට රු.8,169,110ක් ණය වශයෙන් ලබා දී තිබුණු අතර ඉකුත් වසරේදී ලබා දී ඇති රු.2,019,340 ක ණය මුදල හා සැසඳීමේදී 304.54%ක වැඩිවීමක් විය.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසාන වනවිට විවිධ හේතුන් මත අදාල ප්‍රතිලාභීන් 11 දෙනෙකු වෙත නිදහස් කළ නොහැකි වූ අර්ථසාධක අරමුදල් ප්‍රමාණය රු.3,042,430ක් විය.

## 4. <u>පද්ධති හා පාලන</u>

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර ආයතනයේ අවධානයට යොමු කරන ලදී. ණය ශේෂ නිරවුල් කිරීම කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(එච්.ඒ.එස්. සමරවීර)
වැඩබලන විගණකාධිපති

බීපීයූ/ඒබී-03/36 (2010)

2011.09.15

එච්.ඒ.එස්. සමරවීර මහතා,
විගණකාධිපති,
විගණකාධිපති දෙපාර්තමේන්තුව,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.

මහත්මයාණෙනි,

**<u>ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ අර්ථසාධක අරමුදලේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1981 අංක 74 දරන ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාල පනතේ 38 වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව</u>**

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1 ලැබිය යුතු ගිණුම්**

ස්ථාවර තැන්පතු වෙනුවෙන් ඉපැයූ පොළී මුදලින් නියමිත ප්‍රමාණයන්ට වඩා වැඩියෙන් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කළ පසු රඳවාගැනීමේ බදු රු. 191,095.00 ක මුදලක් 2010 වර්ෂයේදී නිරවුල් කර ගැනීමට නොහැකි වූ අතර, මේ සම්බන්ධව දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ බදු තක්සේරුකරු සමඟ දිගින් දිගටම සාකච්ඡා පවත්වන ලදී. ඒ අනුව මෙම මුදල විශ්වවිද්‍යාලය වෙත ලබාදීමට එකඟ වී ඇති අතර, ඒ සඳහා මූල්‍යාධිකාරී සහ බදු තක්සේරුකරු විසින් ගිවිසුමකට අත්සන් කරන ලදී. එම මුදල ඉක්මණින් ලබා දීමට කටයුතු කරන බව එම දෙපාර්තමේන්තුව විසින් දන්වන ලදී. ඒ අනුව දැනට මේ සඳහා ආදායම් බදු දෙපාර්තමේන්තුවෙන් රු. 129,306/- ක මුදලක් ලබා ගත් බව තවදුරටත් දැනුම් දෙමි.

**3 මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය**

**3.1 මූල්‍ය සමාලෝචනය**

**3.2 කාර්යය සාධනය**

(අ) මෙය 2011 ජනවාරි 07 වන දින නැවත ආයෝජනය කරන ලදී.

(ආ)
(ඇ) } වාර්තාවේ දක්වා ඇති නිරීක්ෂණ හා එකඟ වෙමි.

මහාචාර්ය පූජ්‍ය ඉත්තදෙමලියේ ඉන්දසර ස්ථවිර
මහෝපාධ්‍යායයන් වහන්සේ

# 16. උප ලේඛනය

1981 අංක 74 දරණ ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය පනත අනුව පත් කරන ලද මහෝපාධ්‍යායයන් වහන්සේලා

| | නම | තනතුර | සේවයට පත් වූ දිනය | සේවය අවසන් වූ දිනය |
|---|---|---|---|---|
| 01 | ආචාර්ය පූජ්‍ය කාක්කපල්ලියේ අනුරුද්ධ ස්වාමීන්ද්‍රයන් වහන්සේ | මහෝපාධ්‍යායය | 1982.01.15 | 1985.01.14 |
| 02 | ආචාර්ය පූජ්‍ය කාක්කපල්ලියේ අනුරුද්ධ ස්වාමීන්ද්‍රයන් වහන්සේ | මහෝපාධ්‍යායය | 1985.01.15 | 1988.01.14 |
| 03 | මහාචාර්ය පූජ්‍ය කුඹුරුගමුවේ වජිර ස්වාමීන්ද්‍රයන් වහන්සේ | මහෝපාධ්‍යායය | 1988.01.19 | 1991.01.18 |
| 04 | මහාචාර්ය පූජ්‍ය කුඹුරුගමුවේ වජිර ස්වාමීන්ද්‍රයන් වහන්සේ | මහෝපාධ්‍යායය | 1991.01.19 | 1994.01.18 |
| 05 | පූජ්‍ය අකුරටියේ නන්ද ස්වාමීන්ද්‍රයන් වහන්සේ | මහෝපාධ්‍යායය | 1994.01.19 | 1996.08.05 |

1995 අංක 37 දරන ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය (සංශෝධන) පනත ක්‍රියාත්මක වීමෙන් පසු පත් කරන ලද වැඩබලන මහෝපාධ්‍යායයන් වහන්සේලා, නිසි බලධාරී හා මහෝපාධ්‍යායයන් වහන්සේලා

| | නම | තනතුර | සේවයට පත් වු දිනය | සේවය අවසන් වු දිනය |
|---|---|---|---|---|
| 01 | ආචාර්ය පූජ්‍ය කාක්කපල්ලියේ අනුරුද්ධ ස්වාමීන්ද්‍රයන් වහන්සේ | බලධාරින් වහන්සේ | 1996.08.08 | 1996.12.31 |
| 02 | ආචාර්ය පූජ්‍ය හොරණ වජිරඤාණ නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ | බලධාරින් වහන්සේ | 1997.01.15 | 1997.02.23 |
| 03 | මහාචාර්ය පූජ්‍ය කුඹුරුගමුවේ වජිර ස්වාමීන්ද්‍රයන් වහන්සේ | වැඩබලන මහෝපාධ්‍යාය | 1997.02.24 | 1998.10.28 |
| 04 | ආචාර්ය පූජ්‍ය මීගොඩ පඤ්ඤාලෝක ස්වාමීන්ද්‍රයන් වහන්සේ | වැඩබලන මහෝපාධ්‍යාය | 1998.11.25 | 1999.01.20 |
| 05 | මහාචාර්ය පී. විල්සන් මහතා | නිසි බලධාරි | 1999.01.20 | 1999.09.30 |
| 06 | ආචාර්ය තුඹුල්ලේ ශ්‍රී සීලක්ඛන්ධ නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ | මහෝපාධ්‍යාය | 1999.10.01 | 2002.09.20 |
| 07 | ආචාර්ය තුඹුල්ලේ ශ්‍රී සීලක්ඛන්ධ නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ | මහෝපාධ්‍යාය | 2002.09.21 | 2005.09.20 |
| 08 | මහාචාර්ය පූජ්‍ය වැගම පියරතන ස්වාමීන්ද්‍රයන් වහන්සේ | මහෝපාධ්‍යාය | 2005.09.21 | 2008.09.20 |
| 09 | මහාචාර්ය චන්ද්‍රා වික්‍රමගමගේ මහතා | වැඩබලන මහෝපාධ්‍යාය | 2008.09.24 | 2008.10.28 |
| 10 | මහාචාර්ය පූජ්‍ය ඉත්තදෙමලියේ ඉන්දසර ස්වාමීන්ද්‍රයන් වහන්සේ | මහෝපාධ්‍යාය | 2008.10.29 | මේ දක්වා |


**1982 සිට 2008 දක්වා විශ්වවිද්‍යාලයට වෙන් වු ප්‍රතිපාදන**

| වර්ෂය | පුනරාවර්තන වියදම් මිලියන | ප්‍රාග්ධන වියදම් මිලියන |
|---|---|---|
| 1982 | 0.03 | 0.05 |
| 1983 | 0.15 | 0.02 |
| 1984 | 0.23 | 0.04 |
| 1985 | 0.32 | 0.04 |
| 1986 | 0.38 | 0.06 |
| 1987 | 0.37 | 0.02 |
| 1988 | 0.35 | 0.05 |
| 1989 | 0.39 | 0.01 |
| 1990 | 0.65 | 0.004 |
| 1991 | 0.72 | 0.31 |
| 1992 | 0.82 | 0.32 |
| 1993 | 1.04 | 0.08 |
| 1994 | 1.20 | 0.09 |
| 1995 | 1.28 | 0.20 |
| 1996 | 1.22 | 0.43 |
| 1997 | 1.37 | 2.0 |
| 1998 | 1.67 | 1.37 |
| 1999 | 1.78 | 0.51 |
| 2000 | 1.87 | 0.49 |
| 2001 | 2.30 | 0.38 |
| 2002 | 22.10 | 7.0 |
| 2003 | 27.74 | 11.39 |
| 2004 | 30.50 | 69.913 |
| 2005 | 38.00 | 180.00 |
| 2006 | 58.5 | 180.00 |
| 2007 | 66.8 | 133 |
| 2008 | 68.9 | 130 |
| 2009 | 79.34 | 127.5 |
| 2010 | 82.17 | 142.5 |

## BUDDHIST AND PALI UNIVERSITY OF SRI LANKA

### Cadre Position for Non-academic Staff as at 31.12.2010


| Post | Cadre Approved | Cadre Filled | Vacancies |
|---|---|---|---|
| Registrar | 1 | 1 | 0 |
| Bursar | 1 | 1 | 0 |
| Deputy Registrar | 1 | 1 | 0 |
| Senior Asst. Registrar | 1 | 1 | 0 |
| Assistant Registrar | 3 | 1 | 2 |
| Internal Auditor (A-04) | 1 | 1 | 0 |
| Assistant Bursar | 1 | 1 | 0 |
| Sub-Warden | 2 | 2 | 0 |
| Clerk | 16 | 12 | 4 |
| Library Assistant | 4 | 3 | 1 |
| Works Supervisor | 1 | 1 | 0 |
| Steno/Typist (Sinhala/English) | 6 | 5 | 1 |
| Computer Application Assistant | 3 | 3 | 0 |
| Typist | 3 | 3 | 0 |
| Book Keeper | 1 | 1 | 0 |
| Shroff | 1 | 1 | 0 |
| Store-Keeper | 1 | 1 | 0 |
| Telephone Operator/Receptionist | 2 | 2 | 0 |
| Library Attendant | 2 | 1 | 1 |
| Driver | 7 | 7 | 0 |
| Cycle Orderly | 1 | 1 | 0 |
| Labourer Skilled (Electrical/Plumber) | 2 | 2 | 0 |
| Cook | 2 | 0 | 2 |
| Roneo Machine Operator | 2 | 2 | 0 |
| Machine Operator-Grass | 1 | 0 | 1 |
| Labourer | 20 | 20 | 0 |
| Labourer-Garden | 2 | 1 | 1 |
| Sanitary Laborer | 4 | 2 | 2 |
| Works Engineer | 1 | 1 | 0 |
| Total | 93 | 78 | 15 |


BUDDHIST AND PALI UNIVERSITY OF SRI LANKA
Cardre Position for Non-Academic Staff as at 31.12.2010
21
20
19
18
17
16
15
14
13
12
11
10
9
8
7
6
5
4
3
2
1
0
Registrar
Bursar
Deputy Registrar
Senior Asst. Registrar
Assistant Registrar
Internal Auditor (A-04)
Assistant Bursar
Sub-Warden
Clerk
Library Assistant
Works Supervisor
Steno/Typist (Sinhala/English)
Computer Application Assistant
Typist
Book Keeper
Shroff
Store-Keeper
Telephone Operator/Receptionist
Library Attendant
Driver
Cycle Orderly
Labourer Skilled (Electrical/Plumber)
Cook
Roneo Machine Operator
Machine Operator-Grass
Labourer
Labourer-Garden
Sanitary Laborer
Works Engineer
Cardre Approved
Cardre Filled
Vacancies

## Cadre Position for Academic Staff 31.12.2010 (Teaching)


| | Cardre Approved | Cadre Filled | Vacancies |
|---|---|---|---|
| **Vice Chancellor** | 1 | 1 | 0 |
| **Proffessor** | 2 | 0 | 2 |
| **Senior Lecturer/ Senior Lecturer II/ Lecturer/*Associate Professor/*Professor** | 20 | 19 | 1 |
| **English Instructor** | 1 | 0 | 1 |
| **Computer Instructor Gr. II** | 1 | 1 | 0 |
| **Buddhist Counsellor** | 1 | 0 | 1 |

* Associate Professor, * Professor - Promotion



## Cadre Position for Academic Staff 31.12.2010 (Non-Teaching)

| | Cardre Approved | Cadre Filled | Vacancies |
|---|---|---|---|
| **Librarian** | 1 | 1 | 0 |
| **Senior Assistant Librarian** | 1 | 1 | 0 |



2001 වර්ෂයේ සිට 2010 වර්ෂය දක්වා ඒ ඒ වර්ෂවල ලියාපදිංචි වී ඇති ශිෂ්‍යයින් පිළිබඳ තොරතුරු පහත සඳහන් වේ.

| | පාඨමාලාව | 2001 | 2002 | 2003 | 2004 | 2005 | 2006 | 2007 | 2008 | 2009 | 2010 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 01 | බුද්ධ ධර්ම ඩිප්ලෝමා<br>දේශීය<br>විදේශීය ආයතන | <br>120<br>53 | <br>164<br>66 | <br>1085<br>137 | <br>575<br>114 | <br>1132<br>35 | <br>881<br>30 | <br>1077<br>40 | <br>924<br>71 | <br>614<br>82 | <br>603<br>89 |
| 02 | පාලි - දේශීය<br>විදේශීය ආයතන | 08<br>01 | 32<br>- | 75<br>නැත | 65<br>නැත | 74<br>09 | 97<br>නැත | 120<br>නැත | 77<br>-- | 78<br>- | 52<br>- |
| 03 | සංස්කෘත ඩිප්ලෝමා - දේශීය | - | - | - | - | - | - | - | - | - | 11 |
| 04 | සාමාන්‍ය ශාස්ත්‍රවේදී<br>(බාහිර උපාධිය)<br>දේශීය<br>විදේශීය ආයතන | <br><br>41<br>02 | <br><br>40<br>10 | <br><br>95<br>13 | <br><br>73<br>18 | <br><br>226<br>20 | <br><br>227<br>30 | <br><br>572<br>43 | <br><br>801<br>28 | <br><br>1060<br>09 | <br><br>627<br>10 |
| 05 | සාමාන්‍ය ශාස්ත්‍රවේදී<br>(අභ්‍යන්තර) උපාධිය<br>දේශීය<br>විදේශීය (අභ්‍යන්තර)<br>(ඉංග්‍රීසි මාධ්‍යය) | <br><br>50<br>07 | <br><br>50<br>30 | <br><br>50<br>18 | <br><br>60<br>38 | <br><br>239<br>103 | <br><br>100<br>64 | <br><br>110<br>42 | <br><br>109<br>61 | <br><br>109<br>74 | <br><br>109<br>45 |
| 06 | බෞද්ධ අධ්‍යයන පශ්චාත්<br>උපාධි ඩිප්ලෝමා<br>දේශීය<br>විදේශීය ආයතන -<br>සිංගප්පූරුව<br>විදේශීය | <br><br>11<br>නැත | <br><br>02<br>01 | <br><br>07<br>නැත | <br><br>11<br>- | <br><br>22<br>- | <br><br>20<br>නැත | <br><br>27<br>- | <br><br>22<br>- | <br><br>24<br>- | <br><br>18<br>-<br>01 |
| 07 | ඉංග්‍රීසි ඩිප්ලෝමා<br>සහතිකපත්‍ර පාඨමාලාව<br>මූලික පාඨමාලාව | <br>- | <br>- | <br>- | <br>- | <br>- | 116<br>42<br>65 | 107<br>54<br>43 | 237<br>83<br>74 | 143<br>42<br>49 | 136<br>37<br>56 |
| 08 | ශාස්ත්‍රපති<br>දේශීය<br>විදේශීය ආයතන -<br>සිංගප්පූරුව<br>විදේශීය ආයතන නොවන | <br>133<br>17<br>නැත | <br>106<br>නැත<br>15 | <br>102<br>නැත<br>21 | <br>83<br>නැත<br>14 | <br>73<br>නැත<br>56 | <br>88<br>17<br>30 | <br>82<br>08<br>97 | <br>113<br>නැත<br>28 | <br>144<br>නැත<br>22 | <br>158<br>-<br>63 |
| 09 | දර්ශනපති<br>දේශීය<br>විදේශීය ආයතන<br>විදේශය | <br>14<br>නැත | <br>-<br>- | <br>05<br>02 | <br>01<br>03 | <br>20<br>- | <br>03<br>02 | <br>-<br>- | <br>01<br>03 | <br>10<br>- | <br>10<br>01<br>02 |
| 10 | දර්ශනශූරී උපාධි - දේශීය<br>විදේශීය<br>විදේශීය ආයතන | නැත<br>නැත<br>- | **<br>**<br>- | නැත<br>නැත<br>- | නැත<br>නැත<br>- | නැත<br>නැත<br>- | 01<br>නැත<br>- | නැත<br>නැත<br>- | **<br>**<br>- | 01<br>-<br>- | 07<br>02<br>- |

## **1983** වසරේ සිට 2010.12.31 දින දක්වා ලියාපදිංචි වී තිබෙන ශිෂ්‍ය සංඛ්‍යාව

| වර්ෂය | ආචාර්ය උපාධිය | දර්ශනපති උපාධිය | ශාස්ත්‍රපති උපාධිය | ජන සනිනිවේදන පශ්චාත් උපාධි ඩිප්ලෝමා | බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ඩිප්ලෝමා | ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය | සාමාන්‍ය ශාස්ත්‍රවේදි උපාධිය (අභ්‍යන්තර) | සාමාන්‍ය ශාස්ත්‍රවේදි උපාධිය (බාහිර) | විශේෂ ශාස්ත්‍රවේදි උපාධිය | විදේශ ධර්මදූත සේවා පාඨමාලාව | ඉංග්‍රීසි ඩිප්ලෝමා (බාහිර) | ධර්ම සංනිවේදන ඩිප්ලෝමා | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1983 | - | - | - | - | - | 134 | - | - | - | - | - | - | 134 |
| 1984 | - | - | - | - | - | 10 | - | - | - | - | - | - | 10 |
| 1985 | - | - | 20 | - | - | 21 | - | - | - | - | - | - | 41 |
| 1986 | - | 02 | 14 | - | - | 26 | - | - | - | - | - | - | 42 |
| 1987 | 02 | - | 22 | - | - | 27 | - | - | - | - | - | - | 51 |
| 1988 | 03 | - | 25 | - | - | 73 | - | - | - | - | - | - | 101 |
| 1989 | - | - | 40 | 30 | - | - | - | - | - | - | - | - | 70 |
| 1990 | - | 04 | 68 | 26 | - | 88 | - | - | - | - | - | - | 186 |
| 1991 | - | - | 89 | 14 | 25 | 97 | - | - | - | - | - | - | 225 |
| 1992 | 01 | 03 | 187 | - | 10 | 312 | - | - | - | - | - | - | 513 |
| 1993 | 03 | 02 | 298 | - | 12 | 72 | - | - | - | - | - | - | 387 |
| 1994 | 02 | - | 199 | - | 10 | 312 | - | - | - | - | - | - | 491 |
| 1995 | - | 12 | 400 | - | 02 | 79 | - | - | - | - | - | - | 493 |
| 1996 | 02 | 13 | 256 | - | 03 | - | - | - | - | - | - | - | 274 |
| 1997 | 02 | 11 | 335 | - | 10 | - | - | - | - | - | - | - | 358 |
| 1998 | 02 | 12 | 229 | - | 12 | - | 57 | 76 | - | - | - | - | 388 |
| 1999 | - | - | - | - | - | - | - | 44 | 12 | - | - | - | 56 |
| 2000 | - | 04 | 140 | - | 19 | - | 50 | 61 | - | - | - | - | 274 |
| 2001 | - | 14 | 150 | - | 11 | - | 57 | 43 | - | - | - | - | 275 |
| 2002 | - | - | 121 | - | 03 | - | 80 | 50 | 20 | - | - | - | 274 |
| 2003 | - | 07 | 123 | - | 10 | - | 68 | 108 | 36 | - | - | - | 352 |
| 2004 | - | 04 | 97 | - | 11 | - | 98 | 91 | 21 | - | - | - | 322 |
| 2005 | - | 20 | 65 | - | 22 | - | 46 | - | 29 | - | 223 | - | 330 |
| 2006 | 01 | 05 | 135 | - | 20 | - | 88 | 257 | 24 | 30 | 213 | 46 | 707 |
| 2007 | - | - | - | - | 27 | - | 99 | 615 | 42 | 17 | 204 | - | 979 |
| 2008 | - | 04 | 141 | - | 22 | - | 109 | 829 | 34 | 17 | 223 | - | 1379 |
| 2009 | - | 04 | 192 | - | 24 | - | 90 | 1069 | 34 | - | 223 | - | 1642 |
| 2010 | 09 | 13 | 21 | - | 19 | - | - | 637 | - | - | 120 | - | 819 |

## 1984 වසරේ සිට 2008.12.31 දක්වා උපාධි ලබා ගත් සංඛ්‍යාව I

| වර්ෂය | 1. සාහිත්‍ය චක්‍රවර්ති සම්මාන උපාධිය | 2. ආචාර්ය උපාධිය | 3. දර්ශනපති උපාධිය | 4. ශාස්ත්‍රපති උපාධිය | 5. ජන සන්නිවේදන පශ්චාත් උපාධි ඩිප්ලෝමා | 6. බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ඩිප්ලෝමාව | 7. ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය | 8. සාමාන්‍ය ශාස්ත්‍රවේදී උපාධිය (අභ්‍යන්තර) | 9. සාමාන්‍ය ශාස්ත්‍රවේදී උපාධිය (බාහිර) | 10.විශේෂ ශාස්ත්‍රවේදී උපාධිය | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1984 | - | - | - | | - | - | 1 | - | - | - | 1 |
| 1985 | 1 | - | - | 16 | - | - | - | - | - | - | 17 |
| 1986 | - | - | - | 11 | - | - | 32 | - | - | - | 43 |
| 1987 | - | - | - | 18 | - | - | 33 | - | - | - | 51 |
| 1988 | - | - | - | 17 | - | - | 26 | - | - | - | 43 |
| 1989 | 2 | - | 1 | 30 | 24 | - | 45 | - | - | - | 102 |
| 1990 | 2 | - | - | 50 | 20 | - | 44 | - | - | - | 116 |
| 1991 | 2 | 1 | 1 | 78 | 10 | 16 | 80 | - | - | - | 188 |
| 1992 | - | 1 | - | 156 | - | 5 | 30 | - | - | - | 192 |
| 1993 | - | - | 2 | 257 | - | 6 | 56 | - | - | - | 321 |
| 1994 | - | - | - | 174 | - | - | 70 | - | - | - | 244 |
| 1995 | - | - | - | 318 | - | 7 | 61 | - | - | - | 386 |
| 1996 | - | - | 3 | 176 | - | 1 | 116 | - | - | - | 296 |
| 1997 | - | 3 | 1 | 249 | - | 5 | 127 | - | - | - | 385 |
| 1998 | - | 1 | - | 190 | - | 8 | 62 | - | - | - | 261 |
| 1999 | - | - | - | 197 | - | 2 | 48 | - | 13 | - | 260 |
| 2000 | 1 | - | - | | - | 5 | 6 | 35 | 8 | - | 55 |
| 2001 | - | 1 | 2 | 66 | - | 3 | 1 | 1 | 8 | 12 | 94 |
| 2002 | 2 | - | - | 63 | - | - | - | - | 24 | - | 89 |
| 2003 | - | - | 7 | 123 | - | 7 | - | 31 | - | - | 168 |
| 2004 | - | - | 2 | 63 | - | 7 | - | 27 | 23 | 19 | 141 |
| 2005 | 2 | - | 2 | 55 | - | 14 | - | 25 | 23 | 31 | 152 |
| 2006 | - | - | - | - | - | - | - | - | - | 18 | 18 |
| 2007 | - | 2 | 1 | 77 | - | 10 | - | 74 | 54 | 37 | 255 |
| 2008 | - | - | 1 | | - | - | - | - | - | - | - |
| එකතුව | 12 | 09 | 22 | 2384 | 54 | 96 | 838 | 229 | 153 | 118 | 3915 |

***සටහන් :-*** විශ්වවිද්‍යාලය ප්‍රතිව්‍යුහගත කිරීමෙන් පසුව අංක 5 සහ 7 හි සඳහන් උපාධි පාඨමාලා පවත්වනු නොලැබේ. 1984 වසරේ සිට 2008.12.31 දින දක්වා මෙම විශ්වවිද්‍යාලයෙන් බිහිකරන ලද මුළු උපාධිධාරීන්ගේ සංඛ්‍යාව 3915කි.

II 2006 වර්ෂයේ සිට 2010 වර්ෂය දක්වා ඒ ඒ වර්ෂවල ඩිප්ලෝමා/උපාධි ලබා ගත් ශිෂ්‍යයින් පිළිබඳ තොරතුරු පහත සඳහන් වේ.

| | **පාඨමාලාව** | **2006** | **2007** | **2008** | **2009** | **2010** |
|---|---|---|---|---|---|---|
| 01 | ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධිය (අභ්‍යන්තර) | | | | | |
| | දේශීය | 21 | 26 | 29 | - | - |
| | විදේශීය | 01 | 01 | 04 | - | - |
| 02 | ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධිය (අභ්‍යන්තර) | | | | | |
| | දේශීය | 32 | 51 | 54 | - | |
| | විදේශීය | 11 | 23 | 15 | - | |
| 03 | ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධිය (බාහිර) | | | | | |
| | දේශීය | 32 | 51 | 68 | 113 | - |
| | දේශීය ආයතන නොවන | 01 | 07 | 05 | 01 | - |
| | විදේශීය (සිංගප්පූරු ආයතනය) | 06 | 08 | 19 | 06 | - |
| 04 | ශාස්ත්‍රපති උපාධිය | | | | | |
| | දේශීය | 56 | 54 | 57 | - | - |
| | දේශීය ආයතන නොවන | 25 | 14 | 16 | 91 | - |
| | විදේශීය (සිංගප්පූරු ආයතනය) | 12 | 10 | - | 31 | - |
| 05 | බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ඩිප්ලෝමා | | | | | |
| | දේශීය | 07 | 10 | 06 | 09 | - |
| | විදේශීය | - | - | - | - | - |
| 06 | විදේශ ධර්මදූත සේවා පශ්චාත් උපාධි ඩිප්ලෝමා | | | | | |
| | දේශීය | 09 | - | 02 | - | - |
| | විදේශීය | - | - | - | - | - |
| 07 | දර්ශනපති උපාධිය | | | | | |
| | දේශීය | - | 01 | - | - | 02 |
| | විදේශීය | - | - | - | - | - |
| | විදේශීය ආයතන නොවන | | | | | 01 |
| 08 | ආචාර්ය උපාධිය | | | | | |
| | දේශීය | - | 03 | - | - | 01 |
| | විදේශීය (සිංගප්පූරුව) | - | - | 01 | - | - |
| 09 | පාලි ඩිප්ලෝමා පරීක්ෂණය | | | | | |
| | දේශීය | 33 | 41 | 25 | 28 | 21 |
| | විදේශීය ආයතන නොවන | 03 | 02 | - | - | - |
| | විදේශීය (සිංගප්පූරු ආයතනය) | - | - | 01 | 02 | - |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 10 | බුද්ධ ධර්ම ඩිප්ලෝමා පරීක්ෂණය<br>දේශීය<br>විදේශීය ආයතන නොවන<br>විදේශීය (සිංගප්පූරු ආයතනය)<br>විදේශීය (මැලේසියා ආයතනය)<br>විදේශීය (ජර්මන් ආයතනය) | <br>-<br>-<br>-<br>-<br>- | <br>320<br>03<br>10<br>-<br>- | <br>389<br>05<br>14<br>07<br>11 | <br>282<br>01<br>25<br>10<br>- | <br>250<br>-<br>17<br>08<br>- |
| 11 | සංස්කෘත ඩිප්ලෝමා පරීක්ෂණය<br>දේශීය | <br>- | <br>- | <br>- | <br>- | <br>03 |
| 12 | ඉංග්‍රීසි ඩිප්ලෝමා පරීක්ෂණය<br>දේශීය සිසුන් පමණි | <br>45 | <br>79 | <br>101 | <br>59 | <br>120 |

**විදේශීය අනුබද්ධ ආයතන**

බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය යටතේ ලියාපදිංචිව පවත්වාගෙන යනු ලබන විදේශීය විශ්වවිද්‍යාල ආයතන පහත සඳහන් රටවල පිහිටුවා ඇත.

සිංගප්පූරුව
කොරියාව
ඔස්ට්‍රියාව
එංගලන්තය
ජර්මනිය
ඇමෙරිකාව

## ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය
## රැස්වීම් පිළිබඳ දින දර්ශනය - 2010 වර්ෂය

| මාසය | උසස් උපාධි කමිටුව | පීය මණ්ඩල රැස්වීම් | | මුදල් කමිටුව | සුළු ප්‍රසම්පාදන කමිටුව | | ආයතනික ප්‍රසම්පාදන කමිටුව | විගණන හා කළමණාකරණ කමිටුව | ගොඩනැගිලි ඉදිකිරීමේ ප්‍රගති සමාලෝචන / නඩත්තු කමිටුව | අධ්‍යයන නිවාඩු කමිටුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | බෞද්ධ අධ්‍යයන පීඨය | භාෂා අධ්‍යයන පීඨය | | පළමු වර | දෙවන වර | | | | |
| | පෙ.ව. 10.30 | පෙ.ව. 9.00 | ප.ව. 1.00 | ප.ව. 2.00 | පෙ.ව. 9.00 | | ප.ව. 2.45 | ප.ව. 2.30 | ප.ව. 2.30 | පෙ.ව. 9.00 |
| ජනවාරි | 20 | 20 | 20 | 08 | 04 | 18 | 12 | 21 | 13 | 05 |
| පෙබරවාරි | 17 | 24 | 24 | 12 | 01 | 15 | 10 | 18 | 12 | 08 |
| මාර්තු | 17 | 24 | 24 | 12 | 01 | 15 | 05 | 18 | 12 | 02 |
| අප්‍රේල් | 21 | 21 | 21 | 09 | 05 | 19 | 07 | 08 | 08 | 06 |
| මැයි | 19 | 19 | 19 | 07 | 03 | 17 | 06 | 20 | 10 | 05 |
| ජුනි | 16 | 23 | 23 | 11 | 07 | 21 | 09 | 17 | 15 | 10 |
| ජූලි | 21 | 28 | 28 | 09 | 05 | 19 | 06 | 15 | 15 | 05 |
| අගෝස්තු | 18 | 25 | 25 | 06 | 02 | 16 | 04 | 19 | 13 | 05 |
| සැප්තැම්බර් | 22 | 21 | 21 | 10 | 06 | 20 | 03 | 16 | 15 | 08 |
| ඔක්තෝබර් | 20 | 20 | 20 | 08 | 04 | 18 | 07 | 21 | 15 | 07 |
| නොවැම්බර් | 10 | 24 | 24 | 12 | 08 | 22 | 05 | 18 | 12 | 17 |
| දෙසැම්බර් | 22 | 22 | 22 | 10 | 06 | 20 | 03 | 16 | 15 | 07 |

| මාසය | වෘත්තීය සංවර්ධන වැඩමුළුව | අධ්‍යයන/ අනධ්‍යයන නිවාස කමිටුව | සුභසාධක කමිටුව | සනාතන සභාව | පාලක සභාව | පරිපාලන නිලධාරී රැස්වීම් | කාර්ය මණ්ඩල රැස්වීම් | **Turn Key** ක්‍රමය යටතේ ගොඩනැගිලි ඉදිකිරීම පිළිබඳ සමාලෝචන කමිටුව | පුස්තකාල කමිටුව |
|---|---|---|---|---|---|---|---|---|---|
| | පෙ.ව. 9.00 | පෙ.ව. 10.00 | ප.ව. 1.00 | ප.ව. 2.00 | ප.ව. 2.00 | ප.ව. 1.00 | ප.ව. 1.00 | ප.ව. 2.30 | පෙ.ව.10.30 |
| ජනවාරි | 13 | 22 | 06 | 12 | 26 | 23 | 04 | 07 | 20 |
| පෙබරවාරි | 10 | 23 | 03 | 09 | 23 | 25 | - | 08 | - |
| මාර්තු | 10 | 22 | 03 | 09 | 30 | 26 | 15 | 03 | 17 |
| අප්‍රේල් | 07 | 22 | 07 | 06 | 27 | 23 | - | 05 | - |
| මැයි | 12 | 20 | 05 | 11 | 25 | 18 | 11 | 14 | 19 |
| ජුනි | 09 | 22 | 02 | 08 | 29 | 24 | - | 08 | - |
| ජූලි | 14 | 20 | 07 | 13 | 27 | 16 | 08 | 09 | 21 |
| අගෝස්තු | 11 | 19 | 04 | 10 | 31 | 20 | - | 06 | - |
| සැප්තැම්බර් | 08 | 21 | 01 | 14 | 28 | 21 | 25 | 08 | 15 |
| ඔක්තෝබර් | 13 | 20 | 06 | 12 | 26 | 21 | - | 08 | - |
| නොවැම්බර් | 10 | 18 | 03 | 09 | 30 | 16 | 15 | 09 | - |
| දෙසැම්බර් | 08 | 20 | 01 | 07 | 28 | 28 | - | 09 | - |

## ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ සංවිධාන සටහන - 1995 අංක 37 දරණ (සංශෝධන) පනතට අනු

